සසුන් කෙත සසිරි කළ

# වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණෝ



මහරගම සිරි වජිරඤාණ දහම් පාසලේ ප්‍රකාශනයකි

# සසුන් කෙත සසිරි කළ
# වැලිවිට අසරණ සරණ
# සරණංකර සඟරජ මාහිමිපාණෝ

(2553/2010 ජාතික නිදහස් දිනය නිමිත්තෙනි)

ප්‍රධාන අනුශාසක :
අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ
මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුල නායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ

සම්පාදකවරු :
පූජ්‍ය ශාස්ත්‍රවේදී වැයිහේනේ පඤ්ඤාලෝක හිමි
සිරිල් හේවාවසම් මහතා

ප්‍රකාශනය :
සිරි වජිරඤාණ දහම් පාසල
සිරි වජිරඤාණ මාවත,
මහරගම
2553/2010

සියලුම හිමිකම් ඇවිරිණි
සාසන සේවක සමිතිය

ප්‍රථම මුද්‍රණය - 2531/1988
දෙවන මුද්‍රණය - 2553/2010

**අනුශාසනය :**
අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
පූජ්‍යපාද මහරගම ධම්මසිරි නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍යපාද තිරිකුණාමලේ ආනන්ද අනුනායක ස්වාමීන් වහන්සේ

**අනුග්‍රහය :**
අනුර කුමාර කාරියවසම් (පියා)
තවීෂ පන්සර කාරියවසම් (පුතා)
සුභාවි මිණුපමා කාරියවසම් (දුව)

**විශේෂ සහාය**
සිරි වජිරඤාණ දහම් පාසලේ ආදි ශිෂ්‍ය-ශිෂ්‍යා සංගමය
විශේෂ සේවා ඒකකය

**පරිගණක අකුරු සැකසුම**
රොහාන් ග්‍රැෆික්ස්
නො. 333,
බොරුපන පාර,
රත්මලාන.

**මුද්‍රණය**
රුවන් පහරුව
නො. 14/10, පළමු පටුමග,
පිළිකා රෝහල පාර,
මහරගම.
දුර. 2840738

## "දුල්ලභෝ පුරිසාජඤ්ඤො"
# අතිශ්‍රේෂ්ඨ පුද්ගලයෝ දුර්ලභය හ

බුද්ධ ධර්මය අනුව පමණක් නොව උගත් ලෝකයාගේ පිළිගැනීම අනුව ද ලොවැ පහළ වූ අතිශ්‍රේෂ්ඨ පුද්ගලයා බුදුරජාණන් වහන්සේ ය. බුදුන් නමින් කෙනෙකුන් පහළ වන්නේ අසංඛ්‍ය සතරකුත් කල්ප ලක්‍ෂයක් දසපාරමී ආදි බුද්ධකාරක ධර්‍මයන් පිරීමෙන් පසුව ය. එහෙයින් මේ භද්‍රකාලයට ම හෙවත් අනාදිමත් කාලයට ම බුදුන් නමින් පහළ වූයේ සතර නමෙකි. සාරිපුත්ත - මොග්ගල්ලාන වැනි ඊට මෙහා මට්ටමේ රහතන් වහන්සේලා නම් අතිවිශාල සංඛ්‍යාවක් පහළ වී සිටියහ. ශ්‍රී ලංකාව ද රහතන් වහන්සේලා ගෙන් පිරී ඉතිරී ගිය රටෙකි.

ලාභ - අලාභ, යස - අයස, සුඛ - දුක්ඛ, නින්දා - ප්‍රශංසා යන ලෝකධර්ම අට පුදුම බලවේගයෙකි. මේ බලවේග අටට යටත් නොවන රටක්වත් පුද්ගලයෙක්වත් නැත. බුදුරජාණන් වහන්සේට වත් මේ ලෝක ධර්මයනට යටත් නොවී ඉන්නට පිළිවන් වූයේ නැත. එහෙත් බුද්ධත්වයේ ඇති ශ්‍රේෂ්ඨකමක් නම් අෂ්ටලෝක ධර්මයනට බින්දු මාත්‍රයක් වත් කම්පා නොවීමයි. එසේ වුවත් බුදුරජාණන් වහන්සේ ම ශ්‍රාවකයන් පිරිවරා ගෙන අවුරුද්දකට නව මාසයක් නැත්නම් අට මාසයක් අඩුම ගණනේ හත් මාසයක් ගමින් ගමට ගොස් ප්‍රචාරය කළ බුද්ධ ධර්මය නම් නොබෝ කලෙකින් භාරතයෙන් අතුරුදන් වූයේ මාරපාක්ෂිකයන් වැඩි වූ හෙයිනි.

### ශාසන ඉතිහාසය

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්නට පෙර මාගේ ශාසනය බොහෝ කල් රැකෙන්නේ කොහිද, රකින්නෝ

කවුරහුදැයි දිවැසින් බලා වදාළ බවත් එහිදී උන් වහන්සේට පෙනුණේ සිංහලද්වීපය හා සිංහල බෞද්ධයන් බවත් ශාසන ඉතිහාසය කියයි. ඒ අවස්ථාවෙහි උන් වහන්සේ සිංහලද්වීපයත් සිංහල බෞද්ධයනුත් ආරක්ෂා කරන්නැයි ශක්‍ර දේවේන්ද්‍රයාට ප්‍රකාශ කළ බවත් ශාසන ඉතිහාසය ම කියයි.

ශාසන ඉතිහාසය අනුව බුදුරජාණන් වහන්සේ තුන් වරක් සිංහල රටට වැඩම කොට ඇත. පළමුවර මහියංගණයට ය. එයින් රුහුණු රට පුරා බෞද්ධාලෝකය පැතිරිණ. දෙවන වර නාගදීපයට ය. එයින් පිහිටි රට පුරා බෞද්ධාලෝකය පැතිරිණ. තෙවන වර කැලණියට ය. එයින් මායා රට පුරා බෞද්ධාලෝකය පැතිරිණ. තෙවන වරට රහතන් වහන්සේලාත් සමඟ වැඩම කළ බුදුරජාණන් වහන්සේ සිරිලක පුරා පිහිටි සොළොස් මහා ස්ථානයෙකැ සමාපත්තියට සමවැදැ ලක් පොළොව පූජනීය භූමියක් කළහ.

බුද්ධ පරිනිර්වාණයෙන් 236 දී මිහිඳු මහරහතන් වහන්සේ සිංහලද්වීපයට වැඩම කොට ධර්මදේශනා කිරීමෙන් දේවානම් පියතිස්ස රජතුමා ප්‍රධාන ජනතාව බෞද්ධ වූහ. බුදුරජාණන් වහන්සේගේ පැමිණීමෙන් ත්‍රිසිංහලය පුරා පැතිරී තිබුණු බෞද්ධාලෝකය නිසා නොබෝ කලෙකින් සිංහල ජනතාව බෞද්ධයෝ වූහ.

## ස්වර්ණ යුගය

බෞද්ධාලෝකය ලැබූ සිංහල ද්වීපයෙහි ස්වර්ණයුගය අනුරාධපුර කාලය යි. අනුරාධපුර පොළොවෙහි රහතන් වහන්සේ කෙනෙකුට නොපෑගුණු වැලිකැටයක් වත් නැතැයි කිව යුතු තරමට රහතන් ගෙන් පිරී තිබුණා. බාහිර දියුණුවෙන්

ද එසේ පිරී තිබුණා. එහෙයින් ධර්මද්වීපය, පෙරදිග ධාන්‍යාගාරය යන ගෞරව නාම ද ලැබුණා.

එසේ අභ්‍යන්තර දියුණුවෙනුත් බාහිර දියුණුවෙනුත් සාමයෙනුත් බැබැළුණු සිංහල බෞද්ධයනට දක්ෂිණ භාරතයෙන් ලැබුණු තර්ජන ගර්ජන නිසා අනුරාධපුරය අත්හැර පොළොන්නරුව රාජධානිය කර ගන්නට සිදුවිය. පොළොන්නරු යුගය ද සිංහල බෞද්ධයන්ගේ වාසනාවන්ත කාල පරිච්ඡේදයෙකි. අපේ පාලකයන්ගේ උදාර චින්තන හා ක්‍රියා ක්‍රමයෙන් හීන වන්නට වී ය. බලතෘෂ්ණාව ක්‍රමයෙන් දියුණු වී ය. එහෙයින් රටෙහි දියුණුවට යෙදූ කාලයත් ධනයත් ඥාණයත්, ශ්‍රමයත් බලය අල්ලා ගන්නට යෙදවිණි.

## බලකාමය නිසා වූ පරිහානිය

මේ පරිහානිය නිසා ජනතාව තුළ ශ්‍රද්ධා ශීලාදී ගුණ පිරිහෙන්නට විය. ඔවුන්ගෙන් ජනිත වන දරුවෝ ද පිරිහුණාහු වූහ. එබඳු දරුවන් සසුන්ගත වීමෙන් ශාසනය ද පිරිහෙන්නට විය. එහෙයින් රහතන් වහන්සේ ගෙන් පිරී ඉතිරී ගිය ලංකා ශාසනය උපසපන් භික්ෂුවක් නැතැයි කිව යුතු තරමට පිරිහිණ. කිහිප වරක් අන් රටවලින් භික්ෂූන් වහන්සේලා පමුණුවා උපසම්පදා භික්ෂු ශාසනය පිහිටුවා ඇත.

පසුව බටහිරිකයන්ගේ ආක්‍රමණ නිසා සිංහල කමත් බෞද්ධ කමත් හොඳට ම දුර්වල වීය. භික්ෂූන් වහන්සේ වෙනුවට ගණින්නාන්සේ නමින් ගිහිත් නොවන භික්ෂූත් නොවන කණ්ඩායමක් ඇති වීය. බුද්ධ කාලයෙහි භාරතය හැරුණු විට රහතන් වහන්සේ ගෙන් පිරී ඉතිරී තුබුණු සිරි ලක්දිව උපසපන් භික්ෂුවක් නැතැයි කිව යුතු තරමට පිරිහිණ.

ත්‍රිපිටකය කටපාඩමින් රැකගෙන, හෙළ අටුවා සම්පාදනය කොට, ත්‍රිපිටක බුද්ධවචනය ප්‍රකාශිත බස පාළි නමින් අළුත් භාෂාවක් ඇති කොට එයට වුවමනා ව්‍යාකරණ නිඝණ්ඩු ඡන්දස් අලංකාර සන්න ගැටපද ආදිය සම්පාදනය කොට පාළි නමින් අළුත් භාෂාවක් ලෝකයට දුන් හෙළදිව, පාලි වාක්‍යයක් තේරුම් කැර දීමට තරම්වත් උගතෙක් නැතැයි කිවයුතු තරමට දුර්වල වී ය.

## සක්දෙව් බැල්ම

බුදුරජාණන් වහන්සේගේ අවවාදානුශාසනා පරිදි ලංකාශාසනය ආරක්‍ෂා කරන්නට බාරගත් ශක්‍රදේවේන්ද්‍රයා ශාසනයට උපද්‍රව පැමිණි අවස්ථාවලදී නිහඬ වැ ම සිටියේ නැති බවට සාධක ඇත. මනුෂ්‍ය ලෝකයෙහි අවුරුදු සියයක් ශක්‍ර දේවේන්ද්‍රයා වාසය කරන තාවතිංස දෙව්ලොව එක් දිනයක් ලු, වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේගේ උපතට ද ශක්‍ර දේවේන්ද්‍රයා සම්බන්ධ වන්නට ඇතැයි සිතන්නට ඉඩ ඇත.

''ආරෙට වඩා පුරුද්ද ලොකු ය'' යනු අපේ පැරණි කතාවෙකි. බෝධිසත්ත්වවරුන් තිරිසනුන් අතර උපනත් අනෙක් තිරිසනුනට වඩා වෙනස් වන්නේ සසර පුරුද්ද නිසා ය. දුර්භාග්‍ය කාලයෙක උපන් සරණංකර මාහිමියන්ගෙනුත් එය පැහැදිලි වෙයි.

## හැදෙන ගහ

මහනුවර දිසාවේ තුන්පනේ ගම ප්‍රසිද්ධ වැ තුබුණේ මෝඩයන්ගේ ගමක් හැටියට ය. ඒ කතාව බොරු කළෝ වැලිවිට සරණංකර මාහිමිපාණෝය. වැලිවිට වාසනාවන්ත පවුලෙකැ මේ පින්වත් දරුවා උපන්නේ ක්‍රි. ව. 1698 ජුනි 19 වැනිදා බව

පැවසේ. එකලැ රජතුමාගේ පුත්‍රස්ථානයෙහි හැදුණු වැඩුණු මේ කුමරු සොළොස් වියෙහි දී පැවිදි වී ය. පින පුදුම බලයෙකි.

දෙවන පෑතිස් රජතුමාගේ කාලයෙහි පටන් රහතන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පවිත්‍ර වැ තුබුණු සූරියගොඩ විහාරයෙහි සූරියගොඩ සාමණේරයන්ගේ ශිෂ්‍යයෙකු හැටියට පැවිද්ද ලැබූ කුල කුමරුට ''සරණංකර'' යන නම ලැබිණ. එකල ද තුබුණු ව්‍යවහාරය අනුව වැලිවිට සරණංකර නමින් හැඳින්විණ.

''හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ'' යි කීවා සේ වැලිවිට සරණංකර හෙරණ පැවිද්දා කුඩා කල පටන් අධ්‍යයනට වඩා විශේෂයක් පෙන්වමින් හැදුණා, වැඩුණා. එදා බොහෝ පැවිද්දන් ගත කළ ජීවිතයට කළකිරුණු සරණංකර හෙරණපාණෝ පිණ්ඩපාත ජීවිතයට බැස ගත්හ. එයට ද විරුද්ධ වූවෝ සිටියහ. එහෙත් සරණංකර හෙරණපාණෝ ධෛර්යයෙන් කටයුතු කොට පිණ්ඩපාතික පිරිසක් ඇති කැර ගත්හ.

## ලෙව්කේ රාළහාමි

බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කළ මාගධී ප්‍රාකෘතය පසුබිම් කැර ගෙන පාළි නමින් අළුත් භාෂාවක් සම්පාදනය කළ ශ්‍රී ලංකාවේ ඒ පාළි බස දන්නා කෙනෙකු සොයා ගන්නට බැරි තරම් කාලයෙකයි, සරණංකර හෙරණපාණන් ජීවත් වුණේ. පාලි භාෂාව ඉගෙන ගන්නට මං සොයන හෙරණපාණනට **ලෙව්කේ රාළහාමි** ගැන දැන ගන්නට ලැබුණා. අපේ සිංහල බෞද්ධයන් එකලැ වාසය කෙළේ විදේශික පාලකයන්ගේ බලවත් තාඩන පීඩන මැද ය. අවාසනාවකට හෝ වාසනාවකට එකලැ ලෙව්කේ රාළහාමි සිටියේ සිරගත ව ය.

උත්සාහවත් ජනතාවට නොකළ හැකි වැඩක් නැතැයි බුදුබණ අනුව අපේ රජවරුන් කළ ප්‍රකාශය ඉතා අගනේ ය. සරණංකර හෙරණපාණන් ධර්මයත් පාලි භාෂාවත් ඉගෙනීම වර්ණනා විෂයාන්තික ක්‍රියාවෙකි. ලෙව්කේ රාළහාමිත් පළමු ඉගෙන ගත්තේ මහාසතිපට්ඨාන සූත්‍රය යි. සරණංකර හෙරණපාණනට ඇති වූයේ බලවත් ප්‍රීතියෙකි.

## සසර පුරුද්ද

සසර පුරුද්ද නිසා අපේ බෝසතාණන් වහන්සේට ඉපදී ටික දිනෙකින් භාවනා කරන්නට පිළිවන් වූ බව ධර්ම ග්‍රන්ථයන්හි සඳහන් වේ. එවන් පුරුද්දක් නිසා දෝ සරණංකර හෙරණපාණෝ සතිපට්ඨාන භාවනා ආරම්භ කළහ. තමන්ගේ සගයන්ටත් භාවනා ඉගැන්වූහ. අනතුරු ව ඉගෙන ගත්තේ පාලි භාෂාවයි. ලෙව්කේ රාළහාමිත් උඩරට තැනින් තැන සිටි උගත් හෙරණපාණනුත් දන සිටියේ බාලාවතාරයේ මුල් කොටස පමණ ය.

රුහුණේ, විශේෂයෙන් දකුණු පළාතේ උගතුන් හෙළ බස පිළිබඳ ව වෙසරද දැනීමෙකින් යුතු ව සිටියා. පෙළබස සෑහෙන තරම් දන සිටියා. ඔවුන් අතර සිල්වතුනුත් සිටියා. සිටිනාමලුවේ සිල්වතා ඉන් කෙනෙකි. හෙතෙමේ හෙළබස මෙන් ම පෙළබස ද දන සිටි අතර බාලාවතාරයෙහි අග කොටස ප්‍රගුණ ව සිටියෙකි.

## සිල්වත් සමාගම

පසුව සිටිනාමලුවේ ධම්මජෝති සිල්වතා ද මහනුවරට ගොස් සරණංකර හෙරණපාණන් හා එකතු වීය. සරණංකර හෙරණපාණන් මහත් වැර වෑයමෙකින් ඇති කැරගත් පිණ්ඩපාතික සමාගම සිල්වත් සමාගම නමින් ද හඳුන්වනු

ලැබිණ. ආචාර්ය කොටගම වාචිස්සර තෙරුන් වහන්සේ ලියා ඇති පරිදි සරණංකර සිල්වතාට අග සවුවන් දෙදෙනෙකු සිටියා. 1. සිටිනාමලුවේ සිල්වතා 2. ඉලිපැන්ගමුවේ සිල්වතා ය. අනුගාමිකයෝ ක්‍රමයෙන් වැඩි වූහ. ඒ සමඟ සිල්වත් සමාගම කෙරෙහි විරෝධය ද ක්‍රමයෙන් අධික විය.

මහනුවර සිටි උගතුන් බාලාවතාරයෙහි මුල් කොටස දැන සිටි අතර දකුණෙන් ගිය සිටිනාමලුවේ සිල්වතා බාලාවතාරයෙහි අග කොටස දැන සිටි බවත් දෙපිරිසගේ දැනුම හුවමාරු කැර ගැනීමෙන් දෙපිරිස ම සම්පූර්ණ බාලාවතාරය ඉගෙන ගත් බවත් අසා ඇත. කෙසේ හෝ එකලැ වාසය කළ සිල්වතුන් හා හෙරණුන් ද ධර්මයත් පාලිභාෂාවත් ඉගෙන ගත්තේ කොපමණ දුෂ්කරතා මැදදැයි වටහා ගැනීම අපහසු නොවේ.

## රාජ්‍ය ප්‍රසාදය

වැලිවිට හෙරණපාණන් වහන්සේ රාජ්‍යපාලකයන්ගේ ප්‍රසාදයට ලක්වීම ශාසන දියුණුවට මහෝපකාරී කරුණක් වීය. වැලිවිට සිල්වත් සමාගම ක්‍රමයෙන් දියුණු වී සරණංකර හෙරණ පාණන්ගේ අනුගාමිකයෝ විශාල සංඛ්‍යාවක් වූහ. සිල්වත්කමින් මෙන් ම උගත්කමින් බැබැළෙන්නට වූහ. උන් වහන්සේගේ උගත්කම ගැන පැහැදී සිටි වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ධර්මශාස්ත්‍රීය පොත් ලිවීමට ආරාධනා කළා.

සිංහල බෞද්ධ පුරාණ ලේඛකයන් පොත් ලිවීමේදී මාතෘකා වශයෙන් ගත්තේ ධර්මපදයක්, බුදුගුණයක් හෝ ජාතක කථාවක් ය. නව අරහාදී බුදුගුණයන් ගෙන් අරහං ගුණය මුල් කැර ගෙන පූජාවලිය ද අනුත්තර පුරිසදම්මසාරථී ගුණය මුල් කැරගෙන අමාවතුර ද ලියා ඇත. සරණංකර හෙරණපාණෝ බුද්ධ ගුණය මුල් කැර ගෙන සාරාර්ථ සංග්‍රහය ලියූහ. පසුව ද

පොත් සම්පාදනය කෙරෙමින් බලාපොරොත්තු වූයේ රජතුමා සතුටු කැර ගෙන උපසම්පදාව සඳහා සියම්රටින් භික්ෂූන් පමුණුවා ගැනීමයි. එහෙත් බලාපොරොත්තු සාර්ථක නොවී ය.

## අනුගාමික පිරිස

කතෝලික පූජකවරුන් බලවත් වැ සිටි හෙයිනුත් **වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ** රජතුමාගේ අශ්‍රද්ධාවන්ත ගතිපැවැතුම් නිසාත් සරණංකර හෙරණපාණන්ගේ බලාපොරොත්තු සම්පූර්ණ නොවූවත් උන් වහන්සේගේ අනුගාමික පිරිස ගණනින් සත්සියයක් පමණ වීය.

මෙසේ කලක් ගිය පසු **කීර්ති ශ්‍රී රාජසිංහ** රජකමට පත්වීම සරණංකර හෙරණපාණනට මෙන් ම ලංකාශාසනයට ද මහත් ආලෝකයක් වීය. අන්‍යාගමික වූ ද ශාසන විරෝධි වූ ද පුද්ගලයන් ගෙන් සිදුවූ හානිය මනාව අවබෝධ කැර ගත් රජතුමා සම්බුද්ධ ශාසනයේ දියුණුව සඳහා ක්‍රියාකාරී වීය.

## ප්‍රථම උපසම්පදාව

සියම් රටින් භික්ෂූන් වහන්සේලා ගෙන්වා ගැනීමේ උත්සාහය මුල් වාර දෙකේ දී ම සාර්ථක නො වී ය. තෙවන වරට ගිය දූත පිරිස උපාලි තෙරුන් ප්‍රධාන මහතෙරුන් වහන්සේලා 18 නමක් ද හෙරණ පැවිද්දන් 7 නමක් ද වැඩම කරවා ගත්හ. 1753 ඇසළ පුනු පොහෝ දා මහනුවර මල්වත්තේ සීමා මාලකයෙහි දී ප්‍රථම විනය කර්මය පැවැත්විණ. පළමු ව සියමෙන් පැමිණ හෙරණන් උපසපන් කොට දෙවනුව සරණංකර හෙරණපාණන් ඇතුළු පිරිස උපසපන් කොට ඇත.

ලංකා ශාසනය නැවත පණ ගැන්විණ. කන්ද උඩරට වාසය කළ හෙරණ පැවිද්දෝ උපසපන් වූහ. වැලිවිට සිල්වත් සමාගම සඟ පරපුරක් විණ. බුද්ධ ශාසනය යළිත් ලක්දිව බැබළෙන්නට වී ය.

## සංඝරාජ පදවිය.

**දිඹුලාගල මහාකස්සප** මාහිමියන් වහන්සේගේ කාලයෙහි පටන් සංඝරාජ පදවියක් ආරම්භ කැරිණ. බෞද්ධ රජවරුන් සුදුසු මහතෙරුන් වහන්සේ නමකට මේ පදවිය පිරිනැමීම දිගට කැර ගෙන ආවා. ඒ සඟරද පදවිය දිගට ම පවත්වා ගෙන අවුත් **වීදාගම මෛත්‍රෙය** සංඝරාජයන් වහන්සේ ගෙන් අවසන් වී ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් නැවැතත් ඒ පදවිය ඇති කොට එයට වැලිවිට සරණංකර මාහිමියන් වහන්සේ පත්කරන ලදහ.

## "උඩඟු නොව මහණා"

සංඝරාජ පදවිය තමාට ලැබෙන බව ඇමැතිවරයෙකු මඟින් දැනගත් සරණංකර මාහිමියන් **"උඩඟු නොව මහණා"** යි තෙවරක් උළුවස්සේ ලියා තැබූ බව ඉතිහාසය කියයි. රජතුමා විසින් සංඝරාජ පදවිය පත් කොට ඒ බව ප්‍රකාශ කිරීමට වටාපත පිළිගැන්වීම සිරිත විය.

අස්ගිරි-මල්වතු මහා විහාර දෙක එදාත් වෙන ම වෙන ම පවත්වා ගෙන එන ලදී. එහෙයින් සංඝරාජ මාහිමියන් වහන්සේගේ අනුශාසනා පරිදි රජතුමා විසින් **තිබ්බටුවාවේ ශ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත** මාහිමියන් වහන්සේ මල්වතු පාර්ශවයේ මහානායක පදවියට ද **උරුල්ලෑවත්තේ ධම්මසිරි** මාහිමියන් වහන්සේ අස්ගිරි පාර්ශවයේ මහානායක පදවියට ද පත් කරන ලදහ.

## යළිත් සසුන් දියුණුව

ලංකා ශාසනය උපසපත් භික්ෂුවක් නැතැයි කිව යුතු තරමට පිරිහී තුබුණු කාලයෙහි සරණංකර මාහිමියන් වහන්සේගේ සිල්වත්කමත්, ගුණවත්කමත් දූරදර්ශීකමත් නිසා

ඇති කැරගත් ශාසන දියුණුව වචනයෙන් කියන්නට බැරි තරම් ශ්‍රේෂ්ඨ ක්‍රියාවෙකි. ශ්‍රද්ධාවන්ත දූරදර්ශී සංඝරාජ මාහිමියන් වහන්සේ පණ ගන්වා ගත් ලංකාශාසනය බබුළුවන්නට ඉන්නා ප්‍රධාන පිරිස වන භික්ෂූන් ශීලයෙන් ගුණයෙන් නුවණින් දියුණු කරන්නටත් ශාසනික කටයුතු මැනවින් පවත්වා ගෙන යන්නටත් කතිකාවතක් ද සම්පාදනය කරන ලදී.

සර්වතෝභද්‍ර හෙවත් කිසි ම වරදක් නැතිව හැම අංශයෙකින් ම සුභද්‍ර එක ම උත්තමයා බුදුරජාණන් වහන්සේ ය. පෘථග්ජන දෝෂ නිසා සංඝරාජයන් වහන්සේටත් යම් යම් දෝෂාරෝපණ හා කරදර ඇති වූවත් මහා පුණ්‍යවන්තයෙකි. මහෝත්තමයෙකි. උපතින් සොළොස් වියෙහිදී පැවිදි වැ පනස්පස් වියෙහිදී උපසපන් වැ අසූ වියෙහිදී අපවත් වූ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේට නිවන් සුව අත්වේවා යි ඉත සිතින් පතමි.

මෙ වර ද වීරචරිත කථාව සම්පාදනය කළ සත්පුරුෂයනටත් ප්‍රකාශයට පත් කිරීමට උපකාර කළ ත්‍යාගශීලීනටත් තෙරුවන් සරණින් සෙත් පතමි.

මිනිහා නොහදා රට හදන්න බැහැ. මිනිහා හැදුවොත් රටත් ආර්ථික - අධ්‍යාපනික - සෞඛ්‍ය - සදාචාර යන සතරාකාරයෙන් ම දියුණු වෙනවා යන බොදු පිළිවෙතට බැස නුවණින් හා උත්සාහයෙන් ක්‍රියා කොට ශ්‍රී ලංකාව නැවතත් ධර්මද්වීපයක් හා පෙරදිග ධාන්‍යාගාරයක් කර ගනිමු.

**මඩිහේ පඤ්ඤාසීහ**
මහානායක ස්ථවිර

2531 / 1987-12-22

## වීරයෝ මළත් නො මැරෙන්නෝ ය.

ලෝකයේ විවිධ ගණයේ වීරයෝ පහළ වෙති. ජාතිකාභිමානය, දේශාභිමානය, ආගමාලය හා භාෂා සාහිත්‍යය වෙනුවෙන් සිය දිවි කැප කළ අය පමණක් නොව නව නිපැයුම් බිහි කළ අය ද වීරෝත්තමයන් ගණයෙහි ලා සැලකිය හැකි ය. ජාතික නිදහස් දිනය නිමිත්තෙන් මහරගම, සිරි වජිරඤාණ දහම් පාසල මුල්ව ජාතික වීරවරයින්ට හරසර දැක්වීම වසර කිහිපයකට සිට ජාතික නිදහස් දිනයේ දී සිදු කරගෙන එනු ලැබේ. මෙවර එළි දක්වන්නේ සසුන් කෙත සසිරි කළ වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ වීර අපදානය යි.

බෝධිසත්ව ගුණෝපේත අපවත් වී වදාළ අග්ගමහාපණ්ඩිත පරමපූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම වීර අපදාන පොත් පෙළ සම්බන්ධයෙන් නොයෙක් වර හැඟීම් බරව ප්‍රකාශ කළ වාර බොහොමයි. අපේ දරුවන් ජාතික වීරවරයින් පිළිබඳ නොදන්නා බවත් වැඩිහිටියන් පවා වීරවරයින් පිළිබඳව වැඩි තොරතුරු නොදන්නා බවත් මතක් කැර දුන් අතර, මුදල් තියෙන පිරිස මෙම වීර අපදාන පොත් මුද්‍රණය කරවා නොමිලේ බෙදාදීම ජාතික මෙහෙවරක් බවත් ප්‍රකාශ කළා. කාලීන වශයෙන් බලන කල එය ඒ ආකාරයෙන් ම කිරීම අපහසු වුවත් සහනදායී මිළකටවත් මෙම පොත් ඔබ අතට පත් කරන්නට ලැබීම සතුටට කාරණයකි.

සිරි වජිරඤාණ දහම් පාසලේ සියලු කටයුතු ප්‍රධාන ප්‍රතිපත්ති පහක් යටතේ සිදු කැරෙන අතර විෂය සමගාමී ක්‍රියාකාරකම් වශයෙන් සලකා සෑම වසරක ම වීරවරයින් නිදහස්

දින සිහිපත් කිරීම කලක සිට සිදු කැරගෙන එන චාරිත්‍රයකි. දෙස බස රැස හා ආගම වෙනුවෙන් මහත් මෙහෙවරක් සිදු කළ ගිහි පැවිදි ඒ උතුමන්ගේ වීර ක්‍රියාකාරකම් ඉස්මතු වන ආකාරයෙන් මෙම සිහිපත් කිරීම සිදු කෙරේ.

පන්නිපිටිය, දෙපානම, වීරමාවත, මූණමල් පෙදෙස අංක. 34/24 දරණ නිවසෙහි පදිංචි අනුර කුමාර කාරියවසම් මහතා මෙවර මේ වීර අපදානයේ දායකත්වය දැරීමට ඉදිරිපත් වීම සතුටට කාරණයෙකි. පසුගිය වසරවල මුද්‍රණය කළ වීරාපදානවල දායකත්වය දැරුවේද අනුර කුමාර කාරියවසම් මහතා ය. වාර්ෂිකව මෙම සුවිසල් කටයුත්තට අතහිත දීම සම්බන්ධයෙන් අපගේ කෘතඥතාවය එතුමාට හිමි විය යුතු ය.

2004 වර්ෂයේ සමස්ත ලෝකයම කම්පාවට පත් කරමින් හදිසියේ ඇති වූ සුනාමි ඛේදවාචකයෙන් දිවි අහිමි වූ අනුර කුමාර කාරියවසම් මහතාගේ ආදරණීය බිරිඳ බේමා ශිරෝමණී මලවිආරච්චි ගුරුතුමිය, කවීෂ පන්සර කාරියවසම් පුතුගේ හා සුභාවි මිණුපමා කාරියවසම් දියණියගේ මවගේ ගුණ සිහිපත් කැර මතු සසර මෙවන් අකල් විපතකට ගොදුරු නොවේවා යන අදිටනින් සහ සසර දුක් කෙළවර අමා මහ නිවනින් සැනසේවා යන උතුම් ප්‍රාර්ථනයෙනි.

මෙම වීරාපදානයේ ප්‍රථම මුද්‍රණය 1998 වර්ෂයේ සිදු වූ අතර, දෙවන මුද්‍රණය සිරි වජිරඤාණ දහම් පාසල මුල්ව මේ වැදගත් අවස්ථාවේ සිදු කරන්නට ලැබීම සොම්නසට හේතුවකි. පොතෙහි මුද්‍රණ කටයුතු හොඳින් සිදු කැර දුන් රුවන් පහරුවේ අප හිතවත් විජයබණ්ඩාර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අතහිත දුන් හැමටත් තෙරුවන් සරණින් දිගාසිරි සැළසේවා යි ආශිංසනය කරමි.

# කන්ද උඩරට පහළ වූ මිණිපහන

මෑත යුගයේ **"පෙරදිග ධර්ම භාණ්ඩාගාරය"** බවට පත් වූයේ පරම පූජ්‍ය පැළෑණේ **සිරි වජිරඤාණ** මාහිමිපාණන් බව තොරතුරු දන්නා අය කියති, ලියති. එමෙන් ම දහනව වැනි සියවසේ අග භාගයේ විසූ **"ජාතියේ පියා"** හැටියට සලකනු ලබන්නේ **අනගාරික ධර්මපාල** වීරයා බව ද කියති.

එසේ ම **කීර්ති ශ්‍රී රාජසිංහ නරේන්ද්‍රයන්** කන්ද උඩරට රජ වූ සමයේ (1753), ඒ අඳුරු යුගයේ, බෝධිසත්ත්ව ගුණෝපේත **වැලිවිට අසරණ සරණ සරණංකරාභිධාන සංඝරාජ ස්වාමීන්ද්‍රයාණෝ** කන්ද උඩරට ධර්ම ශාස්ත්‍රාලෝකයේ මිණිපහන දැල්වූහ. එදා ඒ සඟරජ මාහිමිපාණන් නො සිටින්නට මේ ලංකාද්වීපයේ බුදු සමයට ඇති වන්නට තිබුණු දුර්දසාව කොතරම්දැයි නො කිය හැකි ය. සඟරජ මාහිමිපාණන් හට බෞද්ධ ලෝකයා ණයගැති ය. ඒ මිණි පහනට තෙල් සැපයූ පහත රට ප්‍රබල පඬිරුවන වූවාහු සිටිනාමළුවේ ධම්මජෝති මාහිමිපාණෝ ය. මේ පොතෙහි සඟරජ මාහිමිපාණන් පිළිබඳව ලියයුතු දෑ මැනැවින් සඳහන් වන හෙයින් ද **අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන්** වහන්සේ සපයා ඇති ලිපියේ තවත් විස්තර ඇතුළත් වී ඇති හෙයින් ද අපි ඒ සඳහා නො වෙහෙසෙමු. කොටගම වාචිස්සර තෙරපාණන් විසින් ආචාර්ය උපාධිය සඳහා ලියන ලද **"සඟරජ මාහිමි සිරිතෙන්"** ද බොහෝ කරුණු දත හැකිය. සිරි වජිරඤාණ ධර්මායතනයේ ප්‍රකාශන වශයෙන් නිකුත් කරනු ලබන වීර කථා පොත් පෙළ විශේෂයෙන් බාල - තරුණ පිරිසට සිය ජීවිත සරු කැර ගැනීමට, වීරෝදාර ගති තමන් තුළ ඇති කැර ගෙන ඉදිරියට යාමට බෙහෙවින් මහෝපකාරී වනු ඒකාන්ත ය.

මළත් නොමැරෙන වීරයන්නේ
සිරිත් බැතියෙන් ඉගෙන ගන්නේ
ඔබත් ඒ විරු මඟ මැ යන්නේ
හෙටත් මේ ලක් බිම රකින්නේ

හක්මන සුමනසිරි හිමි
ප්‍රධානාචාර්ය
සිරි වජිරඤාණ දහම් පාසල
මහරගම.

2553/2010-02-04

මෙම ගත සැකැසූ ශාස්ත්‍රවේදී පූජ්‍ය වැයිහේනේ **පඤ්ඤාලෝක හිමිපාණනට** ද සිරිල් හේවාවසම් ශූරීනට ද මේ මහඟු පිංකමට අත හිත දෙමින් ක්‍රියා කරන ගිහි පැවිදි හැමට ද අපි නො වක්, ඉත සිතින් සෙත් පතමු. නව වසර හැමට ම සුවදායී වේවා.

**පූජ්‍ය පියදස්සි**
මහාස්ථවිර

2531/1987-12-22
වජිරාරාමය, බම්බලපිටිය

# දැයට ලියූ කවි

"අත් නොසිටුවමි" යන අදහස සිතේ ඔබා
ප ත් වී පෙරමුණට රණ හඬ නගා නොබා
ග ත් තොත් මිසක් බලහත්කාරයෙන් අඹා
දෙත් දෝ අපට කවරෙක් නිදහසක් ලබා

දි ක් ජය පතන බලගතු සෙබළකුගෙ රගේ
ද ක් වා ලබන නිදහස ම ය ඉතා අගේ
ඔ ක් කෝගෙ ම පිහිට යැද නිවටයන් වගේ
අ ත් පත් වුණත් කුමකට දැයි සිතනු සගේ

මගේ රට - මගේ ජාතිය - මගේ ගම
මගේ සත් සිරිත් සහ ජාතික උරුම
මගේ වැරයෙන් ම නිදහස් කොට තැබුම
මගේ යුතුකමැයි සලකවු හැම දෙනම

බ ළ නේ කන්ද පීරා ගත්නොරුව සිඹ
කැල ණියෙ පහස ගෙන එන මඳ සුළඟ ලැබ
බ ල වත් සිහළ පැටියකු මෙන් වැඩෙන ඔබ
මැළි වන්නෙහි ද? ඇයි ගත සිත නොකර පොබ

ජගත් නීල ලක් පුර රක් යුද වා දී
තෙදත් පතළ වීදිය බණ්ඩාරා දී
සමත් සෙනෙවි පරපුර රැක මත පී දී
ඔබත් සෙනෙවි කුසුමකි සලකව පෑ දී

ටිබෙට් ජාතික
**ඇස්. මහින්ද හිමි**
(නිදහසේ දෑහැන)

# වැලිවිට අසරණ සරණ සරණංකර සඞ්ඝරජ හිමිපාණෝ

## සිංහල ජාතියට සිදු වූ මහා විපත

කෝට්ටේ රාජධානි සමයෙන් පසු සිංහල ජාතියට බුදු සසුනට හා භාෂා ශාස්ත්‍රයනට උදා වූයේ දුර්දශාපන්න අවස්ථාවකි. විදේශීය ආක්‍රමණ යුද කෝලාහල හා අභ්‍යන්තර වියවුල් ආදී විවිධ හේතූන් නිසා රටේ ශාසනික, සාමාජික හා ශාස්ත්‍රීය තත්ත්වය බොහෝ දුරට පිරිහී යන්නට විය. සොළොස්වන සියවසේ මුල් භාගයෙහි මෙරටට පැමිණි පෘතුගීසීහු ගම් දනව් පෙළමින්, කොල්ල කමින්, දූෂණයන්හි යෙදෙමින් බිහිසුණු අපරාධ කිරීමෙහි යෙදුණාහ. ඔවුහු රෝමානු කතෝලික ආගම පැතිර වීමෙහි ලා නොයෙකුත් උපක්‍රම යෙදූහ. ධනය, ඉඩකඩම් හා ගරුනම් ආදිය දීමෙන් ඇතැම් සිංහලයන් කතෝලික ආගමට හරවාගත් අතර කඩුවේ හා තුවක්කුවේ බලය යොදා ඇතැම් සිංහලයන් කතෝලිකයන් බවට පත් කර ගත්හ.

## පෘතුගීසීන්ගෙන් සිදු වූ හානිය

එකල පැවැති පෘතුගීසි පාලනයේ කෲරකමත් අමානුෂික භාවයත් පිළිබඳව පෘතුගීසි ඉතිහාසඥයන් විසින් ලියා ඇති වාර්තාවලින් එය මොනවට පැහැදිලි වෙයි. මහාචාර්ය ගුණපාල මලලසේකර මහාශයාණන් ඒ පිළිබඳව කරන විග්‍රහයක් ඔහු විසින් රචිත **"ලංකාවේ පාලි සාහිත්‍යය"** නම් කෘතියෙහි මෙසේ දක්වේ.

''ඔවුන්ගේ (පෘතුගීසීන් ගේ) ඉදිරි ගමන පිළිබඳ හැම අවස්ථාවක ම විශේෂ ලක්ෂණය වූයේ අන්‍යතර යුරෝපීය යටත් විජිත ඉතිහාසයක නො දක්නා අති ලෝභිත්වය, අවිචාර බුද්ධිය, කෲරභාවය හා අමානුෂික හැඟීමයි. යුද හමුදාවේ ජයග්‍රහණය හා සමග ම ඔවුන් ගේ රෞද්‍රභාවය ද දුක්පීඩා පිළිබඳ උදාසීන භාවය ද දියුණු විය. ඔවුන් ගේ අමානුෂික ම්ලේච්ඡ ක්‍රියා ස්ත්‍රී, පුරුෂ, ළමා යන භේදයක් නොදන්නා දයා විරහිත බවක් හා එක්ව ගියේ ය. අනුකම්පාව ඔවුනට රහසක් විය. යටත් වැසියන් බියවද්දන පිණිස ද පෘතුගීසි රාජ්‍යයේ බලය ඔවුන් තුළ කාවද්දන පිණිස ද ඔවුන් කළ ප්‍රචණ්ඩ ක්‍රියා කොතරම් සොරතර ද යත්, ඒ ක්‍රියා ඔවුන් ගේ ම මිත්‍ර ඉතිහාසඥයන් විසින් ඒ අවධියේ ම වාර්තාගත නොකරන ලද නම්, සත්‍යය යැයි විශ්වාස කිරීමට නො හැකි තරම් පිළිකුල් සහගත ය. කිරිබොන දරුවෝ හේවායන් ගේ හෙල්ලවල ගසා මවුපියන්ට තම ''කුකුළන්ගේ ඇඬීම ඇසෙන පිණිස'' ඔසවන ලදහ. සමහරවිට ළදරුවෝ ඇඹරුම් ගල්වල දමා ලොඳ මෙන් තළා පොඩි කරන ලදහ. මේ සෝරතර දුක්ඛදායක ක්‍රියා බලා සිටීමට බල කරනු ලැබීමෙන් පසු මව්වරු ද වද දී මරණ ලදහ. යුද්ධ භටයින්ගේ විනෝදය පිණිස කිඹුලන්ට ගොදුරුවනු වස් මිනිස්සු පාලම් උඩින් ගඟට විසි කරන ලද්දෝ ය. මෙසේ මිනී මස් කෑ කිඹුල්ලු කෙතරම් හීලෑ වූවා ද යත් පසුව ඔව්හු සිවුරුහන් හඬලෑමක් ඇසුණු කෙණෙහි ගොදුරු බලාපොරොත්තුවෙන් ජලයෙන් හිස එසවූහ. මිෂනාරිවරු සාහසික උද්‍යෝගයකින් යුතුව අවුරුදු දෙදහසක් වෙහෙස විඳ තනන ලද ගොඩනැගිලි කඩා බිඳ දැමීමට පටන් ගත්හ.

මිෂනාරිවරු යකාගේ පිළිකුල් සහගත නිර්මාණයක් විනා අන් කිසිවක් බුද්ධාගමේ නුදුටුවෝ ය. මුනිවරයන් විසින් උගන්වන ලද මූලධර්ම කවරේදැයි විමසීමට ඔව්හු නො

නැවතුණෝ ය. එහි උදාර දර්ශනය වෙහෙසවූයේ කවර විශිෂ්ටාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාදැයි විමසීමට ද ඔව්හු නො නැවතුණෝ ය. උමතු මිෂනාරීන් ගේ හා ඔවුන් ගේ නිවට. සගයන් ගේ පහර ලැබ සැඳැහැවතුන් විසින් අවුරුදු සිය දහස් ගණනක් තුළ රට හැමතැන ම ඉදි කරවන ලද ධාතු ගර්භ, ප්‍රතිමාගෘහ ආදී ඒ මනහර මන්දිර එක එකක් ඇද වැටෙන විට මුළු රටට ම බලවත් වේදනාවෙන් කෙඳිරි ගෑවුණි. මෙයට පෙර කිසි කලෙක මෙතරම් ශ්‍රේෂ්ඨ සභ්‍යත්වයක් හා උදාර සංස්කෘතියක් මෙතරම් දරුණු ලෙස නොනසන ලදී.

ශතවර්ෂ ගණනාවක කටයුතු අවුරුදු කීපයකදී විනාශ කැරිණ. ලංකාවට උරුම ප්‍රවේණි අති උදාර හා අති ශ්‍රේෂ්ඨ සියල්ල ම මරුවාට කැප විය. මෙසේ සිදු වූ හානිය කිසිසේත් පිරිමැසිය නො හැකිය. යුරෝපීයයන්ගේ සාහසික ආක්‍රමණයන්ට විරුද්ධ ව ආයුධ ශක්තිය සංවිධානය කිරීමෙහි ලා පුරෝගාමී වූවෝ නම්, සෙංකඩගල වනගත කඳුකරයෙහි හා යාබද ගම්වල වැසි වීරෝදාර ජනතාවයි. ඔව්හු අතිපුරාණ කාලයෙහි පටන් ප්‍රබල දේශානුරාගය හා විදේශීය ආක්‍රමණිකයන්ට දෘඪ විරෝධය පෑම සම්බන්ධයෙන් කීර්තිමත් වූහ.

**"ලංකාව හා පෘතුගීසිහු"** නම් ග්‍රන්ථයෙහි පෝල් ඊ. පීරිස් මහතා ඉදිරිපත් කරන පහත දැක්වෙන මෙම විස්තරය ද කියවා බලන්න.

"ක්‍රිස්තු භක්තිය ප්‍රසිද්ධියේ නොපිළිගත් කිසිවකුට කිසි ම තනතුරක් ඉසිලීමට අවසර නැතිවිය. ක්‍රිස්තු භක්තිය නොඅදහන්වුන්ට කිසි ම මහජන අයිතිවාසිකම් නො දෙන ලදී. අභිනව ආගම අදහන අය සියලු ම බදු වලින් නිදහස් කරනු ලැබූහ. මනුෂ්‍යත්වයේ අධම පක්ෂයට අයත් මේ සියල්ල සාර්ථක විය.

ක්‍රිස්තු භක්තිය කෙරෙහි විශ්වාසය ඇති බව ප්‍රසිද්ධියේ කියා පෑම කාලෝචිත සිරිත විය. සෑම උපක්‍රමයක්ම යොදා බුද්ධාගම විනාශකර දැමීම දෙවියන් කෙරෙහි කළයුතු යුතුකමක් ලෙස සැලකූහ. අවුරුදු 2000 ක් මුළුල්ලේ මේ රටේ ගොඩනංවන ලද සැලැස්ම ස්වල්ප දිනකින් මහ පොළොවට ඇද දැමීමේ අමානුෂික කාර්යයෙහි මිෂනාරිවරු සාහසික ලෙස උනන්දු වූහ. ඔවුහු බුද්ධ දේශනාවේ යක්ෂයා ගේ පිළිකුල් සහගත නිර්මාණයක් මිස හරයක් ඇති දෙයක් නුදුටුහ. ඔවුන්ගේ හැම සිතිවිල්ලක් ම තුඩු දුන්නේ බුද්ධාගම සහමුලින් ම සදහට ම විනාශ කර දැමිය යුතුය යන පරම අදහසට ය''

## ලන්දේසීන් කළ විනාශය

මෙසේ එකසිය පණස් තුන් වසක් මුහුදුබඩ පෙදෙස්· අල්ලාගෙන ලංකාවේ සාරය උරා බොමින් සිංහලයන් ගේ ජාතික ආගමත් සංස්කෘතියත් විනාශ කරමින් සිටි පෘතුගීසීන් පළවා හැර උදව් පිණිස කැඳවාගත් ලන්දේසීන් ගෙන් සිදුවූයේ ද බලවත් හානියකි. විපතකි, **"ඉඟුරු දී මිරිස් ගත්තාක් වැනි"** වූ මේ අනුවණ ක්‍රියාව නිසා සිංහල ජාතියට සිදුවුණේ කබලෙන් ළිපට වැටීමකි. ලන්දේසීන් කළ හානිය එස්. ජී. පෙරේරා පියතුමා දකින හැටි ඔහු විසින් ලියන ලද **"ලංකා ඉතිහාසය - ඕලන්ද යුගය"** නම් ග්‍රන්ථයෙහි මෙසේ ලියා ඇත.

''ලන්දේසි - රෙපරමාදු ක්‍රිස්තියානිය ඇදහීම අනිවාර්ය කළ ලන්දේසීහු බුද්ධාගම - හින්දු ආගම මහමදාගම හා කතෝලික ආගම ඇදහීම සම්බන්ධයෙන් මහත් බාධා පැමිණ වූහ. රජයේ රක්ෂා ලබා ගත හැකි වූයේ ලන්දේසි ක්‍රිස්තියානීන් හට පමණකි. ඔවුන් ගේ පල්ලියක ලියා පදිංචි නොකෙරුණු හැම උපතක් මෙන්ම විවාහයක් ද ඔවුන් විසින් නොපිළිගන්නා ලදී. අධ්‍යාපනය ලබා ගත හැකි වූයේ ද ඒ ආගම ඇදහූ අයට

පමණකි. තම යටත් ප්‍රදේශවල මිනිසුන්ට බුදු සමය ඇදහීම තහනම් කළ ලන්දේසීහු ඔවුන් බලයෙන් ක්‍රිස්තියානියට හරවා ගැනීමට වෑයම් කළහ. මේ සඳහා නීතියේ පිහිට ද සෙවූ ඔව්හු සමාගමට අයත් සියලු වැසියන් ප්‍රශ්නෝත්තර මාර්ගයෙන් ක්‍රිස්තු ධර්මය ඉගැන් වූ පාසල්වලට යැවීමටත් බවුතීස්ම කරවා ලන්දේසි සිරිත් විරිත්වලට අනුව ආවාහ විවාහවලට ඇතුළත් කරවීමටත් මහත් උත්සාහයක් දරා ඇත''

## රාජසිංහ රජු කළ හතුරුකම්

මෙසේ ලක්දිව අවුල් වියවුල්වලින් ගහණ ව නොසන්සුන් තත්ත්වයක පැවැති සමයෙහි විසූ රජ, ඇමැති, ප්‍රභූ ආදීන්ට ද ශාසනය ගැන සොයා බැලීමට අවකාශයක් නො වීය. එහෙයින් භික්ෂූහු හුදෙකලා වූහ. උන් වහන්සේ ශාස්ත්‍ර ඥානයෙන් හා ගුණ සම්පත්තියෙන් පිරිහී යන්නට පටන් ගත්හ. සිය පියාණන් මරා සිහසුනට පත් රාජසිංහ රජු සිව සමය වැළඳ ගෙන බුදු සසුනේ හතුරකු වීම නිසා සිරිලක පුරා ශිව පූජකයන් නැවැත්වී ය. ඔහු උඩරට රජු පළවා හැරීම නිසා තත්ත්වය වඩාත් දරුණු විය. මේ හේතුව නිසා බෞද්ධ භික්ෂුවට සිදු වූයේ බුදු දහම හෝ භික්ෂුත්වය හෝ රැකීම නොව සිය දිවි රැක ගැනීමට මාරාන්තික සටනක යෙදීමට ය.

එ ලෙස පත් සිවසෙ       න්
අතරින් බලැති කපුව       න්
සත් දෙනෙක් නොලසි       න්
මෙලක වනසා කළෝ අබිම       න්

(මන්දාරම් පුර පුවත)

අරිට්ට කී වෙණ්ඩු නම් කපටි ආඬි ගුරුන් ගේ බස් ගෙන අහිංසක භික්ෂූන් දොරගුළු ලා විහාරයන්හි සිර කොට ගිනි තැබීමෙන් ද කඩුවට හා මුහුදට බිලි කිරීමෙන් ද මේ රජු කළ ශාසන විනාශය කෙතරම් දරුණු වී ද යත්, ඇතැම් භික්ෂූහු සිවුරු හැර ගිහි බවට පත් වූහ. සමහරු වනගත ව උඩරට ගිරි දුර්ගයන්හි සැඟවී සිට දුකසේ ජීවිතය රැක ගත්හ. සිවුරු හළ අය විහාරවලට අයත් නින්දගම් කමින් ජීවත් වූහ.

මෙසේ මොවුහු පෙර රජුන් දවස විහාරවලට පුද කොට දුන් ඉඩ කඩම් අස්වද්දවා, ගේන් වපුරවා, මාගමුන් ලවා උයවා කමින්, වෙළෙඳාම් වෙදකම්, නැකැත්කීම් ආදී අශාසනික ක්‍රියාවන්හි යෙදී ජීවත් වූහ. එපමණක් නොව, සොහොනෙහි උඩුකුරුව මන්ත්‍ර ජප කරන, යකුන් එළවන, මන්ත්‍ර ගුරුකම් කරන, සෙත්කවි වස්කවි කියන, වතුපිටි වවන ශ්‍රමණ ප්‍රතිරූපකයන් පිරිසකි, මහනුවර අවදිය වන විට ලක් සසුනෙහි දක්නට ලැබුණේ.

''නැකැත් වෙදකම් ගොවිතැන් වෙළෙඳාම් ආදී වූ අකර්තව්‍යයෙහි යෙදී රන් රිදී ආදිය පිළිගනිමින් මිථ්‍යාජීවයෙන් ජීවත්ව දත් උයවන්ට මාගමුන් කැන්දාගෙන දුශ්ශීලව වසන අලජ්ජි ශාසනාවචර කුල පුත්‍රයන්ගේ බාහුලික භාවය දැක''

(සංඝරාජ සාධුචරියාව)

මෙසේ කිසිත් ඉගෙණීමක් හෝ ප්‍රතිපත්තියක් නැතිව අශාසනික අගෝචර පහත් ජීවිතයක් ගත කරමින් ප්‍රසිද්ධියේ ම දුසිලුන් ලෙස කල් ගෙවූ අයුරු සඟරජ වතෙහි එන මේ විස්තරයෙන් ද සනාථ වේ.

පැවිදි වී එකල      ට
සිටිනා මහණ පිරිස      ට
ඉසුරු වී ගණ දෙ      ට
සිටින අයගෙන් පුරුදු නුවණ      ට

සිතුනු දහමෙක ග      ති
කුලදරුවනට සැදූහැ      ති
මහණ දම් නොවටි      ති
කියා උන් වෙත පැවිදි වළක      ති

තෙරුවන් දියුණු වෙ      න
ලෙස නැණැත්තන් පෙර දි      න
පිදූ ගම්වල වස      න
අයට මැයි පරවෙණිය කියම්      න

උන්ගෙන් පැවත එ      න
දරුවන් පැවිදි කර ගෙ      න
බැහැරින් පැවිදි වෙ      න
අයට අවසර නොදී ඉඳගෙ      න

දහම් ලෙස නො හැසි      ර
කුලදූසනය කර ක      ර
බණ නො ඉගෙන පව      ර
නැකත් වෙදකම් පුරුදු කැර කැ      ර

එයින් ලොව සිත් ගෙ      න
වස්තුව උපදවා ගෙ      න
අඹු දරුවන් රකි      න
පමණ මැයි උන් පුරන සිල් ගු      ණ

කෙසර සම් පොරව		න
මහලු වඳුරන් විලසි		න
රහත් දද ඇඳ ගෙ		න
චාටු තපසින් සසුන් කෙලෙස		න

සැදැත්තන් පුද		න
නොයෙක් පූජා ලබමි		න
නෑයින්ට බෙදමි		න
නිමල සස්නේ කසට තවර		න

නියම පා හරිමි		න
විසිතුරු පිඟානක් ගෙ		න
පිඬු  සිඟුම් හරිමි		න
මහණ අඟනන් ලවා පිස ක		න

පෙර බුදුන් හැසුරු		න
මගට සරදම් කරමි		න
ගිහි ඇමැතියන් මෙ		න
මහත් අබිමානයෙන් කල් ය		න

හෙරණ සඟ ගණ නෙ		ක
කටයුතු තබා අනෙක		ක
හැසිරෙමින් නොව සැ		ක
සස්න නටබුන් කරති සිරිල		ක

**ගණින්නාන්සේලා**

විහාර සන්තක ඉඩ කඩම් හා දේපල සිය පරපුරටම උරුම කර දෙනු වස් තම දරුවන් ම පැවිදි කිරීමත්, සඟසතු දෙයින් සිය නෑයින් රැකීමත් ඔවුන් ගේ සිරිත වී පැවතිණ. මෙසේ කල් ගෙවූ මොවුන් අතර කලාතුරකින් හමුවුණු උපසපන් භික්ෂූහු තෙරුන් වහන්සේ නමින් ද හෙරණ පැවිද්දෝ **ගණින්නාන්සේ** නමින් ද හඳුන්වනු ලැබූහ.

සසුන් රැකුමෙහි හා සසුන් වැඩුමෙහි නියැලුණු භික්ෂූන් මේ අන්දමින් ධර්මඥානයෙන් හා ප්‍රතිපත්තියෙන් ගිලිහී යන විට ගිහියන් ගේ ආගමික ඥානය හා ශ්‍රද්ධාදී ගුණධර්ම දුර්වල වී යාම පුදුමයක් නොවේ. මෙකල විසූ ගිහියෝ ද නාමමාත්‍ර බෞද්ධයෝ වූහ. පන්සිල් ගැනීම සිරිතක් වශයෙන් කළ ද, පන්සිල් රැකීමක් නම් නො වී ය. ඔවුහු පන්සිල් ගෙන දඩයමේ ද ගියහ.

ශාසන ප්‍රතිපත්තීන්හි අවිදග්ධ මෙබඳු පැවිද්දන් ගේ අනුශාසනා පරිදි ක්‍රියා කිරීමට සිදුවීම නිසා නිසි පරිදි ශාසන සංග්‍රහයක් කිරීමට පවා එකල සිටි බෞද්ධ ප්‍රභූන්ට නොහැකි විය.

1 වන විමලධර්මසූර්ය හා 11 වන විමලධර්මසූර්ය යන රජුන් දවස සිදු කළ උපසම්පදා කර්මයන් පවා චිරස්ථායී නොවී ඉක්මනින් අතුරුදහන් වූයේ ද එකල පැවැති මේ අවාසනාවන්ත තත්ත්වය නිසා ම ය.

## රක්ඛංග දේශයෙන් උපසම්පදාව ගෙන ඒම

ලක් බුදු සසුන වැටී ඇති අවාසනාවන්ත තත්ත්වයෙන් ගොඩ නඟා එතෙක් එය රැකගෙන ආ භික්ෂූන්ගේ තත්ත්වය ද නඟාලනු වස් උපසම්පදා කර්මයක් පැවැත්වීමේ යෝග්‍යතාවය ගැන කල්පනා කළ 1 වන විමලධර්මසූර්ය රජතුමාට ඒ සඳහා සුදුසු භික්ෂූන් මෙරටින් ලබාගත නොහැකි බව පෙනී ගියේ ය. එහෙත් ඉන් අධෛර්යයට පත් නොවූ රජ තෙමේ රක්ඛංග දේශයට දූත පිරිසක් යවා බුරුම ජාතික භික්ෂූ පිරිසක් වැඩමවාගෙන අවුත් **චන්දවිලාසකිත්ති** මහතෙරුන් ගේ උපාධ්‍යායත්වයෙන් හා **නන්දිචක්ක** මහතෙරුන් ගේ ආචාර්යත්වයෙන් අතිරේක දශවර්ගික සංඝයා වහන්සේ මධ්‍යයේ මහවැලිගඟ උදකුක්ඛේප සීමාවේ දී උපසම්පදා විනය කර්මයක් සිදු කරන ලදී.

ශාසනමාමක මේ රජුගේ ක්‍රියාමාර්ගය ප්‍රශංසනීය විය. පරිහානිය තාවකාලික ව නතර වුව ද එමඟින් ශාසන චිරස්ථිතියක් නම් නොවී ය. ඊට හේතුව ඔහුගේ ඇවෑමෙන් රජකමට පත් වූ සෙනරත් හා දෙවන රාජසිංහ යන දෙරජුන් ගෙන් එතරම් සහයෝගයක් හා අනුබලයක් නොලැබීම ය. භික්ෂූන් වහන්සේ නැවතත් පරිහානි පථාවතීර්ණ වූහ.

## යළිත් උපසම්පදාව ගෙන ඒම

11 වන විමලධර්මසූර්ය රජු සිහසුනට පත්වන අවදිය වන විට භික්ෂූ සමාජයේ තත්ත්වය අතිශය ශෝචනීය විය. සැදැහැ ගුණයුත් මේ රජතුමා ද ලන්දේසීන්ගේ උපකාර ලබා ගෙන සිංහල දූත පිරිසක් රක්ඛංග දේශයට යවා සන්තාන, ලෝකරාග පුග්ගල, සංකිච්ච ආදී භික්ෂූන් වහන්සේ තෙතිස් නමක් මෙරටට වැඩමවා ගැටඹේතොට උද්කුක්ඛේප සීමාවෙහිදී උපසම්පදා පුණ්‍යකර්මයක් පැවැත්වී ය. මෙවර ලාංකික භික්ෂූන්

තෙතිස් නමක් උපසම්පදාව ලැබූ අතර, එකසිය විසි දෙනෙක් කුලදරුවෝ හෙරණ පැවිද්ද ලබාගත්හ.

සිදු කළ මේ සත් ක්‍රියාවෙන් ශාසන චිරස්ථිතිය සඳහා කිසියම් අනුග්‍රහයක් ලැබෙතැ'යි සිතුවද එයිනුදු එතරම් සාර්ථක ප්‍රතිඵලයක් අත් නොවූ බව පෙනේ. මේ උපසම්පදා විනය කර්මය පිළබඳ සමකාලීන ලේඛකයෙකු වූ **ගම්මුල්ලේ රතනපාල** හිමියන් විසින් කරනු ලබන මෙම විස්තරයෙන් එය පැහැදිලි වේ.

'' රාජසිංහ මහරජාණන් ගේ ඇවෑමෙන් රාජ්‍ය ශ්‍රී පද ප්‍රාප්ත වූ ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ශාසනෝදය කාමී වූ දෙවැනි විමලධර්මසූර්ය මහරජාණෝ ''අප වැනි ශ්‍රද්ධාවන්ත මහෝත්තමයන් විසින් සර්වඥ ශාසනයට උපකාර කටයුතුයැ'යි යන කරුණාද්ධ්‍යාශ ඇතිව යටත් පිරිසෙයින් ලක්දිව උපසම්පදා සංඝයා පස්නමක් පමණවත් සුශීල තැන් නැති හෙයින් රක්ඛංග දේශයෙන් අතිරේක දශවර්ගික සංඝයා ගෙන්වා එකල ශාසන පිළිවෙත් දන්නා සඟ නමක් නැති නිසාදෝ සීමා බන්ධනාදී වශයෙන් ශාසනය චිරස්ථායී කටයුත්තක් නොකොට ධම්ධර විනයධර නමක් වේව යි සුශීල දුශ්ශීල නමක් වේව යි ශාසන ප්‍රතිපත්ති පරීක්ෂාවක් නැතිව ලක්දිව මෑත භාගයෙහි පැවත ආවා වූ නොපිළිවෙත් ම පිළිවෙතැයි සිතා ශ්‍රද්ධාවන්තයින්ගේ පැවිදිවීමට අවසර නො දී ශාසන පරම්පරාවය යි කියා වරදවා විහාරගම් හා වැඩි ගම් කුඹුරු ඇති තෙතිස් නමක් පමණ තෝරා ගෙන මහවැලි ගඟෙහි උදක සීමාවෙහි දී උපසම්පදා කරවා සිවුපසය ආශ්‍රය කොට ශ්‍රද්ධාවන්තයන් විසින් නිවන් පිණිස පැවිදිවන ලද සර්වඥ ශාසනයෙහි ගම් කුඹුරු නිසා එක්සිය විසිනමක් පමණ සාමණේර තැන් පැවිදි කරවා රටින් වැඩි සංඝයා දේශාන්තර යවා......''

මෙසේ දහසය වන සියවසේ මුල්භාගයේ සිට ඇති වූ ශාසනික පරිහානිය අනුක්‍රමයෙන් දියුණු වී ගිය අතර එය වළක්වා ගැනීම සඳහා දරන ලද සියලු ප්‍රයත්න අනපේක්ෂිත අන්දමින් ව්‍යර්ථ වී ගියේ ය. බෞද්ධ සමාජයේ එදා පැවැති දූෂිත තත්ත්වය සියැසින් දුටු ක්‍රිස්තියානි පූජකයකු කරන මේ විස්තරය ද වැදගත් ය.

''මේ සිංහල රටේ පළමුවෙන් සිව සමයම් ද දෙවනුව බුද්ධ සමයම් ද මෙසේ වෙස් පෙරළා දූන් එක සමයකුත් නැතිව යක්ෂ ඇදහිල්ල ම මතු වන්නේ ය ..... මේ හැර බුද්ධාගමේ ආඥාවලින් එක දෙයකුත් මේ රටේ වලංගු නොවේ. ප්‍රාණඝාත, සුරාපාන, පරදාර, සොරකම්, මුසාවාද යන මේ පස් පව් කිරීම වළකා තිබෙන තැන මස් මරන්නෝ සතුන් මරා රැකෙන්නෝ ය. ගොවියා ගොවි සතුනුත්, හළුවා හළු සතුනුත් මරා මෙකී සියලු අය ප්‍රාණඝාත පාපවලින් රැකී ඊට බිලි, දැල්, උගුල්, උදළු, ඊ, දුනු තුවක්කු ආදි ආවුදවල් ගෙන යුද්ධයට සැරසෙන්නාක් මෙන් ඒ ආඥාව කඩා හෙළන්නට සෑදී සිටින්නෝ ය. මදින්නා, පෙරන්නා, විකුණන්නා ඊට වතු, ගේ දොර දෙන්නා මේ සියලු අය සූරාපාන බෝ කරන පාපයෙන් රැකෙන්නෝ ය. විවාහ වූ අඹු-සැමි ඔවුනොවුන් ගේ සහෝදර සහෝදරියනුත් සමග එක ගෙයි වැස ඒ පරදාර පාපයෙන් රැකෙන්නෝ ය. නිමිත්තෝ නැකැත්තෝ මුසාවාදවලිනුත් නිසොරුවන්ගේ ගෙවල් පෙන්නා වස්තු නසමිනුත් යක් දෙස්සෝ යකුන් නටවමිනුත් මේ පාපවලින් රැකෙන්නෝ ය.

තව ද, මෙබඳු අනදරවල් දූනගෙන එවැනි අයට සිල්දෙන ගණෙල්ලෝ එම පාපයෙන් රැකෙන්නෝ ය. මේ නිසා මේ රටේ බුදුන් ගේ නම මිසක් ආගම පැවතීම කිසිවක් නැතිව බුදුන්ට මල් පමණක් දී යකුන්ට ගස් ගෙඩි ආදී සියලු වස්තුව තහනම් කර දෙන හෙයින් යක්ෂ ඇදහිල්ලේ කිසිත් නැති බව සත්තයයි දත යුතු''

(බුද්ධ බණ ප්‍රත්‍යක්ෂය)

## නුවර සමයේ අධ්‍යාපන තත්ත්වය

ශාසනික අතින් පමණක් නොව අධ්‍යාපනය අතින් ද මහනුවර යුගය අන්ධකාර අවදියක් සේ සැලකිය හැකි ය. පුරාණයේ සිට පැවත ආ අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස සලකනු ලැබූ පිරිවෙණ මේ කාලය වන විට අභාවයට ගොස් තිබිණ. ශාස්ත්‍ර දියුණුව සඳහා රටෙන් කිසිදු සැලකිල්ලක් නො ලැබීමත්, පොත් පත් විරලවීමත් වැනි හේතුන් නිසා එදා සමාජයේ අධ්‍යාපන, අධ්‍යයන කාර්යයන්හි යෙදුණෝ විරල වූහ.

පාලි භාෂාවේ මධ්‍යස්ථානයකැයි සලකනු ලැබූ ලක්දිව 17 වන සියවස වන විට අරකන් දේශයෙන් පැමිණි භික්ෂූන් වහන්සේ සමග කථාබහ කිරීමට තරම් පාලිභාෂාඥානයක් ඇතිව සිටියේ වටඹුලුවේ තෙරුන් පමණකි. සඟරජ හිමියන් බාලාවතාරයේ එක් කොටසක් ලෙව්කේ රාළගෙන් ද ඉතිරි කොටස පල්කුඹුරේ අත්ථදස්සි හිමියන් ගෙන් ද උගත් සැටි සංඝරාජ සාධුචරියාවේ විස්තර වෙයි. එකල රාජවාසලට පැමිණි බමුණකු කී,

විද්වානෙව විජානාති
විද්වජ්ජන පරිශ්‍රමම්
නහි වන්ධ්‍යා විජානාති
ගුර්වීං ප්‍රසව වේදනාම්

යන ලිහිල් සංස්කෘත ශ්ලෝකයේ අදහස පැහැදිලි කරදීමට තරම් උගත් කෙනෙකු රාජ සභාවේ පවා නොසිටීම ම එකල පැවැති ශාස්ත්‍රීය දියුණුවේ තත්ත්වය මැන ගැනීමට හොඳ ම සාධාකයකි.

**වීරවරයකු අවශ්‍යයි.**

ඉතා සැකෙවින් දක්වන ලද ඓතිහාසික පසුබිම් විස්තරය අනුව නෂ්ටප්‍රායව පැවැති ශාසනය යළි පිහිටුවා නිවී ගිය ශාස්ත්‍ර ප්‍රදීපය දල්වා ජාතියට නව ජීවයක් ලබාදීමේ ශක්තිය ඇති වීර පුරුෂයකු ඉතා ඉක්මණින් පහළ විය යුතු අවස්ථා මේ වන විට උදාවී තිබුණේ ය.

එදා දෙවන පෑතිස් මහරජු දවස මිහිඳු මහරහතන් වහන්සේ සිරිලක් දිවයිනට වැඩමකොට පිහිටුවා වදාළ සම්බුද්ධ ශාසනය සිංහල ජාතියේ ප්‍රාණනාලිය, ජීවවායුව බවට පත්විය. ඒ ශ්‍රේෂ්ඨ ධර්ම මාර්ගය ඔස්සේ ස්වකීය ජීවිත හැඩගසා ගත් සිංහල බෞද්ධයා හැම විට ම ක්‍රියා කළේ ශාසනයේ ආරක්‍ෂකයන් හැටියට යි. සසුනට විපතක් වූ හැම අවස්ථාවකම එය රැක ගැනීමට ඔව්හු ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළහ. ගත ව වසර දෙදහසකටත් අධික කාලය තිස්සේ ධර්මශාස්ත්‍ර දෙක්හි අන්ත පරිහානිය ඇති ව සෑම අවස්ථාවක ම එයට පුනර්ජීවය දීම සඳහා භාග්‍ය සම්පන්න වීරවරයන්ගේ පහළ වීම සිරිතක් විය.

**දිඹුලාගල මහා කාශ්‍යප මාහිමි, අනවමදර්ශි සංඝරාජ හිමි, තොටගමුවේ සිරි රහල් මාහිමි** වැනි උතුමෝ ද **දුටුගැමුණු වළගම්බා, ගජබා, සිරිසඟබෝ, ධාතුසේන, මහවිජයබා, මහ පැරකුම්බා, දෙවන පැරකුම්බා, සිරි පැරකුම්බා** වැනි නරවීරයෝ ද ශාසනෝන්නතියත් ධර්මශාස්ත්‍රෝද්දීප්තියත් උදෙසා වරින්වර ලක්බිමෙහි පහළ වූහ.

එසේ වුවත් සොළොස්වන සියවස ආරම්භයේ ලංකාවතරණය කළ පෘතුගීසීන් ගෙන් ද ඉන්පසු පැමිණි ලන්දේශීන් ගෙන් ද බුදු සස්නට වැදුණු පහර ඉවැසිය නොහැකි තරම් දරුණු වී ය. බුදු සසුනත් ධර්මශාස්ත්‍රයත් සමූලඝාතනය කරලීම සඳහා ඔවුන් යෙදූ උපක්‍රමත් දරුණු තැතත් දෙස විමැසිල්ලෙන් බලන විට බුදුසසුනට පුනර්ජීවයක් දිය හැකි සමතෙක් පහළ වේ දෝයි සිතිය නොහැකි තරම් විය.

# සංඝරාජ මාහිමි

## උපත හා කුල පරපුර

යම් කලෙක ධර්මය පිරිහීමට පත් ව අධර්මය දියුණු වුවහොත් ලොව ඒ තත්ත්වයෙන් මුදා ගැනීමටත් යහපත් මිනිසුන් රැකීමටත් අයහපත් අය නැති කරලීමටත් ධර්මය නිසිතැන තබාලීමටත් යුගයක් යුගයක් පාසා කෘෂ්ණ දෙවියන් ලොව පහළ වන්නේ යැ'යි "**භගවත් ගීතාවෙහ**[1]" එන සදුක්තිය සනාථ කරන්නාක් මෙන් සසුනට අනුග්‍රහයකුත් ජාතියට ආශිර්වාදයකුත් භාෂා ශාස්ත්‍රයට ආලෝකයකුත් උදාකරමින් සෙංකඩගල කඳුකරයෙන් පහළ වූ ආජානෙය පුරුෂයකු ව වැලිවිට **පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන** වහන්සේ භේද භින්නවී ගිය ජාතියක් එක ම සංස්කෘතික පදනමක් ඔස්සේ හැඩ ගැස්වීමෙහි ලා අසහාය බලවේගය වී ය.

ක්‍රිස්තු වර්ෂ 1698 ජුනි මස 19 වැනි රිවිදින කන්ද උඩරට තුන්පනේ වැලිවිට නම් ග්‍රාමවරයෙහි කුලතුංග නම් කීර්තිමත් කුලපරපුරෙහි සරණංකර මාහිමියන් ගේ උපත සිදු විය. කුලතුංග පරපුර වනාහි රදල කුලයක් වූ අතර එහි ආදි පුරුෂයා වෙල්ලස්ස දිසාව කර වූ ප්‍රභුවරයෙක් වී ය. එවකට සිංහල රාජ්‍යයෙහි වැදගත් තනතුරක් වූ දිසාපති පදවියක් කුලතුංග පරපුරට හිමි වී තිබුණි. වෙල්ලස්ස දිසාව හා තුන්පනේ රට ඔවුන්ගේ පාලනය යටතෙහි පැවැතිණ.

1. යදා යදා හි ධර්මස්‍ය - ග්ලානිර්භවති භාරත
අභ්‍යුත්ථාන ම ධර්මස්‍ය - තදාත්මානං සෘජාම්‍යහම්
පරිත්‍රාණාය සාධූනාං - විනාශාය ච දුෂ්කෘතාම්
ධර්ම සංස්ථාපනාර්ථාය - සංභවාමි යුගෙ යුගෙ
(4 අධ්‍යාය 7,8)

'' වෙල්ලස්සේ දිසාව සහ තුන්පනේ රට කරවූ කුලතුංග මුදලි පරම්පරානුගත ව එන ස්වකීය බන්ධු වර්ගයාගෙන් ගැවසීගත් වැලිවිට යන ලෝක ප්‍රසිද්ධ ග්‍රාමයෙහි............'' සරණංකර හිමියන් ගේ වැඩිමහලු සොහොයුරා පටබැඳි මුදියන්සේ කෙනෙකු බව සාධුචරියාව වැඩිදුරටත් සඳහන් කරයි. ''කුලතුංග බණ්ඩාර'' යන ගිහි නමින් හැඳින්වුණු මේ කුල කුමරුවා කුඩා අවදියෙහි සිය සොහොයුරු පටබැඳි මුදියන්සේ සමඟ රජගෙදර විසූ බවත් රජු ගේ පුත්‍රස්ථානයෙහි වැඩුණු බවත් කියැවේ. කුඩාවියෙහි සිට ම පැවැත්මෙන් හා හැසිරීමෙන් අසාමාන්‍ය ගති ලක්ෂණ පෑ හෙයින් මේ කුමරුවන් ගේ උත්පත්තිය සැබවින් ම ආශ්චර්යජනක වීය.

දෙව් බඹ කෙනෙක් දෝ
නා ලොවින් ආවෙක් දෝ
බෝසත් කෙනෙක් දෝ
නො දත්තෙමු අපි කෙබන්දෙක් දෝ
(සඟරජවත)

**අකුරු ඉගෙනීම**

එරමුදුලියද්දේ උපාසකරාළ වෙතින් අක්ෂර ශාස්ත්‍රය හදාළ කුලතුංග වයසින් වැඩෙත් ම, ගුණෙන් නුවණින් මෝරායත් ම පැවිද්ද කෙරෙහි ඉමහත් ලැදියාවක් දක්වී ය. තම පුතණුවන් රාජසේවකයකු වනු දැක්ම දෙමාපියන් ගේ අභිලාෂය වුවත් කුලතුංගයන් ගමන් ගත්තේ ඊට ඉඳුරා ම වෙනස් වූ මඟක ය.

ලෞකික සැප සම්පත් කෙරෙහි දක්වූ අකැමැත්තත් තෙරුවන් විෂයයෙහි පැවැති ශ්‍රද්ධා භක්තියත් පැවිද්ද කෙරෙහි පැවැති දැඩිතර ඇල්මත් නිසා හේ නිති පන්සිල් රැක්කේ ය. පොහොය අටසිල් සමාදන් විය. පුණ්‍ය කටයුතුවල වැඩියෙන් යෙදුණේ ය. මේ නිසා දෙමාපියන්ගේ අදහස ඉටු නොවන බව පෙනී ගියේ ය. මෙසේ සොළොස් වියට පත්වත් ම පැවිදිවීම සඳහා දෙමාපියන්ගේ අනුමැතිය ලබා ගැනීමට කුලතුංගයෝ සමත් වූහ.

## පැවිදි වීම

ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමයෙහි සොළොස් හැවිරිදි වයස් වූ කුලතුංග කුමරුවා සූරියගොඩ පන්සලේ **සූරියගොඩ සාමණේරයන** ගේ ආචාර්යත්වයෙන් ප්‍රව්‍රජ්‍යාව ලබා ගත්තේ ය. මෙකී සූරියගොඩ සාමණේරයන් වූකලී දෙවන විමලධර්මසූර්ය රජු දවස රක්ඛංග දේශයෙන් මෙහි වැඩි **''සන්තාන''** නම් බුරුම ජාතික මහතෙරුන් ගේ ප්‍රධානත්වයෙන් පැවැති උපසම්පදා වාරයෙහි දී උපසම්පත්තිය ලත් තෙතිස් දෙනා වහන්සේ අතරින් එක් නමකි. පසු කලෙක සාමණේර බවට පත් සූරියගොඩ හිමි එකල සිටි දුෂ්ප්‍රතිපන්නයන් අතර සුප්‍රතිපන්නයකු ලෙසින් ද, නූගතුන් අතර උගතකු ලෙසින් ද වැඩ සිටියේ ය.

ක්‍රි. ව. 1714 දී මෙසේ පැවිද්ද ලැබූ හෙරණපාණන්ට **වැලිවිට සරණංකර** යන නාමය තබන ලදී.

සරණංකර සාමණේරයන් වහන්සේ නැතිවී ගිය උපසම්පදාව යළි ඇති කොට ලජ්ජි සුපේශල ශික්ෂාකාමී භික්ෂු පිරිසක් තැනීමේ උදාර අධ්‍යාශයෙන් යුතු වූ සේක් ඒ සඳහා පළමු කොට තමන් නිසි පිළිවෙතෙහි පිහිටා තෙවළා බුදු වදන් හදාළ උගතකු විය යුතු බව තීරණය කර ගත්හ.

## පිඬු සිඟා යෑම

එකල විසූ භික්ෂු නාමධාරීහු සසුන් පිළිවෙත් කිසිවක් නො දත්තාහ. පිණ්ඩපාතේ යෑම, පාත්‍රයෙන් දන් වැළඳීම, අභාවයට ගොස් පැවැතිණ. මේ කාලයේ පාත්‍රය අතින් ගෙන පිඬු සිඟා ගිය භික්ෂු නමකට බත් හැන්දකුදු නො ලද හැකි විය.

සරණංකර හෙරණපාණෝ සසුන් පිළිවෙත අනුගමනය කරමින් පිඬු සිඟා වැඩියහ. පාත්‍රයෙන් දන් වැළඳූහ. සාධුචරියාවෙහි සඳහන් පරිදි, ''එතැන් පටන් ගෙ පිළිවෙළින් පිඬු සිඟීම, පාත්‍රවලින් වැළඳීම ආදී කලක් නැතිව තිබුණු ශාසන පිළිවෙත් ඒ සාමිදරුවෝ දිවිපුදා ඉපිදවූවා හ.'' **පිණ්ඩපාතික** යන ශාසනික ගෞරව නාමය උන් වහන්සේට අන්වර්ථ වූයේ මේ නිසා ය.

## හුදෙකලා වීම

හිස මුඩු කොට කහවත් පොරොවා අඹුදරුවන් රකිමින්, වතුපිටි වවමින්, වෙදකම් යකැදුරුකම් නැකැත් කීම් ආදී අශ්‍රාමණික අශාසනික පහත් ජීවිත ගත කරමින් කල් ගෙවූ සාමණේර ගණින්නාන්සේ කෙරෙහි පිළිකුලෙන් බැලූ මුන් වහන්සේ ඔවුන් ගේ ඇසුරෙන් වෙන්ව හුදෙකලා වූහ. ඒ බව **මුංකොටුවේරාළ** මෙසේ දක්වයි :

''තපසට නුසුදු සූ
දේ කරති සෙසු තප සූ
උන් හා නොව මු සූ
තමන් එක සර කෙසර සෙ වි සූ

යකුන් එළ වන් නේ
වෙදකම් නැකැත් දන් නේ
නෑයන් රකින් නේ
පලක් නැත මට මුන් සෙවින් නේ''
(සඟ රජවත)

මේ අතර නොයෙක් තැනින් සපයා ගත් සිංහල, පාලි, සංස්කෘත පොත පත කියවමින් ස්වෝත්සාහයෙන් යම්තම් දැනුමක් ඇති කර ගත්ත ද, එය ප්‍රමාණවත් නො වන බව වටහා

ගත් හෙරණපාණෝ ත්‍රිපිටක ධර්මය පිළිබඳ නිවැරදි දැනුමක් ලබා ගැනීමට පාලි භාෂාව හැදෑරීම අත්‍යවශ්‍ය බව තේරුම් ගත්හ.

## ගුරුන් සොයා යාම

ඒ සඳහා ගුරුවරයෙකු සොයන වැලිවිට හෙරණ පාණන්ට **ලෙව්කේ රාළහාමි** ගැන දැන ගන්නට ලැබිණ. විහාරේ රාළහාමි නමිනුදු හැඳින්වුණු හේ බාලාවතාරය නම් පාලි ව්‍යාකරණ පොතේ නාම කාණ්ඩය තෙක් උගතෙකි. මේ අවස්ථාව වන විට ලෙව්කේ රාළහාමි කිසියම් වරදක් නිසා රාජ උදහසින් මහ කෙහෙල්වල ගමේ සිරකරුවකු වශයෙන් රඳවා සිටියේ ය. ශාස්ත්‍ර පිපාසයෙන් පීඩිත ව සිටි සරණංකර හෙරණපාණෝ ඔහු සොයා මහ කෙහෙල්වලට වැඩ ඒ අසල අලගල්ලේ කන්දේ ගල් ගෙයක නතර වී සිටියහ.

## ඉගෙනුමට දැක්වූ ඇල්ම

ලෙව්කේ රාළහාමි අලගල්ල අසල පුරාණ බෝධි රාජයාණන් වඳිනු පිණිස දිනපතා එහි එන සිරිතක් විය. වැලිවිට හෙරණපාණන් එතැන දී රාළහාමි දැන හැඳින ගෙන පළමු ව සතිපට්ඨාන සූත්‍රය ඉගෙන එය පිරිවහා භාවනා කොට එහි පින් ගුරු පඬුරු වශයෙන් පුදා ඔහු සිත් දිනා බාලාවතාරයේ නාමකාණ්ඩය අවසනට ඔහුගෙන් උගත් හ.

උන්වහන්සේ තුළ පැවැති ශාස්ත්‍ර පිපාසයත් එය සංසිඳුවා ගැනුම් වස් මොනතරම් දුක් ගැහැට වින්දේ ද යනුත් පහත දැක්වෙන විස්තරයෙන් හෙළිවේ.

''ඒ මහ කෙහෙල්වල ගමට සමීපව තිබෙන අලගල්ල කන්දේ අඹගස්මුල ගල්ලෙනෙහි පැංචකු සමඟ අප්‍රසිද්ධ ලෙසින් පොරොත්තුව සිට ගෙන ඒ ප්‍රස්තාවට පිණ්ඩපාත කිරීම නැතත් පාත්‍රයෙන් ම වළඳන නිසා තමන්වහන්සේට යැපෙන පමණට ඒ ගම්වැසි සැදැහැතියන් විසින් පාත්‍රයෙන් ගෙන වුත් දෙන භෝජනය ළඟ සිටින පැංචාට මදින් මද වත් දෙවේලට ම දෙමින් ඇතැම් විටක අමුතු පැමිණි සිල්වත් නමකටත් එයින් මැ දෙමින්, ඇතැම් විටක අවශිෂ්ටය දියවත්කොට තලුතැටියෙන් කැඳ වශයෙන් වත් වළඳා මෙසේ ජීවත් වෙමින්....''

(සාධු චරියාව)

මෙකල මෙන් අධ්‍යාපන පහසුකම් නො තිබුණු එකල ගුරුමුඛයෙන් අසා දැන උගත් දේ වැල්ලේ ලියා පාඩම් කළ සාමණේරයන් වහන්සේ තමා උගත් සියලු දේ සිටිනාමළුවේ සිල්වත් නමට ද කියා දුන්හ. මෙසේ ලෙව්කේ රාළහාමිගෙන් නාම කාණ්ඩය හදාළ පසු ඉතිරි කොටස ඉගෙනීම සඳහා පෝයමළු විහාරයේ විසූ **පල්කුඹුරේ අත්ථදස්සි තෙරණුන්** වෙත ගියහ. අත්ථදස්සි සාමණේරයෝ වටඹුලුවේ මහ තෙරුන්ගේ ශිෂ්‍යයෙකි. පාලිභාෂාව පිළිබඳ දැනීමක් ඇතිව සිටි වටඹුලුවේ තෙරුන්ගේ ශිෂ්‍යයෙකු වූ අත්ථදස්සි හෙරණුන් දෑ බාලාවතාරයේ ඉතිරි කොටස සරණංකර සාමණේරයනට ඉගැන්වූහ.

වැලිවිට සරණංකර හෙරණපාණන්ට මුල් අවදියේ සිට ඇසුරට ලැබුණු සිල්වත්තු තිදෙනෙක් වූහ. ඔව්හු නම්, **සිටිනාමළුවේ, ඉලිපැන්ගමුවේ හා කදිරාගොඩ** යන තිදෙනා ය. තමන් වහන්සේ දැන උගත් දෙය මේ සිල්වතුන් තිදෙනාට ද නොමසුරු ව කියා දීම සරණංකර හෙරණපාණන් ගේ සිරිත විය.

## වැලිවිට සමාගම

නොබෝ කලකින් සරණංකර හෙරණපාණන් ගේ කීර්තිය ද සිල් සුවඳ ද නොයෙක් ප්‍රදේශවල පැතිරී යන්නට වීය. විශේෂයෙන් උන්වහන්සේ ගේ ශාසනානුලෝමික ප්‍රතිපදාවත් සිල්වත් ජීවිතයත් බෞද්ධයන්ගේ සිත් ගත්තේ ය. බොහෝ කුල දරුවෝ ගිහි ගෙය හැර පියා උන් වහන්සේ වෙත අවුත් පැවිදිබව ලබා වත් පිළිවෙත් පුරන්නට වූහ. මෙසේ වැලිවිට හෙරණපාණන් ඇසුරෙහි සිල් රකින, වත් පිළිවෙත් පුරන පිරිස **සිල්වත් සමාගම, සිල්වත් තැන** යන නමින් හඳුන්වනු ලැබූහ. අස්ගිරි පෝයමළු විහාර දෙකේ සාමණේරවරුන්ගෙන් පැවිද්ද නොලැබූ නිසා ඔව්හු ඒ සිල්වත් පිරිසට නොයෙක් ලෙසින් නින්දා පරිභව කළහ. ''**වැලිවිට උන්නාන්සේගෙ සමාගම**'' යන නාමය පටබඳිමින් අවඥාවට ද පත් කළහ.

අලුත්නුවර, අහුගොඩ, ඊසිපිටියේ, කප්පාගොඩ, කුඹුල්දිවෙල, දාහිංගමුව, නාගොල්ල, පහත්කුඹුර, මැදවෙල, මාලගම්මන, වැවගෙදර යන නම්වලින් හැඳින්වුණු සාමණේරවරු සිල්වත් සමාගමේ විශේෂ ප්‍රසිද්ධියට පත් අය වෙති.

## පිටුවහල් කිරීම

විහාර දෙකේ දුසිල් මහණුන් ගෙන් ලැබුණු මෙවැනි නින්දාසහගත අවමානයක් ගැන තැකීමක් නොකළ වැලිවිට සමාගමේ සිල්වත්තු ගිහියන්ට හෝඩිය ඇණවුම්, සකස්කඩ ආදී පොත් ද පැවිද්දනට සෙඛියා, දිනචරියා ආදිය ද උගන්වමින් අධ්‍යාපන කටයුතු ද ආරම්භ කළහ. සිල්වත් සමාගම කෙරෙහි ජනප්‍රසාදය වැඩිවන විට රාජප්‍රසාදය දිනා සිටි උභය විහාරීය සාමණේර වරුන්ගේ විරෝධය ද වැඩී ගියේ ය. ඔවුහු වීරපරාක්‍රම රජු වෙත ගොස් සිල්වත් සමාගමට විරුද්ධ ව ගතු කීහ. ධර්මා'ධර්ම

විනිශ්චයෙහි අපොහොසත් වූ රජ විහාර දෙකේ සාමණේර වරුන් ද ගණනායක වරුන් ද සරණංකර හෙරණපාණන් ඇතුළු සිල්වත් සමාගමේ අය ද හඟුරන්කෙත මඟුල් මඩුවට කැඳවනු ලැබූහ. ඉක්බිති රජ තෙමේ සිල්වත් අය විහාර දෙකේ සාමණේරයන්ට නොවඳින්නේ මන්දැයි විමසා ඔවුනට වඳින ලෙසත් සමාගමේ අය හැඳින ගැනීම සඳහා කෙස් කැපූ හිස වටා සුදුරෙදි කඩක් බඳින ලෙසටත් නියම කෙළේ ය. එතෙකින් නොනැවතුණු රජ සරණංකර හෙරණපාණන් ඇතුළු සිල්වත් සමාගමේ පිරිස ලග්ගලට පිටුවහල් කර හැරියේ ය. මින්පසු හෙරණපාණෝ සිය පිරිසත් සමග පිටිසරට වී කාලය ගත කළහ.

## රාජ ප්‍රසාදය ලැබීම

මේ කාලයෙහි කහවත් හැඳගත් බමුණෙක් අනුරාධපුරය හරහා මහනුවරට පැමිණියේ ය. බහුශ්‍රැතයකු ලෙස පෙනී සිටි ඔහු හා කථා බස් කළ හැකි කෙනෙකු සොයා ගත නොහැකි වූයෙන් රජ තෙමේ විහාර දෙකේ සාමණේරයන්ට පණිවුඩ යවා බමුණාට අවබෝධ වන සේ බණක් කියන ලෙස දැන්වී ය. නායක සාමණේරවරු රජු ගේ නියමය පරිදි එහි ගොස් කිසිත් කියා ගත නොහැකි ව බියපත් ව විජිනිපතින් මුව වසා සිටියහ. මේ අතර වැලිවිට සාමණේරයන්ට මෙය කළ හැකි බැව් පලීපාන මොහොට්ටාල ගෙන් දැන ගන්නට ලැබී වහා පණිවුඩ කරුවකු යවා සරණංකර හෙරණපාණන් කැඳවා ගෙන ආහ. හෙරණපාණෝ රජු ඉදිරියෙහි ව්‍යක්ත ලෙස සිංහල පාලි සංස්කෘත යන තුන් බසින් ම ධර්ම දේශනා පැවැත්වූහ. එය අසා විස්මිත වූ බමුණු සන්නාසියා දොහොත් මුදුනේ තබා වැඳ සාමණේරයනට ගෞරව කළ අතර රජතුමා ද අධික ප්‍රීතියට පත්විය.

ඉන්පසු විහාර දෙකේ සාමණේරවරුන් වැලිවිට හෙරණපාණන්ට දොස් කියන්නේ ඊර්ෂ්‍යා පරවශ ව බව වටහා

ගත් රජතුමා සරණංකර හෙරණපාණන් කෙරෙහි අතිමාත්‍ර ගෞරවයක් හා භක්තියක් ද ඇත්තෙක් වී ය. මේ සිදුවීම සරණංකර හෙරණපාණන් ගේ කීර්තිය වඩාත් පැතිර යාමට හේතු වූ අතර, නරේන්ද්‍රසිංහ රජු සාමණේරයන් වහන්සේ කෙරෙහි පැවැත් වූ ගෞරව හා භක්තිය දිවි හිමි කොට නොවෙනස්ව පැවැතීමටත් හේතු වූ බව ද කියැවේ.

## පොත් ලිවීමට ආරාධනා කිරීම

මෙසේ සරණංකර හෙරණපාණන් කෙරෙහි අතිශයින් පැහැදුණු නරේන්ද්‍රසිංහ රජතුමා උන්වහන්සේ ගේ ධර්ම ශාස්ත්‍රඥානයෙන් ප්‍රයෝජන ගැනීමට සිතා පොත් ලියන ලෙස ආරාධනා කෙළේ ය. ඒ අනුව ''**බුද්ධො**'' යන පදය මාතෘකා කර ගෙන ''**සාරාර්ථ සංග්‍රහ**'' නමින් ප්‍රකට බුදු ගුණ ඇතුළත් අගනා ධර්මග්‍රන්ථය ලියන ලද්දේ මහනුවර පෝයමළු විහාරයේ වැඩ වසමිනි.

සාර අත් සඟර ය<br>
කියා මෙනමින් පවර ය<br>
මතු කලක් මෙ පුර ය<br>
කළා පවතින ලෙසට නිතර ය<br>
(සඟරජවත)

විසුද්ධිය මග්ග - බුද්ධවංස - බෝධිවංශ - ජාතක ධම්මපද - මිලින්දපඤ්හ ආදී පෙළ පොත් ද ධර්මප්‍රදීපිකා - රත්නාවලී - ථූපවංස - පූජාවලී ආදී සිංහල පොත් ද පරිශීලනය කරමින් රචිත මේ ග්‍රන්ථයන් සරණංකර සාමණේරයන් වහන්සේ ගේ ත්‍රිපිටක ධර්මඥානයත් සමයාන්තර ඥානයත් මැනවින් විශද වේ. විසි වැනි වියෙහි දී ලියනු ලැබූ මේ විශාල ධර්මග්‍රන්ථය නිසා උන්වහන්සේ මහා පඬිවරයකු ලෙස රජු ඇතුළු රටවැසියා විසින් ගරු කරනු ලැබූහ.

අනතුරු ව නරේන්ද්‍රසිංහ රජුට ලැබී තිබුණු **භෙසජ්ජ මංජුසා** නම් පාලි වෛද්‍ය ග්‍රන්ථයට සිංහල සන්නයක් ලියා දෙන සේ කරනු ලැබූ ආරාධනය අනුව සිය සිසුන් ගේ ද ආධාරය ඇති ව මහත් පරිශ්‍රමයකින් සිංහලට නඟා භාරදුන් පසු අතිශය ප්‍රීතියට පත් රජතෙමේ සාමණේරයනට ඇතකු තෑගි කෙළේ ය. එහෙත් එය පිළිගැනීමට උන්වහන්සේ අකැමති වූ හ. ඉන් පසු ලැබුණු කුණම ද මොරාගම්මන මොහොට්ටාලට භාර දුන්හ.

ඉන් පසු සතර **බණවර සන්නය, අභිසම්බෝධි අලංකාරය, මුනිගුණ අලංකාරය හා රූපමාලා** යන වටිනා ග්‍රන්ථ රචනා කළහ. මුල දී සරණංකර සාමණේරයන් ගේ සිල්වත් සමාගමට රජු ගේ විරෝධය ඇති වුව ද කල්යත් ම උන්වහන්සේ ගේ සිල්වත් බව හා උගත්කම නිසා රාජානුග්‍රහය නො අඩුව ලැබෙන්නට වීය. උඩුනුවර ඇම්බැක්කේ දේවාලයට නුදුරුව නියමකන්ද නම් කඳුකර පෙදෙසෙහි තනවන ලද අංග සම්පූර්ණ ආරාමය සරණංකර සාමණේරයන්ට රජතුමන් විසින් පූජා කරන ලද්දේ මින් පසු ව ය.

සරණංකර සාමණේරයන් ගේ මූලිකත්වයෙන් නියමකන්දේ ආරාමයෙහි ආරම්භ කළ විද්‍යාස්ථානය නූතන ධර්මශාස්ත්‍රෝන්නතියේ මූලස්ථානය ලෙස සැලකිය හැකි ය. මෙහි නේවාසික ව ඉගෙනුම ලැබූ ශිෂ්‍යයන්ගේ නඩත්තුව සඳහා රාජනියෝගයෙන් ගම්පොළ රාජකීය වී අටුවෙන් මසකට හාල් තුන් දහසක් ද, තුන්පතයෙන් පොල් තුන් සියයක් ද, මහ ගබඩාවෙන් ලුණු ඇඹුල් ආදිය ද නො අඩු ව සපයන ලදී. සරණංකර හෙරණපාණෝ ද එතුමන් ගේ ව්‍යක්ත ශිෂ්‍යයෙකු වූ **ගිනිගත්පිටියේ සංඝරක්ඛිත** සාමණේරයෝ ද මෙහි ඉගැන්වීම කළහ. අක්ෂරෝච්චාරණය, පාලිව්‍යාකරණය, සාහිත්‍යය, සිංහල

භාෂාව, සූත්‍රධර්ම, සාමණේර ශික්ෂා මෙහි මූලික විෂය විය. පාලිභාෂාවෙන් කථා කිරීම, ලේඛන ලියැවීම, පාලි සිංහල රචනා ආදිය ද මෙහි ප්‍රගුණ කරවන ලදී. මෙහි උගත් ශිෂ්‍යයෝ පසු කාලයෙහි විවිධ ධර්ම ශාස්ත්‍රීය දියුණුව සඳහා ක්‍රියා කළ ව්‍යක්ත බහුශ්‍රැත පඬිවරු වූහ.

## අධ්‍යාපන දියුණුව ඇති කිරීම

නිවීයමින් තිබුණු ශාස්ත්‍ර ප්‍රදීපය දල්වා ධර්මශාස්ත්‍රාලෝකයෙන් දිවයින ආලෝකවත් කරලීම සඳහා උන් වහන්සේ දැරූ පරිශ්‍රමය ද විස්මය ජනක ය.

''අකුරු නො කී ළදරු වයස් ඇති අයට හෝඩිය පටන් ද සිල්වාරම් අකුරු දන්නා අයට ඇණවුම් සකස්කඩ පටන් ද සමහර අයට ශතක පොත් පටන් ද කීම් ලීම් උගන්වමින්....''
(සංස. සාධු චරියාව)

එමෙන් ම පැරණි පුස්කොළ පොත් සොයාගෙන ඒවා ශෝධනය කිරීමෙන් ද, අභිනව ග්‍රන්ථ නිෂ්පාදනය කිරීමෙන් ද භාෂා ශාස්ත්‍ර දියුණුවට මෙතුමෝ උපස්තම්භක වූහ.

''තවද, රෑ දවල් දෙක්හි අප්‍රමාද ව ලීම් කීම් බණදහම් බොහෝ ශිෂ්‍ය ගණයාට පුහුණු කරවීමෙන් අභිනව ගාථා අෂ්ටකාදී ප්‍රබන්ධ කිරීමට ද සමර්ථ කරවමින් තමන් වහන්සේ විසිනුදු මුනිගුණ අලංකාරාදී ධර්ම ප්‍රකරණ ඉපද වීමෙනුදු ශාසනාභිවෘද්ධියෙහිම යෙදී කාලාතික්‍රමණය කළාහු යැ'' යි සාධුචරියාවෙහි දැක්වුණේ එහෙයිනි.

## පිළිවෙත් රැකීමට මුල් තැන

වැලිවිට හෙරණපාණෝ ස්වකීය ශිෂ්‍ය ගණයාට ධර්මශාස්ත්‍රඥානය ලබා දුන්නාහු පමණක් නොව, ඔවුන්ගේ ප්‍රතිපත්ති වර්ධනය සඳහා ද බෙහෙවින් උත්සුක වූහ. මෙයින් උන් වහන්සේ අපේක්ෂා කළේ පාපයෙන් මිදුණු, සංවරයෙහි පිහිටි ආචාර ශීලයෙන් යුක්ත සුපේශල ශික්ෂාකාමී භික්ෂු පිරිසක් බිහිකර ලීමට ය. ඒ නිසා අවවාදයෙන් අනුශාසනයෙන් හා නිග්‍රහයෙන් ද ස්වකීය ශිෂ්‍ය ගණයා හික්මවීමට උන්වහන්සේ හැම විට ම වග බලා ගත් හ.

වැලිවිට සාමණේරයන් විසින් සිල්වත් පිරිස අතර බෙදා දුන්, ''අනුශාසනා වට්ටෝරුව'' කියවා බැලීමෙන් ප්‍රතිපත්ති ශාසනය දියුණු කර ලීමෙහි ලා උන් වහන්සේ තුළ පැවැති උදාර ශාසනික හැඟීම කොතරම් ද යනු වටහා ගත හැකි ය.

## අනුශාසනා වට්ටෝරුව

''සුවිසුද්ධ කරුණාදි ගුණ සම්පන්න ශ්‍රී ඝන සාසන ප්‍රතිග්‍රහණකාමී වූ ප්‍රව්‍රජ්‍යාවට පැමිණි මාගේ ශිෂ්‍ය පුත්‍ර වූ සියලු සඟ සිල්වත් තැන්වලට අවවාද අනුසාසනා වශයෙන් එවූ වට්ටෝරුවෙහි වග නම්:

දුල්ලභඤ්ච මනුස්සත්තං
බුද්ධුප්පාදෝ ච දුල්ලභෝ
දුල්ලභා ඛණ සම්පත්ති
සද්ධම්මෝ පරම දුල්ලභෝ

සුදුල්ලභං ලභිත්වාන
පබ්බජ්ජං ජිනසාසනෙ
සීලාදි සංගහං ඛේමං
උජුමග්ගං විසුද්ධියා

යනාදීන් වදාළ ප්‍රව්‍රජ්‍යා කෙළවර කොට ඇති සතරපස් ධර්මයන් ගේ සාර්ථකය පිණිස අප විසින් අලගල්ලේ කියන පර්වතාශ්‍රයෙහි අරණ්‍යගතව ලෝභ, ද්වේශ, මෝහ, මදමාන මාත්සර්යාදි අකුශල ධර්මයන් මේ මේ ක්‍රමයෙන් මැඩ පවත්වම්හ'යි යම් සම්මතයක් ධර්මාන්විත ව සම්මත කරන ලද ද, එයින් ගිලන් මහලු ළදරු බොහෝ ශිෂ්‍ය වර්ගයා විසින් පිරිවරන ලද බැවින් ද රාජරාජ මහාමාත්‍ය උපාසකාදීන්ට ඓහලෞකික පාරලෞකිකාභිවෘද්ධිවර්ධනය කොට දීමෙහි නොයෙක් ලෙසින් උත්සාහ කරන බැවින් ද නිත්‍යයෙන් ඇතැම් ධර්ම කෙනෙකුන් ගේ පූරණයට අවකාශ නොලැබෙන්නේ වී නමුත් ශ්‍රද්ධාවෙන් යුක්තව බොහෝ පින් රැස් කෙරෙමි. සංසාර දෝෂයෙන් හෝ ක්ලේශ දෝෂයකින් වූ වද්‍යයන් ධර්මානුකූලව හැරියෙමි. තොප විසිනුදු අප්‍රමාද විය යුත්තේ ය. ඒ කෙසේද යත්:

පොහොයෙන් පොහොයෙහි කළ නොකළ වරද විචාරීම ය. විචාළ දෑ නොසඟවා කීම ය, වරදක් කළ විටක සමීපයෙහි සිටි යම් කෙනෙකුන්ට දන්වා ධර්මාන්විතව දඬුවම් විඳීම ය. ඔවුනොවුන් ගේ වරදක් දැක නින්දා පිණිස හාස්‍ය පිණිස නො කියා, අසම්මුඛයෙහි නින්දා පිණිස නො කියා නින්දා කොට කියතුදු මෛත්‍රී කරුණා පූර්වංගම වූ කල්‍යාණාධ්‍යාශයෙන් ධර්මාන්විත කොට අවවාද ලබන්නන් විසින් කවර ප්‍රකාරයෙන් කළ අවාදයෙක්හි දු නො කිපී භක්ති ප්‍රේමයෙන් පිළිගත යුත්තේ ය. දෙදෙනෙකු ඔවුනොවුන් කෙසේ භේදයට නිසි පෛශූන්‍ය වචනයක් නො කිය යුත්තේ ය. යටත් පිරිසෙයින් අභියුක්ත ශිෂ්‍යාදී කිසිවක් හට ජාතිශ්‍රොත්‍රාදීන් සටා නොබිණිය යුත්තේ ය. කලහ විග්‍රහ වඩනා කායවාක් ක්‍රියාවක් නො කොට යුත්තේ ය. යෞවන මදාදීන් මත් ව කෙළිසිනා ආදියෙන් දවස් නො යැවිය යුත්තේ ය. මඳ දෙයකිනිදු උපකාරවූවන් සිහිකට යුත්තේ

ය. සතතයෙන් අවකාශ නැතත් පොහෝ දවස් නොවරදවා ඒ ඒ පන්සලේ විසූ පමණ හැම දෙනා එකතුව සසර කළකිරීමට ශ්‍රද්ධාව වැඩීමට නිසි ධර්ම සාකච්ඡා කට යුත්තේ ය. දිනචරියා, සෙඛියා ආදී ධර්මයන් ද පෙරසේ ම භාවිතා කට යුත්තේ ය. වත් පිරිත් කීමෙහි උගන්නා ධර්මයෙහි තුනුරුවන් වැඳීම් පිදීම් ආදියෙහි අප්‍රමාද විය යුත්තේ ය. තමා පිණිස හෝ ඥාතීන් පිණිස හෝ රන් රිදී ආදී අකැප වස්තු නො පිළිගත යුත්තේ ය. ලදහොත් පින් පිණිස පරිත්‍යාග කට යුත්තේ ය. ගිහි ජනයන් ගේ ගෙවල්වල නොවිසිය යුත්තේ ය. තෘෂ්ණාදොෂ නො වැඩිය යුත්තේ ය. යනාදීන් යම් යම් සම්මතයක් පූර්වයෙහි කරන ලද්දේ වී නම්, ඒ සියල්ලෙන් ප්‍රමාද දෝෂයකින් බිඳීගිය යමක් ඇත්නම් එය ඇති ලෙස කියා ආයති සංවරයෙහි පිහිටා පාපයට අවකාශ නො තබා විසිය යුත්තේ ය. ඒ හැර සියල්ලට ඓහලෞකික පාරලෞකික සම්පත් සාදා දෙනු පිණිස ව්‍යායාම් කරන මාගේ පමණ නොදන නොකළකිරීම මා නිසා මෙලෝ පරලෝ දෙකටවූ වැඩ සැලසිය යුත්තේ ය. මවුපියන් කෙරෙහි පවා ඇතැම් දරු කෙනෙක් පමණ නො දන කළකිරෙති. මවුපියෝ සහනය කෙරෙති එමෙන් මම ද සියල්ලටම මා නිසා මෙලෝ පරලෝ දෙකෙන් වැඩක් මුත් අවැඩක් නො වන සේ මෛත්‍රී සිතින් ක්‍ෂමා කෙරෙමි. මේ ඇසූ විට ඔවුනොවුන් කෙරෙහි බිඳී සිටි කෙනෙක් ඇත් නම්, සතුටු කඳුලෙන් ප්‍රීති මුඛයෙන් අප පියාණන් කී ලෙසින් මෛත්‍රී කොට මෛත්‍රී බුදුන් දකුම්හයි හැම දෙන ම ක්‍ෂමා කට යුත්තේ ය.

මේ වට්ටෝරු පත්‍රය සෑම සිල්වත් තැන් ම ලියා තම තමන් ගේ අත තබාගෙන පොහොයෙන් පොහොයට බණ කියා කෙළවර මේ වට්ටෝරුව කියවා පූර්වයෙන් මා විසින් කළ අවවාද ධර්මානුකූලව තම තමන්ට වැටහෙන පමණ වචනයන් ද එක්කොට ගැනීමෙන් අප්‍රමාද වූවහොත් මා ගෙන්

මෙලොව පරලොව දෙකෙන්ම ලබන යහපත ට නිර්වාණපුර ප්‍රවේශ වීමට ද කාරණා වන්නේ ය.

ඒ වගත් මෙසේ ම,

මේ අවවාද අනුශාසනා වට්ටෝරුව ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් දෙසීය සැත්තෑ තුණට පැමිණි මේ වර්ෂයෙහි පොසොන් මස පුර දසවෙනි සිකුරාදා ලියා එවූයේ මදක් මෛත්‍රියෙහි අනුසස් සලකන වැලිවිට සරණංකර සාමි වම්හ''

නියම සසුන් පිළිවෙත අනුව භික්ෂු ජීවිතය සකස් විය යුතු අන්දම පිළිබඳ සරණංකර හෙරණපාණන්ගේ අවංකවූත් ඍජුවූත් ක්‍රියාමාර්ගය මේ අනුශාසනා වට්ටෝරුවෙන් පැහැදිලි වන අතර, අනාගත ශාසන භාරය දැරීමට සුදුසු ප්‍රතිපත්ති ගරුක භික්ෂු පිරිසක් තනාලීමේ උදාර පරමාර්ථය ද මැනවින් පිළිබිඹු වේ.

## නරේන්ද්‍රසිංහ රජුගේ හිතවත්කම

සරණංකර හෙරණපාණෝ මේ වන විට පන්තිස් විය ඉක්මවා ගුණ නුවණින් වැඩි සිටිය ද තවමත් අනුපසම්පන්නයහ. ''නැතිවී ගිය උපසම්පදාව යළි ඇති කොට බුදු සසුන් බබුළුවන්නෙමි'' යන මුල සිට පැවති උතුම් අදහස් සපුරා ගැනීම සඳහා නරේන්ද්‍රසිංහ රජුගෙන් උදව් බලාපොරොත්තු වුව ද එතුමා ගෙන් ඒ සඳහා කිසිදු පිටිවහලක් නොලැබෙන බව හෙරණපාණන්ට වැටහී ගියේ ය. රජුගේ අභිමතාර්ථයන් මුදුන් පත් කර ගැනීමට සරණංකර හෙරණපාණන් ඇසුරු කළ ද බුද්ධාගම නගා සිටුවීම සම්බන්ධයෙන් සැලකීමක් නො දැක්වූ බව පැහැදිලි ය. තමාගෙන් පසු රජකම පවරා දීමට සුදුසු කෙනෙකු නොසිටියෙන් සිය මෙහෙසිය ගේ සොහොයුරකු මදුරාපුරයෙන් මෙහි ගෙන්වා ධර්ම ශ්‍රාස්ත්‍රය ඉගැන්වීමට

සරණංකර හෙරණපාණන්ට භාර දුන්නේ ය. මන්දාරම් පුර පුවත නම් කාව්‍යයෙහි ඒ බව මෙසේ සඳහන් වේ,

රජසිරි ලැබිය යුතු දූ දරු නැති බැවි න
හෙරණිඳු සහ ඇමතියන් අදහස් ලෙසි න
මදුරාපුර පිරිසිඳු රජ කුලෙන් එ න
සිය මෙහෙසිය සොහොවුරු පින් ගුණ නැණි න

අතපත් වඩිග කුමරිඳු දකුණු අත ගෙ න
සරණංකර හෙරණිඳු අතෙහි තබ මි න
මෙ කුමරහට දහම් සිප් සතරද දෙමි න
සසුන ද රජය රක්වනු මැන මතු යෙහෙ න

## සිංහල රජ පෙළපත අවසන් වීම.

''නායක්කර් හාමුදුරුවෝ'' යන නමින් හැඳින්වුණු මේ කුමරා උන් වහන්සේ ගේ කීකරු ශිෂ්‍යයකු ලෙස අධ්‍යාපනය ලබා ගත්තේ ය. විජය රජුගෙන් ඇරඹුණු සිංහල රාජවංශය නිමාවට පත් කරමින් ක්‍රි. ව. 1739 දී නරේන්ද්‍රසිංහ රජු පරලෝ සැපත් වීමෙන් හිස් වූ සිහසුනට තෝරා ගනු ලැබුවෝ නායක්කර් හාමුදුරුවෝ ය. ඔහු ශ්‍රී විජයරාජසිංහ නමින් රජකමට පත් වූහ.

මෙසේ සිංහල රාජ්‍යයට කිසිදු අයිතියක් නැති ද්‍රවිඩ කුමාරයකුට රජකම් පැවරීම සරණංකර හෙරණපාණන් ගේ දුබල කමක් සේ සැලකිය හැකි වූවත් එසේ කරන්නට ඇත්තේ එමඟින් හෝ බුදුසසුන මෙහි පිහිටුවා තම අභිලාෂය මුදුන් පමුණුවා ගැනීමට විය හැකි ය. එසේ වුවත් මේ නිසා සිදුවූයේ ලංකා ඉතිහාසයේ බලවත් විපයර්‍යාසයකි. මින් පසු සිංහල රාජ්‍යයේ නොයෙකුත් අවුල්වලට මෙය හේතු වූ බව පෙනේ.

## "රාජගුරු" පදවිය පිරිනැමීම.

සිහසුනට පත් ශ්‍රී විජයරාජසිංහ රජු ගේ ප්‍රථම කාර්යය වූයේ ස්වකීය ගුරුවරයා වූ වැලිවිට සරණංකර හෙරණපාණන්ට "**රාජගුරු**" යන ගෞරව නාමය පිරිනමා උපහාර දක්වීම යි. හෙරණපාණෝ රජතුමා ගේ ආරාධනයෙන් **සාරාර්ථදීපනී** නම් පිරිත් සන්නය ද **මධුරාර්ථ ප්‍රකාශිත** නම් බෝධිවංශ සන්නය ද රචනා කළහ.

## සියමට දූතයන් යැවීම.

අනතුරුව මෙතෙක් ඉටු කර ගත නොහැකි ව පැවැති උපසම්පදාව පිහිටුවීමේ කාර්යය සම්පූර්ණ කර ගැනීමට හොඳ ම අවස්ථාව මෙය බව දත් සරණංකර හෙරණපාණෝ සිය අදහස රජතුමාට දන්වා සිටියහ. ඒ අනුව රජතුමා ගේ අනුග්‍රහයෙන් අරාගොඩ, ගණේගොඩ, ලිඳ පිටියේ, වටවන, හල්පේ යන සිල්වත් තැන් උපැවිදි කරවා ගිහි පිළි හඳවා දොරණෑගම මුහන්දිරම් රාළ හා මාතොට රාළ යන ඇමැතියන් දෙදෙනා ඇතුළු දූත පිරිසක් සමඟ සියමට යවනු ලැබූහ.

## යළිත් දූත පිරිසක් යැවීම

මුහුදින් ගිය මේ ගමනේ දී කුණාටුවකට අසුවීම නිසා නැව බිඳී ගිය අතර ඉතිරි වූ පණිවුඩ කරුවෙක් පීගු වෙරළට ගොස් එතැනින් ලංකාවට ආවේ ය. එසේ ආපසු ආ තැනැත්තා දොරණෑගම මුහන්දිරම් රාළ ය. ගමන අසාර්ථක වුව ද ඉන් අධෛර්යයට නො පැමිණි සරණංකර සාමණේරයෝ නැවතත්

රජුට කරුණු කියා උත්සාහවත් කර දෙවැනි ගමනක් ද පිළියෙළ කරවූහ. මේ වතාවේ වැල්ලාවේ, ගලතොඹුවේ, දෑලිවල, බෝතලේ, ඕගොඩපොල යන සිල්වත් තැන් ගිහි පිළි හන්දවා දොරණෑගම මුහන්දිරම් රාළත්, මීදෙණියේ මුහන්දිරම් රාළත්, විල්බාගෙදර රාළත් සමග සියම් දේශයට යවනු ලැබූහ.

මෙම දූත පිරිස ජාවා දූපතේ බෙතාවියට පැමිණි විට ලක් රජු අභාවප්‍රාප්ත වූ බව දැන ගන්නට ලැබුණි. දූත පිරිස ඕලන්ද නැව්වලින් ගමන් කළ නිසා අලුතින් සිහසුනට පත් ලක්දිව රජුගේ අදහස නො දැන සියමින් භික්ෂූන් ලංකාවට වැඩම වීම නුසුදුසු බැව් ඕලන්දයන් ගේ අදහස වූ නිසා ගෙන ගිය පඬුරු ආදිය බෙතාවියේ තබා පෙරළා ලක්දිව පැමිණීමට පිටත් වූහ. ආපසු එන ගමනේ දී බොහෝ දෙනෙක් මරණයට පත්වූහ. තොරතුරු දැන්වීමට පැමිණියේ විල්බා ගෙදර මුහන්දිරම් රාළ පමණකි.

## භාග්‍ය උදාවීම.

ක්‍රි. වර්ෂ 1747 දී විජයරාජසිංහ රජු පරලෝකප්‍රාප්ත වූයෙන් කීර්ති ශ්‍රී රාජසිංහයෝ රාජ්‍ය ශ්‍රී පදප්‍රාප්ත වූහ. මෙතුමා ගේ රාජ්‍ය සමය බුදු සසුනට අතිශය හිතකර අවදියක් විය. ලක්දිව උපසම්පදාව පිහිටුවීම සඳහා මෙතෙක් දැරූ සියලු උත්සාහයන් ව්‍යර්ථවී ගිය නමුදු සරණංකර හෙරණපාණෝ ඉන් දුර්මුඛ නොවූහ. සැදැහැවත් කුල දරුවන් සසුන්ගත කිරීමෙන් ද ශාස්ත්‍රීය කටයුතු දියුණු කරලීමෙන් ද වඩාත් කැපවීමකින් ක්‍රියා කළහ. මේ නිසා සතර පස් දෙනෙකුගෙන් පටන් ගැනුණු සිල්වත් සමාගමේ සාමාජික පිරිස මේ වන විට සත්සියය ද ඉක්මවා සිටියහ.

**විද්‍යාස්ථාන ඇරඹීම.**

මේ අතර සරණංකර සාමණේරයන් වහන්සේ බුදු සසුන වැටී ඇති තත්ත්වයත් එසේ වීමට හේතුත් පැහැදිලි කර සසුන නඟා සිටුවීමටත් ධර්මශාස්ත්‍ර දියුණුවටත් කළ යුතු කාර්යයන් ගැන රජතුමාට කරුණු සහිත ව අවබෝධ කරවූහ. මේ අනුව රජතුමා ලක්දිව නොයෙක් පළාත්වල ගිහි පැවිදි ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබා ගැනීම සඳහා පෝයමළුව, අස්ගිරිය, සුදුහුම්පොල, අම්පිටිය, නිත්තෙවෙල ගංගාරාමය යන විහාරයන්හි ශාස්ත්‍රශාලා කරවා දුන්නේ ය.

උගත් පෙළ දහම් ඈ සමතුන් හැදි    න
දෙ වෙහෙර පුර සතර වාසල් වෙහෙර ය    න
සතැන සතර සැල් සැම පසය තබ මි    න
උගතුව වැවස්තා කළ නිරිඳු හැම ද    න

සුදුහුම් පොළ ද අම්පිටිය ද නිත්තවෙ    ල
ගංගාරාම වෙහෙර ද නුවර සිවු ප    ල
ගම්වර දෙවා සිප්සල් වැවස්තා ති    ල
පත් කර ඉගෙණීම අත් කළ දන සිය    ල

**සසුන් දියුණුවට අතදීම**

මන්දාරම් පුවතෙහි එන පැදිවලින් සසුන් දියුණුවට අත දීම මනාව සනාථ වේ. මේ නිසා තුන් සිංහලයේ ම ශාස්ත්‍රාභිලාෂීහු මහනුවරට ඇදී එන්නට පටන් ගත්හ.

දිනක් රජතුමා විහාර දෙකේ සාමණේරවරුන්ට ආරාධනා කොට රජ ගෙදර දානයක් පිළියෙළ කරවා අට පිරිකර යනු කවරේදැයි ඔවුන්ගෙන් විමසීය. හෙරණ පැවිද්දෝ ''පත්තං

පරිස්සාවනං කාය බන්ධනං'' ආදී ගථාවෙන් අට පිරිකර තෝරා දුන්හ. එසේ නම්, මුලට ම සඳහන් පාත්‍රය පරිහරණය නො කරන්නේ ඇයි දැයි අසා පාත්‍රයක්වත් නැති තමුන්නාන්සේලා කෙරෙහි කවර නම් ගුණයක් ද? මෙතැන් පටන් පාත්‍රයෙන් වළඳන බවක් විනා පිඟන් තැටි ආදියකින් වැළඳූ කෙනෙක් ඇත්නම් රාජාඥා කෙරෙමි'' යි කියා සියල්ලන්ට ම පාත්‍ර දෙවී ය. අද පටන් සංඝයා විසින් නො කටයුතු නැකත් වෙදකම් ආදී නින්දිත කටයුතු නො කරවිය යුතු ය. සංඝයා විසින් උගත මනා ධර්මය උගත මැනවැ'යි ආඥා ද පැනවී ය.

ශාසනෝදයකාමී සැදැහැවත් මේ රජතුමා උපසපන් එක් භික්ෂු නමක් වත් ලක්දිව නැත යනු අසා සංවේගයට පත් ව ''මා දවස බුදුසසුන බබුළුවා ලන්නෙමි'' යි යන ස්ථිර අධිෂ්ඨානයෙන් යුක්ත ව සරණංකර හෙරණපාණන්ගේ අදහස ඉටුකර දීම සඳහා ඉදිරිපත් විය.

## සියමට ගිය දූත පිරිස

විල්බාගෙදර මුහන්දිරම් රාළගේ මාර්ගදේශකත්වයෙන් සදෙනෙකුගෙන් යුත් දූත පිරිස ඕලන්ද නැවකින් සියම් දේශයට යවනු ලැබූහ.

''එම විල්බාගෙදර මුහන්දිරම් රාළත්, ආයිත්තා ලියද්දේ මුහන්දිරම් රාළත්, පට්ටේපොල රටේ රාළත්, ඇල්ලේපොල වෙඩික්කාර මොහොට්ටාලත්, යටිනුවර ඊරියගම නිලමේත් යන පස් දෙනා සමඟ බොහෝ පඬුරු පිරිවර ජනයා සහිත සන්දේශ පත්‍ර සියම් දේශයට යවා උපාලි මහා ස්වාමීන් ප්‍රමුඛ භික්ෂූන් වැඩමවා ගෙන අවුත්....''

(සංඝ සාධු චරියාව)

සියම් දේශයට යවන ලද පාලි සන්දේශය පිළියෙළ කරදෙන ලද්දේ සරණංකර හෙරණපාණන් විසිනි. පඬුරු පාක්කුඩම් ඇතුළු අනෙකුත් අවශ්‍ය දෑ රජතුමන් විසින් සපයා දෙන ලදී. මෙසේ ක්‍රි. වර්ෂ 1750 අගෝස්තු මාසයේ දී සෙංකඩගල නුවරින් ගමන් ඇරඹූ දූත පිරිස පළමුදින වට්ටාරම් තැන්නේ ද එතැනින් පිටත්ව ගොඩපොළ දින දෙකකුත් නාලන්දේ දිනයකුත් ගොනාවල ගන්තලේ දිනයකුත් තම්පලගමුව දින දෙකකුත් වශයෙන් දින 12 ක් ගෙවා ත්‍රිකුණාමලයට ළඟා වූහ. එහි සතියක් පමණ ගතකොට බෙතාවිය බලා යන ඕලන්ද නැව්වලින් ගමනාරම්භ කළ රාජකීය දූත පිරිස මාස කීපයක් ගෙවා මලය අර්ධද්වීපයටත් ඉන් පසුව බැංකොක් නගරයටත් පැමිණියහ. සියම් රටට ළඟාවුණු දූතයෝ අයෝධ්‍යා පුරයට ගොස් සියම් රජු බැහැ දැක තෑගි භෝග පිරිනමා හසුන් පත් ද පිළිගැන්වූහ. ධාර්මික රජතෙමේ දූත පිරිස ආදරයෙන් පිළිගෙන ලක්දිව උපසම්පදාව පිහිටුවීමට සියම් භික්ෂූන් එවීමට කැමැති විය.

**සියමෙන් භික්ෂූන් වැඩමවීම.**

ඉක්බිති උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රධාන අටළොස් නමක් හා සාමණේරවරුන් සත් නමක් ද ඇතුළු සියම් ඇමතිවරුන් පස් දෙනෙකුන් ගෙන් යුක්ත කණ්ඩායම ඕලන්ද නෞකාවෙන් ලක්දිව බලා පිටත් වූහ. ඔව්හු ක්‍රි. වර්ෂ 1753 දී ත්‍රිකුණාමල වරායට සේන්දු වූහ. ඇහැලේපොළ මහ අදිකාරම්තුමා ප්‍රධාන පිරිසක් ත්‍රිකුණාමලයට ගොස් පිරිස සමාදරයෙන් පිළිගෙන මහනුවරට කැඳවාගෙන ආහ.

## ප්‍රථම උපසම්පදා කර්මය.

ක්‍රි. වර්ෂ 1753 ඇසළ මස පුර පසළොස්වකදා උපාලි මහතෙරුන් වහන්සේ ගේ උපාධ්‍යායත්වයෙන් හා බ්‍රහ්මජෝති, මහාපුඤ්ඤ යන තෙරුන් වහන්සේලාගේ ආචාර්යත්වයෙන් මල්වත්ත විසුංගාම සීමාවෙහි දී ප්‍රථම උපසම්පදා පුණ්‍ය කර්මය සිදු කරන ලදී. සියම් රටින් පැමිණි ''නාග' නම් සාමණේරයන් පළමුව උපසපන් වූ අතර, වැලිවිට සරණංකර සාමණේරයන් ඇතුළු ලාංකික භික්ෂූන් සය නමක් අනතුරුව උපසම්පදාව ලබා ගත්හ.

## සරණංකර හෙරණපාණන් උපසපන් බව ලැබීම

මෙම උපසම්පදා විනය කර්මයේ දී ලාංකික භික්ෂූන් ගෙන් පෝයමළු විහාරයේ ගණනායක කොබ්බෑකඩුවේ හෙරණපාණන් පළමුවැනියා හැටියටත්, අස්ගිරි විහාරයේ ගණනායක නාවින්නේ හෙරණුන් දෙවැන්නා හැටියටත්, වැලිවිට සරණංකර හෙරණපාණන් තෙවැන්නා හැටියටත් උපසම්පදාව ලැබූහ. සරණංකර හෙරණපාණන්ට පළමුව උපසපන්වීමට අවස්ථාව තිබුණ ද විහාර දෙකේ ප්‍රධානයින්ට මුල් තැන දීමේ වැදගත්කමත් පසුව උපසම්පදාව ලැබීමෙන් ස්වකීය නිහතමානී භාවය දැක්වීමටත් මෙසේ කළ බව සිතීමට ඉඩ තිබේ.

## චිත්ත ධෛර්යයක්

උදාරවූත්, මහනීයවූත් මෙකී ශාසනික විනයකර්මය කෙසේ හෝ සපුරා ගන්නෙමි යන අධිෂ්ඨානය වැලිවිට හෙරණපාණන් තුළ කෙතරම් බලවත්ව පැවතුණා ද යන්න සංඝරාජ සාධුචරියාවේ මේ ප්‍රකාශයෙන් හෙළි වේ.

''උපසම්පදාව සිද්ධකර ගන්නා පිණිස සිතිවිලි ම සිතන සේක් මෙබඳු සිතිවිල්ලකුදු සිතමින් සත්‍ය ක්‍රියාවක් ද කළ සේක. ඒ කෙසේද යත්,

උපසම්පදාව පිණිස දේසේ යන ගමනක් සම්භව මුදු යාත්‍රාවක් කරන විටක සාමණේර බිලියක් දුන්නොත් මිස යන්ට නොදෙමි කියා යක්ෂ රාක්ෂසයෙක් කීයේ වීනම් එවිට මා ම බිලි කොට දී සෙසු සැමතැන් ම සුවසේ සසුන් පවත්නා දේසේකට ගොස් උපසම්පදාව ලබමින් නැවත ලංකාවට ම අවුත් අප මහා රාජෝත්තමයාණන් වහන්සේට ඒ පින් පෙත් දෙමින් පසුබට බුදු සසුන් වර්ධනය කිරීම කරන සේ යෙදේවා''

උපසම්පදා ගෙන ඒම සඳහා යන මුහුදු ගමනක දී අමනුෂ්‍යයෙකු විසින් ඉල්ලීමක් ඉල්ලා සිටියොත් අනිකකු නොදී තමා ම ඊට ඉදිරිපත් වන බව ප්‍රකාශ කිරීමෙන් මේ උතුම් ශාසනික විනය කර්මය සිදු කර ලීමෙහි ලා උන් වහන්සේ තුළ පැවැති චිත්ත ධෛර්යය මින් මොනවට පැහැදිලි ය.

මේ අයුරින් පැමිණියා වූ සියලු බාධකවලට මුහුණ දෙමින් කිසිතැනෙකදීත් පසුබට නොවී ස්වකීය අභිමතාර්ථය මුදුන් පත්වන තුරු ධෛර්යය ලිහිල් නො කළ, පණස් පස්වැනි වියෙහිදී උපසම්පදාව ලබාගත් වැලිවිට සරණංකර හිමියෝ ආශ්චර්යවත් පුරුෂයෙකි.

**සඟරජ වීම**

උපසම්පදාවට පත් සරණංකර හිමියෝ මල්වතු විහාරයෙහි පළමුවන වස ගෙවූහ. අනතුරු ව විහාර දෙක්හි සෙසු සාමණේරවරුන්, උපසම්පත්තියෙහි පිහිටුවා ඔවුනුදු පසුවස් සමාදන් කරවූහ.* පසුවස් වසන දවසෙහි කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමා භික්ෂු සංඝයා ඇතුළු සරාජික පර්ෂද් හමුවෙහි වැලිවිට සරණංකර හිමියන් ලක්දිව සංඝරාජ ධුරයට පත් කළ බව දන්වමින්, ඒ පිළිබඳ සංකේතය වූ විජිනිපත (වටාපොත) පිළිගැන්වූහ.

---

* පොතෙහි එන වර්ණ චිත්‍රය බලන්න.

මෙසේ නැතක් දුක් පීඩා විඳිමින් මහා දුත්සාහයෙන් පිහිටුවන ලද උපසම්පදාකර්මය මෙරට ශාසන ඉතිහාසයේ නව යුගයක ආරම්භයක් සේ සැළකිය යුතු ය. කෝට්ටේ යුගයේ වැඩ සිටි වීදාගම මෛත්‍රෙය සංඝරාජයන් වහන්සේ ගෙන් හිස්ව පැවැති මේ භාරදූර ශාසනික පදවිය සරණංකර මාහිමියනට ලැබීම නිසා ලාංකික සියලු භික්ෂූන් පාලනය කිරීමේ බලය ද උන් වහන්සේට හිමි විය.

## "උඩඟු නොව මහණ"

තමන් වහන්සේ ලක්දිව සංඝරාජ පදවියට පත් කරන බව කල් ඇතිව දැනගත් සරණංකර හිමියෝ තමන් වැඩ සිටි පන්සලේ උඩෙලිපතෙහි - උළුවස්ස මත - **"උඩඟු නොව මහණ"** යන වාක්‍යය තුන් පොළක ලියා තුබූහ. මෙවැනි ශ්‍රේෂ්ඨ පදවියකින් පවා තමන් වහන්සේ තුළ මානය, අහංකාරය වැනි පහත් සිතුවිලි මාත්‍රයක්වත් ඉපැදීම උන් වහන්සේ නොරිස්සූ බව මේ සිද්ධියෙන් සිතාගත හැකි ය.

## සීමා පිහිටුවීම

උපාලි මහ තෙරුන් වහන්සේ ප්‍රධාන සියම් දේශයෙන් වැඩී භික්ෂූන් වහන්සේ මෙරට ගත කළ කාලය තුළ දී සත්සියයක් සාමණේරවරුන් උපසම්පත්තියෙහි පිහිටු වූහ. තුන් දහසක් කුල දරුවන්ට සාමණේර පැවිද්ද ලබා දුන්හ. එසේ ම මල්වත්තේ හා අස්ගිරියේ බද්ධසීමා පිහිටුවීම, නාරම්මල විහාරය, මැද්දේපොල විහාරය, මඩවල විහාරය යන විහාරවල සීමා සම්මත කිරීම් ආදී ශාසනික කටයුතු සිදුකරලීමෙහි ලා විශේෂ උනන්දුවක් දැක්වූහ.

## සියම් මහානිකායයේ ආරම්භය

සියම් දේශයෙන් වැඩමවූ උපාලි මහතෙරුන් වහන්සේ ගේ මූලිකත්වයෙන් උපසම්පදාව පිහිටුවීමෙන් මෙරට ශාසන ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් මෙන් ම ස්‍යාමොපාලි වංශික මහානිකායයේ සමාරම්භය ද සිදුවීය. ස්වකීය උපසම්පදාවෙන් දොළොස් වසකට පසු ක්‍රි. වර්ෂ 1764 දී සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේ ලාංකික භික්ෂූන් ගේ සහයෝගයෙන් මල්වතු විහාරයෙහි දී උපසම්පදා පුණ්‍යකර්මයක් පවත්වන ලදී. සිය ගණනක් හෙරණ පැවිද්දන් මෙහිදී උපසපන් වූ අතර එතැන් පටන් වාර්ෂිකව මේ උතුම් විනය කර්මය සිදු කිරීමට විධි විධාන ද සළස්වන ලදී.

## කතිකාවතක් ඇති කිරීම

සම්බුද්ධ ශාසනය අනාගතයෙහි නිර්මලව පවත්වා ගැනීම සඳහා ශාසනමාමක රජදරුවන් කටයුතු කළ පරිද්දෙන් කිත්සිරි මහරජතුමන් විසිනුදු කතිකාවතක් ඇති කරන ලදී. සරණංකර සංඝරාජයන් වහන්සේ ගේ උපදෙස් අනුව සකස්වුණු මෙය * **කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත**'' නමින් හැඳින් වේ.

## විනය සංගායනාවක් පැවැත්වීම

විනයානුකූල භික්ෂු ජීවිතය ශාසන චිරස්ථිතියට ඒකායන මාර්ගය වන හෙයින් (විනයෙ ඨිතෙ සාසනං ඨිතං හෝති) විනය සංගීතියක් පැවැත්වීමට අදහස් කළ සඟරජ මාහිමියන් වහන්සේ මල්වතු අස්ගිරි විහාර දෙකේ සියලු සංඝයා මල්වතු විහාරයට රැස් කරවා අටුවා සහිත විනය පිටකටට සංගායනා කරන ලදැයි මල්වතු විහාර රාජාවලියෙහි දක් වේ.

---

* පරිශිෂ්ටයක් වශයෙන් මෙම ග්‍රන්ථය අවසානයෙහි පළ කැර ඇත.

පන්දහසක් අවුරුදු බුදුසසුන නිර්මල ව පවත්වා ගැනීමටත් භික්ෂු ජීවිතය සුරක්ෂිත කරලීමටත් ස්ථිර පදනමක් දැමීම සඳහාත් සඞ්ගරජ මාහිමිතුමන් විසින් පොදුවේ භික්ෂූන් වෙත අනුශාසනාවක් ද නිකුත් කරන ලදී. සංඝරාජානුශාසනාව නම් වූ එය සර්වකාලීන වටිනාකමකින් යුක්ත අගනා අනුශාසනයකි.

## සංඝරාජ අනුශාසනාව

''මා ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව පවතින තුරු මා කරන අවවාද නම් :-

බුදුව පළමු කොට වදාළා වූ ''ද්වේ මේ භික්ඛවේ'' යනාදීන් දම්සක් පැවතුම් සූත්‍රයෙහි ප්‍රව්‍රජිතයන් විසින් නො සෙවිය යුතු වූ අන්තද්වය විශේෂයෙන් දැන ගෙන වස්තුකාම - ක්ලේශකාමයෙන් දුරුව උපසම්පදා මාලකයෙහි අනුශාසනා කළ සතර නිශ්‍රය සිහි ඇතිව එහි ම කී සතර අකරණීය ධර්මයන්ට ළං නොවැ ''කිඤ්චි අණ්ඩං - පෙ - ධනං වජෙ - පෙ- වජෙ නරෝ ධම්ම මනුස්සරන්තො'' යනාදීන් සිහි කරමින් ජීවිතයටත් වඩා සාදරයෙන් රකිමින් සප්තාපත්ති ස්කන්ධයට කී ලෙස අසා බලා ඉගෙන යම් අහේතුවකින් සතර පාරාජිකාවෙන් එකක් වුණි නම් ලජ්ජා නොවී විනය දන්නා කෙනෙකුන් ඉදිරියේ ඇති සැටි ක්‍රියා පාරාජිකාව සැබෑව තිබේ නම් මෙලොව පිණිස භික්ෂූන් සමග නො සිට උපාසකව හෝ සාමණේරව හෝ පිරිසිදු දසසිල් පුරා නිවන් පැතුව මුළා නොවෙයි. අංගුත්තර අටුවා අච්ඡරාසංඝාත සූත්‍ර අටුවාවේ එලෙස දකින්ට ඇත. ගරුකාපත්තියක් වුණි නම් විනය දන්නවුන්ට කියා පරිවාසාදියෙන් නැගිටුව මැනව. බහුභාණ්ඩික නොවුව මැනව. සෙසු ශික්ෂාපදවල ඒ ඒ තැන කී ලෙස පිළිපැදුව මැනව.

ථූපාරාමයෙහි අධික දවසක් හිටිය මහ තෙරුන් වහන්සේ මිත්‍ර තැන සමග සිඟා ගිය සැටියේ අන් විහාරයකට යන්ට නික්මුණා වගේ සකුණොපමාවෙන් සල්ලෙඛය වැඩුව මැනව.

දසධමම් සූත්‍ර, කරණීයමෙත්ත සූත්‍ර, ධම්මදායාද සූත්‍රාදියෙහි වදාළ අල්පෙච්ඡ සන්තුෂ්ටතාදි තපෝ ගුණයෙහි ඇලුණ මැනව. පරිනිර්වාණ සූත්‍රයෙහි වදාළ අපරිහානීය ධර්මයන් ආශ්‍රය කළ මැනව. හැම ලෙසින් ම මෘදු වුව මැනව ''තදහු පබ්බජිතො - පෙ - සම්පටිච්ඡාමි මුද්ධනා'' යි සැරියුත් ස්වාමීන් වහන්සේ ගේ අවවාද ප්‍රතිග්‍රහණය හා රත්නාවලියෙහි පොළෝ කම්පා කරවමින් බුදුන් ඉදිරියෙහි සැළ කළ නව ගුණය පැතුව මැනව. එසේ ඒ ඒ පොත්වල වර්ණනා කළ තපෝගුණ පුරමින් ශාසනස්ථිතියට කාරණා වූ පාලි ධර්මයට පිහිටවූ ව්‍යාකරණ ශාස්ත්‍රයට වැඩි ආදර ඇතිව දන්නා තැනගේ දෝෂාදෝෂ නො බලා යටත්ව උගනිමින් පරවැඩ පිණිස ඒ ශාස්ත්‍රයෙහි ද ලෝභ නො කොට උගන්ට පිළිවන් ශිෂ්‍යයන්ගේ වරද නො සොයා උගන්වා හාත්පසින් බණට ම අනුකූලව පරලොව බලා සිවු පිරිසිදු සිල් පිරුව මැනව.

පාංශුකූල දැරීමෙන් චීවර ආරියවංශය ද සිඟා වැළඳීමෙන් හෙවත් ''උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය'' යනාදීන් වදාළ ලෙසින් ගෙපිළිවෙළින් සිඟා වළඳා පිණ්ඩපාතාය්‍ය් වංශය ද, වනයෙහි රුක් මුල විසීමෙන් සේනාසනාය්‍ය් වංශය ද, ''ඉධ භික්ඛවේ භික්ඛු අරඤ්ඤගතොවා'' යනාදීන් වදාළ ලෙසින් ආය්‍ය්වංශ සූත්‍රය අටුවාව හා විශුද්ධිමාර්ගය, ප්‍රතිපත්ති සංග්‍රහය, විමුත්ති සංග්‍රහය යනාදි භාවනාය්‍ය් වංශය යන සතර ආය්‍ය් වංශයෙහි මහත් ආදර ඇතිව බැලුව මැනව. පිළිපැදුව මැනව, විසුද්ධිමාර්ගාදියෙහි කී බණ ම ගුරු කොට ගත මැනව.

මෙදෑ අතරෙහි පරලොවට භය නැති ප්‍රව්‍රජිතයන් විසින් මහෙච්ඡතායෙන් අභිමානයෙන් කුසීත භාවයෙන් මලින කල ශාසනය මා ගේ ශිෂ්‍ය පුත්‍රයන් විසින් අල්පෙච්ඡතායෙන් අනභිමනායෙන් සතර සම්‍යයක් ප්‍රධාන වීය්‍යීයෙන් බබුලුවා මෙතේ බුදුන් නො වරදවා දකින්නට නුමුළාව කාල ක්‍රියාවට නිසි ව විසුව මැනැවැයි මේ අනුශාසනාව කෙළේ සංඝ පීතෘ වූ සංඝරාජ ස්වාමීන් විසිනි. නිවන් පිළිවෙත් කැමැති මාගේ ශිෂ්‍ය පුත්‍රයෝ මා බලා සිටින්නාක් මෙන් මේ දෙස බැලුව මැනව''

## සඟ රජු සිර කිරීම

සියම් භික්ෂූන් මෙරටට වැඩ උපසම්පදාව පිහිටුවා වසර අටකට පසු සමරක්කොඩි අදිකාරම හා මොලදණ්ඩේ ගජනායක නිලමේ ද මල්වතුවිහාරයේ සමහර භික්ෂූහුද කිත්සිරි රජු බොරු වළක දම්මවා මැරීම සඳහා රහස් කුමන්ත්‍රණයක යෙදුණාහ. අස්ගිරි විහාරයේ සිටි යටවත්තේ නැමැති නායක හිමි නමක් මෙය රජතුමාට රහසින් දන්වන ලදී. සිද්ධියට හේතු වූයේ කිත්සිරි රජතුමා බෞද්ධයකු වුවත් ද්‍රවිඩ චාරිත්‍රයට අනුව නළලේ අළු ගෑම අත් නො හළ නිසා රජු කෙරෙහි ඇති වූ අමනාපයකැයි කියනු ලැබේ.

සියම් රට සිට මෙරටට පැමිණි විදර්ශනාචාර්යවරයකු විසින් පවත්වනු ලබන ධර්මදේශනාවක් ඇසීමට පැමිණෙන ලෙස රජුට ද ආරාධනා කරන ලදී. පෝයගෙයි තනවන ලද බොරු වළක රජු වැටෙන්නට සලස්වා මරා දැමීම ඔවුන්ගේ අදහස විය. මේ ගැන කල් ඇතිව දැන සිටි රජතුමා නියමිත දින මල්වතු විහාරයට ගොස් බොරුවල තිබූ තැන අසල හිඳගෙන ධර්ම දේශනාවට ද ඇහුම්කන්දී පිරිකර ද පූජාකර අවසානයේ තමන් අත තිබුණු ජයකොන්තයෙන් බොරු වළට ඇන කාරණය සත්‍ය බැව් දැන රජවාසලට ගොස් සඟ රජතුමන් ඇතුළු මල්වත්තේ නායකවරුන් ද රදළ මුදලිවරුන් ද ගෙන්වා වැලිවිට

මාහිමියන්ගෙන් පින්කම පිළිබඳ තොරතුරු විමැසී ය. රජු අසන ප්‍රශ්නවලින් නිදහස් නැති තැන ඒ පින්කම ගැන දන්නා බව මාහිමියෝ පිළිතුරු දුන්හ. ''එසේ නම් ඒ ගැන කල් ඇති ව මට නොදැන්වූයේ මන්දැයි'' රජු කෝපයෙන් ඇසූ විට, සඟරජ හිමියෝ සිය ඇඟිල්ල පෙන්වා රජුට මෙසේ කීහ. ''රජතුමනි, මගේ ඇඟිල්ලේ නිය පිරිත්තාවට බෙහෙත් නො කරන්නේ මෙහි සිටින පණුවා මැරෙන නිසයි. යම් විදියකින් මේ කාරණය රජුට මා දැන්වී නම් ජීවිත කීයක් විනාශ වන්ට තිබුණාදැයි'' ඇසී ය. එවිට රජතුමා ''එහෙනම් මා මැරුණොත් හොඳද'' යි ඇසී ය. එවිට සඟ රජතුමා ''නොකී නිසා මට වරදක් නැතැ'' යි පැවසීය.

ඉන් පසු නැවතත් ප්‍රශ්න කරමින් ''එහෙම නම් තමුන්නාන්සේ ගේ ගෝලයන්ට හොඳද'' යි ඇසූ විට මා හිමියෝ නිශ්ශබ්ද වූහ. කෝපයට පත් රජතුමා ''වැලිවිට කණා සාසනේ වවනවා යැයි කියා ලෝක සාසන දෙක ම නාසාපි'' යි කියා සඟ රජු හිර කිරීමට නියම කෙළේ ය.

නිරපරාධී සංඝරාජයන් වහන්සේ නිකරුණේ මෙවැනි අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වූයේ තමන් ගේ දුර්විනීත ශිෂ්‍යයන්ගේත් රදළ වරුන්ගේත් කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළ නිසා ය. නිවැරැද්දේ සිරගෙට නියම වූ සඟරජු දෛව බලයෙන් මෙන් ස්වල්ප කාලයකින් සිරගෙයින් නිදහස් වූ අතර තමා අතින් සිදු වූ වරදට සමාව දෙන ලෙස කිත්සිරි රජ අයැද සිටියේ ය.

## කුඹුරු ආරවුලකදී සඟරජු සාක්කි දීම

කුඹුරු ආරවුලක් සම්බන්ධයෙන් රජු ඉදිරියේ සාක්කි දීමට සිදු වූ අවස්ථාවක් ගැන ''කෙත් හබේ විනිස'' නම් කාව්‍යයෙහි විස්තර වී ඇත. මහාචාර්ය කොටගම වාචිස්සර හිමියන් ලියූ ''**සරණංකර සංඝරාජ සමය**'' නම් ග්‍රන්ථයෙහි ඒ පුවත මෙසේ විස්තර වෙයි

''දුම්බර බඹ නැකති රාළ නම් මිනිසකුට පුත්තු දෙදෙනෙක් සිටියහ. එයින් වැඩිමලා කොර වූ දෛවඥයෙකි. මහනුවර ප්‍රාකාරවල වැඩ කිරීමට පැමිණ සිටි අතර හේ අසනීප විය. ඔහු සමග අමනාපයෙන් සිටි ඔහු ගේ සොහොයුරා සිය බිරිඳ සමග මිත්‍රව සිටියේ ය. මේ අතර ප්‍රාකාරයේ වැඩ කරමින් සිට ලේ පාචනය නිසා අසනීප වූ හේ ගම බලා පිටත්ව ගියේ ය. ඔහුට ගමට යාගත නොහැකි විය. මුං කොටුවේ දන්තු ආරච්චිල නම් ඔහුගේ සිසුගෙන් ඔහුට ආධාර ලැබුණේ ය. සිය බිරිඳ ගෙන් වෙන්ව දරුවන් ගෙන් ද කිසිම සැලකිල්ලක් නොලද හේ සිය කුඹුර අන්තිම කැමති පත්‍රයෙන් දන්තු ආරච්චිලට ලියා දී පරලෝ සැපත් විය. දන්තු ආරච්චිලට කුඹුර භුක්ති විඳීමට නොහැකි විය. එයට හේතුව මිය ගිය අයගේ සොහොයුරා එයට බාධා කිරීම ය. දන්තු ආරච්චිල 1775 දී නුවර මාතලේ මහනිලමේට කියා කුඹුර නිරවුල් කර ගත්තේ ය. එහෙත් මිය ගිය සොහොයුරා කළ ආරවුල නො සන්සිඳුණි. එවිට ආරච්චිල කෙළේ කිත්සිරි රජුට මේ ගැන පැමිණිලි කොට සඟරජු සිය සාක්කිකරු ලෙස ඉදිරිපත් කිරීම ය. සඟ රජුගේ සාක්කිය නිසා ඔහුට ජය ලැබුණේ ය. ඒ බව ''කෙත්හබ විනිසේ'' මෙසේ සඳහන් වේ.

| | | |
|---|---|---|
| ''බලවත් | ඒ මහා නඩුවෙන් ගම | ගත්තා |
| එමලත් | යලේ දී මම අස්වනු | ගත්තා |
| නඩුගත් | උං එදත් දබරෙට හිට | ගත්තා |
| නැවතත් | පසු නො බැස අවුලට හිට | ගත්තා |
| | | |
| අප කිත් | සිරි රාජසිංහ නරනිඳුන් | හට |
| මෙපවත් | ඔප්පු කෙරුවා සඟරජු | එවිට |
| දෙවිඳුන් | වැඩ ඉඳින අවසර ලැබී | සිට |
| සිරිමත් | මඟුල් මඬුවේ දී විනිස | කොට |
| | | |
| සොළොස් | සිය අටානූවස වෙසඟ | පුර |
| සහස් | නෙතසෙ සෙංකඩගල දී | එවර |
| තිදස් | පුර වැඩිය දෙවියන්ගේ | පවර |
| මෙදස් | හට ම ලැබුණා නඩුවෙන් | කුඹුර'' |

(197-198 පිටු)

## සංස්කෘතියේ නවෝදය

සංස්කෘතික පුනරුත්ථාපනය සඳහා සරණංකර මාහිමියන් ගෙන් සිදු වූ සේවය ද අනුස්මරණීය ය. මහනුවර අඳුරු යුගයේ බෞද්ධ භික්ෂුව ද ගිහියා ද බෞද්ධ ප්‍රතිපත්ති පසෙක තබා තෙරුවන් අමතක කොට දෙවියන්, යකුන් ඇදහීම් ආදී මිථ්‍යා විශ්වාසයන්හි ගැලී සිටියහ. දුසිරිතෙහි ඇලී පස්පව් කරමින් සිටි සමාජයක් ඉන් මුදා සුසිරිතෙහි යොදවා පන්සිල් අටසිල් ආදි උසස් ගුණයන්හි පුරුදු පුහුණු කරවාලීමට සරණංකර මාහිමියන් දැරූ තැත ද අමරණීය ය.

ධර්මදේශකයන් පුහුණු කොට චාරිත්‍රානුකූල ව ධර්ම දේශනා පැවැත්වීම, පිරිත් දේශනා කිරීම, බෞද්ධ උත්සව පැවැත්වීම, පෞරාණික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරවා

ගමන් පහසුව සැලැස්වීමාදියෙන් බෞද්ධ සැදැහැතියනට පුද පූජා පැවැත්වීමට අවස්ථාව සලසා දීම වැනි සත්ක්‍රියා ඒ අතර විශේෂ තැනක් ගනී. මෙසේ අඩපණ වී ගිය බෞද්ධ සංස්කෘතිය පණ ගන්වා ඔප් නංවා ලීමෙන් සංස්කෘතිය ද ජීවය ලද්දක් සේ වැඩෙන්නට විය.

## ජාතක පොත් වහන්සේ

''ජාතක පොත් වහන්සේ'' යනුවෙන් අප හඳුන්වන්නේ ''පන්සිය පණස් ජාතකය'' යි වැලිවිට සංඝරාජ මාහිමියන් වහන්සේ සාමණේර අවධියේ පටන් ම ඉපැරණි ධර්ම ග්‍රන්ථ සෙවීමෙහි දැඩි වෙහෙසක් ගත්හ. එදා ධර්මය ලියැවී තිබුණේ පුස්කොළ පොත්වල ය. මහනුවර දිස්ත්‍රික්කයේ අඹගහවත්තේ ගණින්නාන්සේගේ නිවෙසේ ජාතක පොත් වහන්සේ තිබෙන බවට ආරංචියක් ලැබිණි. උන්වහන්සේ දිනක් සවස් යාමයේ එම ගණින්නාන්සේ වෙසෙන නිවසට ගියේ එම ආරංචිය ඔස්සේ ය. උන්වහන්සේ එහි යන විට ගණින්නාන්සේ ගෙදර සිටියේ නැත. ගණින්නාන්සේ කුඹුරු වැඩට ගොස් ය. ගෙදර සිටියේ අඹු දරුවන් පමණි. ටික වේලාවක් යන විට සිවුරකුත් කරේ එල්ලාගෙන හරක් බානකුත් දක්කාගෙන ගණින්නාන්සේ පැමිණියේ ය. අප සංඝරාජ මාහිමියන් වහන්සේ පැමිණ සිටින බව දුටු ගණින්නාන්සේ ''තමුන්නාන්සේ කුමක් සඳහා මෙහි පැමිණියේ දැයි'' විචාළේය. තමන් වහන්සේ එහි වැඩම කළ කාරණය උන් වහන්සේ ගණින්නන්සේට විස්තර කර දුන් පසු ගණින්නාන්සෙ අන්දුන් කුන්දුන් විය. ''අනේ ජාතක පොත් වහන්සේ කියන නමත් මම අදයි ඇහැව්වේ'' යනු ගණින්නාන්සේ දුන් පිළිතුර ය. බුදු දහම ගැනත් බෞද්ධ පොත පත ගැනත් ගණින්නාන්සේලා තුළ තුබුණු අවබෝධය මෙයින් මනාව පැහැදිලි වේ. (ගණින්නාන්සේලා පිළිබඳව අප මීට කලින් විස්තර කර දී ඇත) ගණින්නාන්සේ ගේ පිළිතුරෙන් පසුබට නොවූ සංඝරාජ හිමිපාණන් වහන්සේ ගෙදර වටපිටාව හොඳින්

පිරික්සා බලද්දී එම තිවසේ වී අටුවේ දොර විවර වීම වැළැක්වීම සඳහා අගුලක් වශයෙන් ජාතක පොත් වහන්සේ හිර කර තිබෙනු දුටුහ. උන් වහන්සේ එය එතැනින් ගන්නට තැත් කරන විට ඉදිරියට ආ ගණින්නාන්සේ ''තමුන්නාන්සේ මක් කරන්ට හදනවාද? ඕක ඇද්දොත් මගේ වී අටුව පෙරළෙයි'' කියා කෑ ගැසී ය. ''කලබල වන්න එපා'' යි පැවසූ උන් වහන්සේ වහා වඩුවකු ගෙන්වා එතැනට ලී කුරක් තනවා සවි කොට ජාතක පොත් වහන්සේ බේරාගත් බව ජනප්‍රවාදයේ එයි.

## ඉර හඳ දෑතට

මෙම ග්‍රන්ථය සම්පාදනය කරන බව දත් තරුණ සීල සමාදානයේ සාමාජිකාවක් * එවා තිබුණු ලිපියක මෙසේ සඳහන් විය. ''මීට වසර කීපයකට පෙර මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා ගුවන් විදුලියෙන් මෙම සඟරජ හිමියන්ගේ ජීවිත තොරතුරු අළලා ඉදිරිපත් කළ වැඩ සටහනක (තුන්පත් රටා) මෙසේ සඳහන් විය. මෙම සඟරජ හිමියන් මවු කුස පිළිසිඳගෙන සිටිද්දී උන්වහන්සේ ගේ මව, ඉරත් හඳත් දෑතට පැමිණි බව සිහිනයෙන් දුටුවා ය. උන්වහන්සේ ඉපදුණු දවසේම එම තිවසේ හැදුණු එළදෙනක් කදිම, සුන්දර අසු පැටියකු ප්‍රසූත කළා ය. එම එළදෙන සහ වසු පැටවා මරා කෑමට පැමිණි කොටියෙක් අසල වනයක ගල් දෙබොක්කාවක හිරවී මිය ගියේ ය. මෙය ද ජනප්‍රවාදයකි. මෙවැනි ජනප්‍රවාද රාශියක් අප වෙත ලියා එවූ හැමට තුති පුදමු.

## 4

# සඞ්ඝරජ මාහිමියන්ගේ සිසු පරපුර

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියට, තදීය සංස්කෘතියේ පැවැත්මට හා ධර්මශාස්ත්‍රීය දියුණුවට සිදු කළ සේවාව අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සිසු පරපුරක් ඇති කරලීමේ භාරදූර වගකීම සඞ්ඝරජ මාහිමියෝ සාර්ථක ව ඉටු කළහ. දූර දක්නා නුවණින් යුතු එතුමෝ ඒ සඳහා යෝග්‍ය වූ සිසු පිරිසක් බිහි කළහ. ඔව්හු ව්‍යක්ත වූහ. බහුශ්‍රැත වූහ. උන්වහන්සේ ගේ මූලිකත්වයෙන් කුල පුතුන් තුන්දහසක් පමණ හෙරණ පැවිද්ද ද තුන්සියයක් පමණ හෙරණුන් මහලු පැවිද්ද ද ලත් බව ''ස්‍යාමොපසම්පදා වත'' සඳහන් කරයි.

උඩපාත දෙරටින් පැමිණ සඞ්ඝරජ හිමියන් ඇසුරෙහි සදසතර හදාළ, පිළිවෙත් පුහුණු වූ මෙකී සිසු පිරිස දිවයිනේ නොයෙකුත් පළාත්වලට ගොස් ශාසනික, සාමාජික හා ශාස්ත්‍රීය ස්ද්ව්‍යාපාරයන් ආරම්භ කොට සිදු කළ ශාසන දියුණුවත් ධර්මශාස්ත්‍ර ප්‍රබෝධයත් නූතන යුගය තෙක් අඛණ්ඩව ගලා යමින් පවතී.

මෙසේ සංඝරාජයන් වහන්සේ වෙත පැවිදිව උන් වහන්සේ ගේ සෙවනෙහි වැඩෙමින් ධර්මශාස්ත්‍රය උගත් සිසුන් අතර උන් වහන්සේ ගේ ශාසනික හා අධ්‍යාපනික සේවාව පවත්වා ගෙන යාමට උපස්තම්භක වූ

1. තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත
2. දරම්ටිපල ධර්මරක්ෂිත
3. ගිනිගත්පිටියේ සංඝරක්ෂිත
4. රඹුක්වැල්ලේ ධර්මරක්ෂිත
5. මොරතොට ධම්මක්ඛන්ධ

යන හිමිවරු ප්‍රධාන තැනක් ගණිති. උන් වහන්සේ අතර ජ්‍යෙෂ්ඨයා ලෙස ගැනෙන්නෝ තිබ්බටුවාවේ ශ්‍රී බුද්ධරක්ෂිත හිමියෝ ය.

| | | |
|---|---|---|
| සැරියුත් | පිළිවෙලින් බුදුබණ කඩ නොක | ර |
| වණපොත් | කර උගත් සැමට ම පළමු ක | ර |
| සිදුහත් | යතිඳු තිබ්බටුවාවේ පව | ර |
| අගපත් | ගෝලයෙකි සඟරජුගෙ පැන ස | ර |

(සඟරාජ වත)

ඉගෙනුමෙන් හා ගුණ නැණින් සඟරජ හිමියන්ට පමණක් දෙවැනි වූ මෙතුමෝ උපසම්පදාව පිහිටුවීමෙන් පසු මල්වතු විහාර පාර්ශ්වයේ ප්‍රථම මහානායක පදවියට පත්වූහ. ''සත්ථා'' යන බුදුගුණය විස්තර කරමින් මෙතුමන් විසින් රචනා කරන ලද ''ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ'' නම් කෘතිය විශිෂ්ට ධර්මග්‍රන්ථයකි. පාලි භාෂාව පිළිබඳ මනා පටුත්වයක් ඇති මුන් වහන්සේ කුරුණෑගල පණ්ඩිත පරාක්‍රමබාහු රජු පටන් කීර්ති ශ්‍රී රජු දක්වා ඉතිහාසය විස්තර කරමින් ගාථා 800 කින් පමණ පරිමිත චූලවංශ අතිරේකය රචනා කළහ. එසේම සතිපට්ඨාන සූත්‍රයට හා සද්ධම්මොපායන නම් පාලි ග්‍රන්ථයට සිංහල සන්න ද සැපයූහ. ලක්දිව පිහිටුවනු ලැබූ ස්‍යාමෝපාලි භික්ෂු වංශය පිළිබඳ පුරාවෘත්තය ඇතුළත් ''ස්‍යාමොපසම්පදා වත'' ද මුන් වහන්සේ ගේ කෘතියකි.

සඟරජ හිමියන් ගේ දෙවැනි ශිෂ්‍යයා දරම්ටිපල ධර්මරක්ෂිත හිමියෝ ය. ධූතංගධාරියකු වූ මුන් වහන්සේ ධර්මදේශනයෙහි දක්ෂයෙක් වූහ.

| | | |
|---|---|---|
| පැමිණි | කලට මතඟා සදහම් සයු | ර |
| ගුණෙනි | සඳක් වන් එතෙලෙස දුහඟද | ර |
| නමිනි | දම් රකිත නායක හිමි එව | ර |
| දෙවෙනි | ගෝලයෙකි සඟරජුගේ පව | ර |

(සඟරජවත)

ප්‍රබන්ධ රචනයෙහිත් පාලි ව්‍යාකාරණයෙහිත් දක්ෂයකු වූ මුන් වහන්සේ පැරණි පොත් කීපයක් ලියැවීමෙන් ශාස්ත්‍රොන්නතියට උදව් දුන්හ. මල්වතු විහාරයේ මහානායක පදවියට ද පත් වූහ. ගම්මුල්ලේ රතනපාල හිමි වැනි දක්ෂ ශිෂ්‍යයන් ඇති කළහ.

ගිනිගත්පිටියේ සංඝරක්ෂිත හිමි සඟරජුගේ තෙවැනි ශිෂ්‍යයා ලෙස සැලකේ. සංඝරාජයන් වෙතින් ධර්ම ශාස්ත්‍රය හදාළ මුන් වහන්සේ නියමකන්ද විද්‍යාස්ථානයේ ආරම්භයේ සිට ඉගැන්වීමෙහි යෙදුණේ ය. තිරත්නමාලා, දළදා අෂ්ටක, මුනිරාජ අෂ්ටක, පද ලාඤ්ජන අෂ්ටක යන ග්‍රන්ථ රචනා කළෝ ය. සඟ රජුගේ සිත් දිනාගත් භක්තිමත් ශිෂ්‍යයෙකු වූ මුන් වහන්සේ පහළ දොළොස් පත්තුවේ සංඝනායක පදවියට ද පත් වූහ. සඟරජ හිමියන් ඇරඹූ ශාසනික සංස්කෘතික සද්ව්‍යාපාර දියුණු කර ලීමෙහි මහත් වෙහෙසක් දැරූහ. සඟරජ වතෙහි එය සඳහන් කරන්නේ මෙසේ ය.

ළ ග අතවැසි කමින් ඉඳ සියලු ම පැවති
ර ග දූන හික්මිලා පිළිපත් සැදූහැ ඇති
ස ග රැකි යතිඳු ගිනිගත්පිටියේ ගුණැති
ස ග රජුගේ ගෝලයෙකි තුන්වෙනි පෙමැති
(සඟරජ වත)

රඹුක්වැල්ලේ ධම්මරක්ෂිත හිමි මහජනයා පහදවා දහම් දෙසීමෙහි දක්ෂයෙකි. මහජනයාට විදර්ශනා භාවනාදිය ද පුරුදු කරවූ මුන් වහන්සේට විශාල ශිෂ්‍ය පිරිසක් ද වූහ.

වැඩකර		සසුන් වැඩි සඟ රජුගේ මෙල		ක
පැණසර		ගෝලයෝ ඇත දූන ගත් නොයෙ		ක
ගුණසර		රඹුක්වැල්ලේ දෙවෙනි නාය		ක
තනතුර		තිබෙන යතිඳුන් එක ගෝලයෙ		ක
(සඟරජවත)

කුංකුණාවේ සුමංගල හිමි ද උන්වහන්සේලා අතර වෙසෙසින් සඳහන් කළ යුතු ශිෂ්‍යයෙකි.

සඟරජවතෙහි දක්වෙන සිසුන් අතර පස්වැනි ශිෂ්‍යයා මොරතොට ධම්මක්ඛන්ධ හිමියෝ වෙති.

රාජාධිරාජ සිංහ රජු විසින් ''රාජගුරු'' යන ගෞරව නාමයෙන් පුදනු ලැබූ මුන් වහන්සේ වණපොත් කිරීමෙහි දක්ෂයෙක් වූහ. උපසපන් බවට පත්ව අඩමසකින් ප්‍රාතිමොක්ෂය වණපොත් කොට උපාලි තෙරුන් ප්‍රධාන සියම් භික්ෂූන් ඉදිරියෙහි දේශනා කළහ. එයින් ප්‍රසාදයට පත් උපාලි හිමියෝ ''අසදිසො ධම්මක්ඛන්ධො'' යි ප්‍රකාශ කළහ.

දෙලොවට		යසට පිහිටට කුලුණු සිඳු වැ		ද
දහමට		ලොබ නො සිතමින් උගත් පිරිසි		ඳ
මොරතොට		දෙවෙනි නායක තෙරිඳු දම්ක		ඳ
ගණදෙට		සඟ රජුන් ගේ ගෝලයෙකි සො		ඳ
(සඟරජ වත)

සංඝරාජ මාහිමියන් ගේ ගිහි ශිෂ්‍යයන් අතර අත්තරගම රාජගුරු බණ්ඩාර ඉතා දක්ෂ ශිෂ්‍යයෙක් විය. කලක් පැවිදි වී සිටි මෙතුමා කිත්සිරි රජුගේ ඉල්ලීම අනුව ගිහි බවට පත්විය. ''රාජගුරු'' පදවියෙන් ද සම්මානනය කරනු ලැබූ මෙතුමා විසින් කාරක පුෂ්පමංජරිය, සුධීර මුඛ මණ්ඩනය, ශබ්ද මාලාව, වෘත්තාවතාරය යන ග්‍රන්ථ රාශියක් සම්පාදනය කරන ලදී.

මුංකොටුවේ අබේසිංහ රාළ, ආයිත්තා ලියද්දේ මුහන්දිරම්, රාජාධිරාජසිංහ රජ, දූනුවිල ගජනායක නිළමේ ආදීහු සරණංකර සංඝරාජයන් වහන්සේ ගේ උඩරට ශිෂ්‍ය පරපුරේ ගිහි පඬිවරුන් අතර විශේෂ තැනක් ගත්හ. ඔවුහු ග්‍රන්ථ සම්පාදනය කිරීමෙන් සාහිත්‍ය දියුණුවට රුකුල් දුන්හ.

පහත රට ශාසනික හා ධර්ම ශාස්ත්‍රීය දියුණුව සඳහා මහත් පරිශ්‍රමයකින් කටයුතු කළ කීර්තිමත් ශිෂ්‍යයන් අතර සිටිනාමලුවේ ධම්මජෝති, වටරග්ගොඩ ධම්මපාල යන හිමිවරු විශේෂ තැනක් ගනිති.

මෙසේ උඩ පහත දෙරටෙහි ධර්ම ශාස්ත්‍ර ප්‍රබෝධය සඳහා සංඝරාජයන් වහන්සේ ඇති කළ ශිෂ්‍ය පිරිස මගින් සිදුවුණු සේවාව නිසා සිරිලක පුරා ධර්ම ශාස්ත්‍රාලෝකය පැතිරී ගියේ ය.

# 5

## අල්පේච්ඡතා ගුණය

ලෝකාර්ථ සේවය සඳහා ස්වකීය ජීවිත කාලය කැප කළ සඟරජ මාහිමියෝ ජීවිතයේ අවසාන භාගය ගණ සංගණිකායෙන් තොර ව විවේක සුවයෙන් ගත කරනු කැමැති වූහ. ඒ සඳහා යෝග්‍ය ස්ථානයක් වශයෙන් හන්තානේ කන්දේ අරණ්‍ය සේනාසනය පිළියෙළ කරවා ගත් උන් වහන්සේ උඩුවෙල ගමෙන් පිඩු සිඟා යැපෙමින් භාවනානුයෝගී ව එහි කාලය ගෙවූහ. එය අසා පැහැදුණු රජතුමා උන් වහන්සේ ගේ ගමන් පහසුව සඳහා අරණ්‍ය සේනාසනයේ සිට මල්වත්ත දක්වා පඩිපෙළක් තනවා දුන්නේ ය. දිනක් පඩිපෙළ ඔස්සේ මා හිමියන් වඩිද්දී පොළඟකු පාදය දෂ්ට කළ විට උන් වහන්සේ මෛත්‍රියෙන් යුතුව තවත් සපා කෑමට පාදය දිගු කළ බවත් කිසි ම බෙහෙතක් නො කර පොළොං විස දුරුවී ගිය බවත් කියනු ලැබේ.

සඟරජ මාහිමියෝ මහෙච්ඡතාව පිළිකුල් කළහ. අපිස් සතොස් ගුණය ම අගය කළහ. සුඛෝපභෝගී ව යස ඉසුරෙන් පිරුණු සුව පහසු දිවියක් ගෙවීමට තිබුණු හැම පහසුවක් ම අත්හැර හන්තානේ ගල්ලෙනට වී භාවනානුයෝගී ව වැඩ සිටීමට උන් වහන්සේ කැමැති වූහ. කිත්සිරි රජු විසින් පිරිනැමුණු ශ්‍රී පාදස්ථානයේ නායක පදවිය ස්වකීය ශිෂ්‍ය වෙහැල්ලේ ධම්මදින්න හිමියන්ට පවරාදීමෙන් හා ගඩලාදෙණිය, රිදී විහාරය, සූරියගොඩ විහාරය ආදී රජමහ විහාරයන් අනෙකුත් භික්ෂූන්ට පවරාදීමෙන් පෙනෙන්නේ උන් වහන්සේ තුළ පැවැති උතුම් වූ අල්පේච්ඡතා ගුණය යි.

සඟරජ මාහිමියෝ දීම උසස් ලෙසින් පුරුදු කළ උතුමෙකි. තමන් වහන්සේට ලැබුණු සිවුරු පිරිකර ආදී වටිනා බොහෝ දේ අනුන් ගේ ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කළ හ. තමන් ලද අහරින් බත් හැන්දක් හෝ දන්දී වැළඳීම උන් වහන්සේ ගේ සිරිත විය. වරක් බඩ සයින් පෙළුණු බලු රැළකට දුන් දානයක් නිසා ''සඟරජු ගේ බලුකපුටු දානේ වගේ'' යන උපහාසයන්ට ද උන් වහන්සේ ලක් වූහ.

## පරහිතකාමී බව

''පරහිතකරණාය බද්ධ කක්ෂ්‍යාඃ
සුඛමසි පත්‍ර වනෙ වසන්ති සන්තඃ

යන පඬි වදනින් පැවසුණු පරිදි සඟරජ මාහිමියෝ පරාර්ථය සඳහා ම දිවා රෑ වෙහෙසී වැඩ කළහ. එහි දී උන් වහන්සේ නොවිඳි දුකක් නැත. නොලද ගැහැටක් නැත. එහෙත් ඒ සියල්ල උන් වහන්සේ මැදහත් ව ඉවසූ සේක. ලාභ, අලාභ, අයස, යස, නින්දා, ප්‍රශංසා, සැප දුක යන ලෝක ස්වභාවයන්ට මුහුණ පෑමේ දී උන් වහන්සේ කම්පාවට හෝ අනාථාත්වයකට පත් නොවූහ. අටලෝ දහම්හි අකම්ප්‍ය ස්වභාවය තාදී ගුණයකි. එය රහතන් වහන්සේ කෙරෙහි ම පිහිටන උතුම් ගුණයකි. සඟරජ හිමි රහත් නොවූවත් පුහුදුන් කෙනෙකු වශයෙන් දියුණු කළ හැකි උසස් ම තත්ත්වයට උන්වහන්සේ මේ මහනීය ගුණය දියුණු කළ බව එතුමන් ගේ උදාර සිරිතෙන් හෙළි වේ.

## නිහතමානී බව

නිහතමානී බව සඟරජ මාහිමියන් ගේ ජීවිතය ඔපවත් කළ විශේෂ ගුණයකි. එදා උපසම්පදාවට පත්වන අවස්ථාවෙහි හැම දෙනාට ම ජ්‍යෙෂ්ඨයා වී උපසපන් බව ලැබීමට තිබුණු අවස්ථාවේ, ''මගෙනුත් වැඳුම් ගන්ට කෙනෙකු සිටියා වේ''

කියා පසුවී උපසම්පදාව ලබා ගැනීමත් තමන් වහන්සේ ලක්දිව සංඝරාජ පදවියට පත් කළ බව දැනගත් මොහොතෙහි ''**උඩඟු නොව මහණ**'' යන ආදර්ශ පාඨය උඩෙළිපතෙහි ලියා තැබීමත් තුළින් උන් වහන්සේ මේ උතුම් මිනිස් ගුණය කෙරෙහි දැක්වූ සැලකිල්ල තේරුම් ගත හැකි ය.

අර්හත්වය ප්‍රතිඥා කරන ක්ෂීණාශ්‍රවයන් වහන්සේ අහංකාර මමංකාර මානානුසය සමුද්ඝාතනය කළ බව ධර්මයෙහි දැක්වේ. මෙහි අහංකාර යනු මානයයි. මමංකාර යනු තෘෂ්ණාව යි. රහතුන් වහන්සේ අහංකාර මමංකාර මානානුසය නිරවශේෂයෙන් ක්ෂය කළ හෙයින් නිරහංකාර වන්නාහ. මානය පර්යුත්ථාන අවස්ථාවට නොපැමිණ සන්තානයෙහි ශයනය කරන අනුශය අවස්ථාවෙහි පවතී නම්, එබඳු සන්තානයක් ඇති කල්‍යාණ පෘථග්ජන පුද්ගලයා ද නිරහංකාරයකු සේ සැලකීම ධර්මානුකූල ය. සඟරජ මාහිමියෝ ද අහංකාරය අනුශය අවස්ථාවෙහිම පවත්වමින් හෝ නො එසේ නම් එය හිස් ධර්මතාවකැයි අවබෝධ කොට ගැනීමෙන් හෝ නිරහංකාර වන්නට ඇත. පල ගන්න පල ගන්න බිමට අවනත වන අත්තක් සේ මාහිමියෝ ද අහංකාරය අනුශය භූමියට අවනත කළහ. **වැලිවිට සඟරජ හිමියන්ගේ පරපුර*** මාතර ද ව්‍යාප්ත වී ඇත.

## අවසන් ගමන

ක්‍රි. වර්ෂ 1778 ඇසළ පුර පොහොය උදාවීමට තෙදිනකට පෙර සඟරජ මාහිමියෝ සිහිනයක් දුටහ.

| | |
|---|---|
| වාරේ වාරේ | වාරේ |
| ගණිත ගුදන් දකු | වාරේ |
| ගමනක් ඇත එම | වාරේ |
| යනවාමයි තිර | සාරේ |

කවුදෝ කෙනෙකුන් මේ කවිය කියනු සඟරජුට සිහිනයෙන් ඇසුණේලු. පසුදින උදය ම තල්පතෙහි එම කවිය සටහන් කර තැබූ උන්වහන්සේ එය කිත්සිරි රජුට පෙන්වා එහි අදහස පැහැදිලි කර දෙමින් මෙයින් තුන් දවසකට පසු ඇසළ පොහොය උදාවන බවත් එදිනට නොවරදවා ම යායුතු ගමනක් තිබෙන බවත් එය නම් පරලොව ගමන බවත් කීහ.

## අපවත්වීම

තුන් දිනකට පුස ඇසළ පොහෝ දිනය උදාවිය. එදින සවස හන්තානේ අරණ්‍ය සේනාසනයෙහි වස් විසීමට වඩිනු සඳහා සුදානම් වූ සඟරජ හිමියනට තරමක අපහසු ගතියක් දැනුණෙන් ලැගුම් ගෙට වැඩ යහනෙහි මදක් සැතපුණහ. සඟ රජ හිමියන්ගේ තත්ත්වය අසාධ්‍ය බව තේරුම් ගත් සඟිදර ගුණරත්න තෙරණුවෝ මා හිමියන්ට දහම් දෙසූහ. ඒ අවසරයෙහි පුරා සු සැට වසක් මුළුල්ලේ ලෝ සසුන් වැඩට කැපවී සිදු කළ උදාර සේවාව එතෙකින් නිමාවට පත් විය. වැලිවිට සිරි සරණංකර සංඝරාජයන් වහන්සේ අසූ වසක් සපුරා වැඩ සිට ක්‍රි. වර්ෂ 1778 ඇසළ මස පුර පසළොස්වක් ලත් ගුරු දින දිවංගත වී වදාළහ.

## සංඝරාජ චෛත්‍යය

අවමඟුල් වෙස් ගත් කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමන් ප්‍රධාන මැති ඇමතිවරු ද අස්ගිරි මල්වතු විහාර දෙකේ මහනාහිමිවරුන් ඇතුළු මහා සංඝයා ද සිය දහස් ගණන් ලක්වැසි බෞද්ධ මහජනයා ද සඟරජ මාහිමියන්ට අවසන් ගෞරව පුද කළහ. අම්පිටිය විහාරයෙහි තනවන ලද විසිතුරු චිතකයෙහි මාහිමියන් වහන්සේ ගේ ශ්‍රී දේහය රාජ්‍ය ගෞරව සහිත ව ආදාහනය කරනු ලැබී ය. ආදාහන උළෙල සියැසින් දුටු මුංකොටුවේ රාළ මෙසේ කියයි.

''පෙර කවදා වත් නොලත් පුදා සඟරජුට එදා වහලින් ලැබි ලා
රට මු එදා වැසි ජන සමු දා නුවරට එකදා එකතැන් කර ලා
කවනි විදා තිර ජවනි බැඳා නව මාල බෙදා ගිහි ගෙය කර ලා
පැළලි බැඳා තුළ ගෙමැදා දරසැය බැඳා ආදන ක ළා
(සඟරජවත)

සත් දිනකට පසු මාහිමියන්ගේ භස්මාවශේෂ තැන්පත් කොට කිත්සිරි රජතුමා සඟරජ හිමියන් සිහිවනු වස් අනුස්මරණස්ථම්භයක් ගොඩ නැංවී ය. එය ''**සංඝරාජ චෛත්‍යය**'' නමින් හැඳින්වේ.

## අපේ පරම යුතුකම

සොළොස් වැනි වියෙහිදී පැවිදි බව ලබා විසිවැනි වියෙහි දී ග්‍රන්ථ රචනා කොට පණස් පස් වැනි වියෙහි දී උපසම්පදාව ලබා අනතුරු ව ලක්දිව සංඝරාජ පදවියට පත්ව පුරා අසූවසක් වැඩ සිටි වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේ ගේ උදාර ජීවිතය බෝධිසත්ව පරමාර්ථයන් ගෙන් පරිපූර්ණ වූවකි.

මිහිඳු මාහිමියන් වහන්සේ ලංකා සම්බුද්ධ ශාසනයේත් ධර්ම ශාස්ත්‍රයන්ගේත් බෞද්ධ සංස්කෘතියේත් ආදී කර්තෘ වරයාණන් වන අතර, අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේ ලක්දිව නූතන ශාසන ප්‍රබෝධයේත් ධර්ම ශාස්ත්‍රොන්නතියේත් සංස්කෘතික පුනරුදයේත් ආදි කර්තෘවරයාණෝ ය.

එසේ හෙයින් මිහිඳු මහරහතන් වහන්සේ ගේ ශ්‍රී නාමයට අනතුරුව සරණංකර සංඝරාජයන් වහන්සේ ගේ ශ්‍රී නාමය අනුස්මරණ කිරීම උන්වහන්සේ ගේ උත්තරීතර සේවාවට ගෞරව දක්වන ලක්වැසි සියලු දෙනා ගේ ම පරම යුතුකම යි.

# පරිශිෂ්ටය (54 වන පිටුව හා බැඳේ)

## කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත

අප බුදුන් කල්ප ශත සහස්‍රාධික චතුරසංඛ්‍ය පරිමිත කාලයක් සමතිස් පැරුම් පුරා මාර සංග්‍රාම භූමි වූ මහාබෝධි පර්යංකාරූඪව දූර්වාර සපරිවාර මාර පරාජය කොට සර්වඥපදප්‍රාප්ත ව පන්සාළිස් හවුරුද්දක් චාතුර්ද්වීපික මහාමේඝයක් සෙයින් වැඩ සිට අනවරාග්‍ර සංසාර වෘත්තයෙහි ක්ලේශාග්නීන් දග්ධ වෙමින් සිටි සත්ත්වයන් ධර්මාමෘත වර්ෂායෙන් නිවමින් සකල බුද්ධ කෘත්‍යය නිමවා කුසිනාරා නුවර අබියෙස්හි මල්ල රාජයන් ගේ සාල වනෝද්‍යානයෙහි නිරුපධිශේෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවි සාරසිය සූපනස් හවුරුද්දක් ගිය කල,

වළගම් අබා මහරජහු දවස පටන් එක්වා දහස් දෙසිය සූපනස් හවුරුද්දක් භින්න නිකායව ශාසනය පිරිහෙමින් සිටි කල්හි මහා සම්මතාදී පරම්පරානුයාත සූර්‍ය වංශෝද්භූත රාජාධිරාජ නෛකදික්හි ව්‍යාප්ත යශෝමරීචීන් විරාජමාන ශ්‍රී සංඝබෝධි ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන් සකල ලංකා තෙලෙහි එකරාජ්‍යාභිෂෙකයෙන් අභිෂික්ත ව විජෘම්භිත පුණ්‍යර්ධි ඇතිව රාජ්‍ය සුඛානුභව කොට වසනුවන් අඥාන දූර්ඥාන මූලක අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විෂවේග විහත ව අපාය ව්‍යසනාපන්නවන ශාසනාවචර කුල පුත්‍රයන් දැක සුපරිශුද්ධ බුද්ධ ශාසනයෙහි මා වැනි ආඥාචක්‍රවර්තියක්හු මෙවැනි කිලුටක් දැක දැක උදාසීන වුවහොත් බුදු සසුන නස්සි බොහෝ සත්හුද අපාය භාග් වෙති. පස්වාදහසක් පවත්නා බුදු සස්නට මා වහල් වුව මැනවැයි ප්‍රඥාපුරස්සර කරුණායෙන් සංචෝදිත හෘදය ඇතිව මෙසේ තම සසුන් කවුරුන් වහල් කොට වවා පස්වා දහස පවත්නා පරිද්දෙන් කෙරෙම්දෝ හෝයි සිතා,

අඛණ්ඩාච්ඡිද්‍රතාදි විවිධ ගුණගණාංග සංගත කොට රක්ෂිත වර්ධිත පෝෂිත ශීලස්කන්ධාදී ලෞකික ගුණරත්නාලංකාරයෙන් සමලංකෘත වූ උදුම්බරගිරි නිවාසි මහාකාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ මහා විහාරාධිවාසී මහා භික්ෂු සංඝයා දැක ඔවුන් වහල් කොට බුදුන් විසින් අනුඥාත මොග්ගලීපුත්ත තිස්ස මහතෙරුන් වහල් කොට අනේක සහස්‍ර පාප භික්ෂූන් නිර්මථනය කොට දුර්ලබ්ධි මැඩ ශාසන මල විසෝධා තෘතිය ධර්‍ම සංගායනා කැරැ වූ ධර්‍මාශෝක මහරජහු මෙන් අනේක ශත පාප භික්ෂූන් ශාස්තෘ ශාසනයෙන් අපගත කොට ෂඩභිඥාද්‍යනෙක ගුණගණෝපේත මහාක්ෂීණාශ්‍රවයන් ඇති කල්හි දූ පවා පූර්‍වරාජයන් විසින් මහෝත්සාහයෙන් සමඟ කොට ෂඩභිඥාද්‍යනෙක ගුණගණෝපේත මහාක්ෂීණාශ්‍රවයන් ඇති කල්හි දූ පවා පූර්‍වරාජයන් විසින් මහෝත්සාහයෙන් සමඟකොට ගත නුහුණු තුන් නකා සමග කිරීමෙන් එක් නකා කොට ජේතවන මහාවිහාරාදී නො එක් මඟ ඇඟි විහාර ලක්දිව තන්හි තන්හි කරවා එහි අනේක සහස්‍ර සංඛ්‍යාත මහා සංඝයා වාස කරවා නිරන්තර ප්‍රවෘත්ත ධර්‍මාමිෂදානයෙන් උපස්ථාන කෙරෙමින් සංඝ දර්ශන ප්‍රභව ප්‍රීතිප්‍රමොද්‍ය රසාස්වාදයෙහි ලොල්ව කාලානුකාලයෙහි පෞෂථාංගශීල සමුපේතව විහාරයට එළඹ සංඝමධ්‍යගතව තත් දර්ශන ප්‍රසූත ප්‍රීතිප්‍රාමොද්‍ය රසාස්වාද කොට මා විසින් මහෝත්සාහයෙන් සාධිත වූ සංඝ සාමග්‍රිය පස්වා දහසක් අභින්නව පවත්නා පරිද්දෙන් මතු වන සංඝයා ද අප්‍රමාදව ග්‍රන්ථ විදර්ශනා ධූරයෙහි යෙදී අල්පේච්ඡතාදි ගුණෙන් යුක්තව වසනා පරිද්දෙන් අවවාද අනුශාසනා කොට ශාසනය රක්‍ෂා කළ මැනැවැයි යුක්ත ව්‍යක්ත ගුණෝපේතව කරන ලද ආරාධනා අසා මහා කාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ ස්ථවිරයන් විසින් ප්‍රමාද විහාරීන් අවකාශ නො ලබනු සඳහා ධර්‍මවිනය සංසන්දනය කොට ඈජරොල් නො විහිද කළ කතිකාවත,

එම මහරජාණන් ස්වර්ගස්ථ සංවත්සරයෙහි පටන් සතිස් හවුරුද්දක් ඇතුළත ඔවුන් වැනි ශ්‍රද්ධා බුද්ධි සම්පන්න මධ්‍යස්ථ ශාසන පක්ෂපාත අන්කිසි රජක්හුගේ නො පැළඹීමෙන් යට වූ දවසට වඩා පැනුණු පූර්වෝක්ත අඥාන දුර්ඥාන මූලක අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විෂවේගාතිශයෙන් වඩා විහත ව අපාය ව්‍යසනාපන්න වන ශාසනාවචර කුලපුත්‍රයන් ගේ බාහුල්‍යය දක ඔවුන්ට විය යුතු වැඩ තකා තත්කාලානුකූල අමුතු කතිකාවතින් සරහා ලෝක ශාසන විලෝපකාරී වූ දමිළ සේනාවෙහි භයින් පුල්සතිපුරාදී පුරාතන ස්ථානයෙන් ඉගිල බොහෝ සේ පත් පොත් ආදි පිරිකර තුබූ තුබූ තැන හැර ශරණාන්වේශිව මායා රජයට පැමිණි මහාසංඝයා වහන්සේට විචාරාදි චතුර්විධ ප්‍රත්‍යය ප්‍රදානයෙන් හා පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති දෙක්හි යෙදීමට උපනිශ්‍රය වීමෙන් හා සංඝයා වහන්සේ කෙරෙහි උපන් නොයෙක් විවාද මහෝත්සායයෙන් සන්සිඳවීමෙන් හා ශත්‍රුමධ්‍යගත දළදා පාත්‍රා ධාතූන් වහන්සේ මහත් උපාය උත්සාහ ශක්තීන් ගෙනහැර නානා චිත්‍රයෙන් විචිත්‍ර කොට කරවන ලද ත්‍රෛභූමක දංෂ්ට්‍රාධාතු මන්දිරයෙහි වඩා හිඳුවා නිරන්තර කරන පූජාසත්කාරයෙන් හා ආඪ්‍ය දරිද්‍ර අනේක ශත ප්‍රමාණ කුලයන් සුදුසු පරිද්දෙන් රැකීමෙන් හා ලෝක ශාසනයට මහෝපකාරී වූ විජයබාහු වත් හිමියන් විසින් තන්හි තන්හි කරවන ලද විහාරයන් අතුරෙහි විජයසුන්දරාරාම විහාරයෙහි වැඩ හිඳ ශාස්තෘශාසනාභ්‍යුදයකාරී ශාරීපුත්‍ර මහා ස්වාමි ශිෂ්‍ය තත්කාල ශාසනානුශාසක සංඝරක්ෂිත මහා ස්වාමි මේධංකර මහා ස්ථවිර ප්‍රමුඛ ග්‍රාමවාසී වූ ද උදුම්බරගිරි නිවාසි මේධංකර මහා ස්ථවිර ප්‍රමුඛ වනවාසී වූ ද මහා සංඝයා විසින් ධර්ම විනය සංසන්දනය කොට ඇජරොල් නො විහිද කළ කතිකාවත.

බොහෝ සේ සංඝයා වහන්සේ පවතිමින් සිටි කල්හි එම විජයබාහු වත් හිමියන්ගේ අතිජාත පුත්‍රයා වූ ශත්‍රුපඞ්ක සවිශේෂ විශෝෂණයට ශරත් මාර්ත්තණ්ඩ මණ්ඩල වූ ජිනසාසන

සමුල්ලාසයට පූර්ණ චන්ද්‍රානුකාරිත්වයෙහි සාතිශය සාමර්ථ්‍යය ඇති පරාක්‍රමබාහු මහරජාණෝ තමන්ගේ පුණ්‍යර්ධිප්‍රභාවයෙන් නොයෙක් ද්‍රවිඩ කේරළ යාචකාදී වියවුල් සන්සිඳුවා සකල ලඞ්කාතලය හස්තගත කොට රාජ්‍ය ශ්‍රී අනුභව කරමින් ශ්‍රී වර්ධන පුරාදී නා නා ස්ථානයෙහි ප්‍රතිමාගෘහ ප්‍රාසාද චංක්‍රමණ ප්‍රාකාර ගොපුරාදීන් සමෘද්ධ වූ සංඝාරාම කැරවීමෙන් හා බොහෝ සංඝයා වහන්සේට චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය ප්‍රදානයෙන් හා විසිතුරු කොට කරවන ලද රජතමය චෛත්‍යාභ්‍යන්තරයෙහි නානාරත්න විභූෂිත ස්වර්ණ කරණ්ඩයෙහි දළදා පාත්‍රා ධාතූන් වහන්සේ වඩා සතතයෙන් කරන ලද පුෂ්පධූපාදී පූජායෙන් හා තමන්ට ද බොහෝ ගෘහස්ථ ප්‍රව්‍රජිතයන්ට ද අපරිමිත පුණ්‍යරාශීවර්ධනය කෙරෙමින් වසනුවෝ ඒ ඒ තැන ප්‍රමාද ව වසන ශාසනාවචර බොහෝ පුද්ගලයන්ගේ ශාසන පරිහානිකර වූ ප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති බාහුල්‍යය දැන වත් හිමියන් වහන්සේ විසින් මහෝත්සාහයෙන් සෙමෙහි තබා ලූ ශාසනය මා දවස මෙලෙස වීම අනුචිත නොවේ දැයි සිතා ග්‍රාමාරණ්‍යවාසී කාරක සංඝයා වහන්සේ රැස් කරවා සංඝමධ්‍යගතව කල්‍යාණාධ්‍යාශයෙන් යෙදී ශාසනාභිවෘද්ධිය පිණිස ආරාධනා කොළෙෝ ය.

ඒ අසා ශාසනෝපස්තම්භකාරී අර්ථානුගත වනරතනාභිධාන බුද්ධවංශ මහාස්ථවිරපාදයන් වහන්සේ ගේ ප්‍රධාන ශිෂ්‍ය තත්කාල ශාසනානුශාසක ආරණ්‍යක මේධඞ්කර මහාස්වාමි ප්‍රමුඛ ග්‍රාමාරණ්‍යවාසි කාරක මහාසංඝයා වහන්සේ විසින් පූර්ව කතිකාවත් බහා අමුතු කළ කතිකාවත සංඝයා වහන්සේ පවතිමින් සිටි කල්හි.

එයින් මෑත භාගයෙහි කෝට්ටේ නුවර ශ්‍රී පරාක්‍රමබාහු මහරජ දවස ශාසනය අභිවෘද්ධියට පමුණුවා නොයෙක් පරිද්දෙන් ශාසනොපකාරිය පැවැත්වූ පසු දැන් මෙකල් දක්වා

මෙදතුර ඔවුන් වැනි ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ශාසන පක්‍ෂපාත අන්කිසි රජක්හු ගේ නො පැළඹීමෙන් ක්‍රම ක්‍රමයෙන් පිරිහී ගොස් සියලු ලක්දිව එක භික්ෂුවකුත් නැතිව සාමණේර ගණනක් අවශේෂව එයිනුදු සමහර ලජ්ජිපේශල ශික්‍ෂාකාමී තැන් හැර සෙසු බොහෝ දෙන නක්‍ෂත්‍ර වෛද්‍යකර්‍මය යක්ෂප්‍රලය ආදී වූ බුදුන් විසින් එපා කර වදාළ නින්දිත ශාස්ත්‍ර ඉගැන්වීමෙන් රාජ රාජ මහාමාත්‍ය සේවනයෙන් ග්‍රාමක්‍ෂෙත්‍රාදි තනතුරු ලබා ගැන්මෙන් ගොවිතැන් වෙළෙඳාම් ආදී වූ නොයෙක් අකර්තව්‍යයෙහි යෙදී ඥාතිකුල සංසට්ඨ පුත්‍රදාර පෝෂණශීලි ව ශාසන පිළිවෙත් පිරිහී ගොස් විනාශමුඛ ප්‍රාප්තව සිටි කල්හි.

අන්ධකාර සමයෙහි පැන නැඟි තෙජොකදම්බයක් මෙන් ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදාස් දෙසිය අනූවන වර්ෂයෙහි ලංකා රාජ්‍යශ්‍රීයට පැමිණ වදාළා වූ ප්‍රවර සූර්යවංශ උදයාවලෝදිත සූර්‍ය්‍ය මණ්ඩලායමාන වූ ශ්‍රීමත් කීර්ති ශ්‍රී රාජසිංහාභිධාන අප මහරජාණන් පූර්‍වොපචිත කුශලානුභාවයෙන් ඒකච්ඡත්‍ර නංවා අසදෘශාඥාතෙජො බල පරාක්‍රම සමන්විතව සෙංඛණ්ඩශෛලාභිධාන ශ්‍රී වර්ධන පුර ප්‍රවරයෙහි වසමින් ජිනවර ශ්‍රී දන්තධාතුන් වහන්සේ උදෙසා සුරෙන්ද්‍ර කිරීට ප්‍රතිභාග මුක්තාමාණික්‍යාදී නෛකරත්න කර්මාන්තොජ්වලිත මාහැඟි රුවන් කරඬු රත්නාභරණ ග්‍රාමක්ෂේත්‍ර හස්ත්‍යශ්වාදී අවිඥානක සවිඥානක වස්තු පරිත්‍යාගයෙන් මහත් උදාරතර පූජෝත්සව පැවැත්වීමෙන් හා මහ්‍යංගණ සමන්තකූට පර්‍වත අනුරාධපුරාදි නොයෙක් සිද්ධස්ථානවල පූජා සත්කාර පැවැත්වීමෙන් ද සද්ධර්‍ම ශ්‍රවණ ලේඛාපන ධාරණාදීවු අනේකප්‍රකාර ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රදායක අපරිමිත කුශලරාශී වර්ධනයෙහි යෙදී වදාරා වසනුවන් පූර්‍වොක්ත ක්‍රමයෙන් ශාසනාධාර උපසම්පදා සංඝයා වහන්සේ නැති හෙයින් බුද්ධ ශාසනයාගේ නො පැවැත්ම හේතු කොටගෙන අපායභාගී වන ලංකාද්වීපවාසි අශේෂ ජනතාව කෙරෙහි පැවති මහත් කරුණාද්ධ්‍යාශයක් ඇති ව ලංකාධිපති

පූර්ව නරවීරයන් විසින් මහෝත්සාහයෙන් පවත්වා ගෙන ආ සර්වඥ ශාසනය මා දවසත් එසේ ම වර්ධනය කොට පැවැත්විය යුතු ය යන ශ්‍රද්ධාපූර්වංගම මහත් රාජාභිමාන උපදවා පස්වා දහසක් පවත්නා විශුද්ධ බුද්ධ ශාසනයට සහාය ව පවත්වා ලම් යන ප්‍රඥා පුරස්සර උදාරධ්‍යාශයෙන් යෙදී වදාරා ශාසනාභිවෘද්ධියට පටන් ගෙන,

මහාවංශයෙහි වූ එක් සිය එක්වන ශාසනාභිවෘද්ධි පරිච්ඡේදයෙහි කී ක්‍රමයෙන් නොයෙක් දහස් ගණන් කුල දරුවන් මහණ මහලු පැවිදි කරවා ලක්දිව නා නා ස්ථානවල ගංගාරාම විහාරාදි නොයෙක් විසිතුරු විහාර සංඝාරාම ඇති කොට එහි වසන මහා සංඝයා වහන්සේට මහවතුරක් සේ පවත්වන ලද චීවර ප්‍රත්‍ය දානයෙන් සංග්‍රහ කිරීම් ආදි වශයෙන් අප්‍රමාණ කුශලරාශී වර්ධනයෙන් යෙදී වසමින් මෙසේ මා දවස මහෝත්සාහයෙන් දුකසේ මා විසින් ඇතිකරගත් භික්ෂූන් වහන්සේ අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති දුරුව මනා ප්‍රතිපත්තියෙහි පිහිටා ශාසනය නිර්මලව පැවැත්වීම විනය පයර්‍යාප්තිය මුල් ව ම වන හෙයින් හැම දෙනා වහන්සේම සමගි ව විනය පෙළ අටුවා සහිත ව බලා සාකච්ඡා කිරීමෙන් පූර්ව කතිකාවතුන් බලාගෙන මෑත භාගයෙහි වරදවා ගෙන පැවත ආ නුසුදුසු කාරණවලින් දුරුවන සැටිත් එහි ම ඇතුළත් කොට ලියාගෙන ඒ කතිකාවත වූ ලෙස මනා පිළිවෙත්හි යෙදී ශාසනය නිර්මල ව ම පැවැත්විය යුතු ය. යනාදී බොහෝ අවවාද වදාරා හැම සංඝයා වහන්සේ ම ග්‍රන්ථ විදර්ශනා ධුරයෙහි යෙදී අල්පේඡතාදී ගුණ සම්පන්නව ශාසනය රක්ෂා කළ මැනවැයි යුක්ත ව්‍යක්ත ගුණෝපේත ව සංඝ මධ්‍යගත ව කරන ආරාධනාව අසා ප්‍රමාද විහාරීන්ට අවකාශ නො දෙන පිණිස තත්කාල ශාසනා ශාසක සංඝරාජ ධුරන්ධර සරණංකරාභිධාන මහා ස්ථවිර ප්‍රමුඛ ග්‍රාමාරණ්‍යවාසී කාරක මහාසංඝයා වහන්සේ විසින් පවත්නා ලෙස නියම වූ කතිකාවත මෙසේ දත යුතුය.

පබ්බාජෙන්තා සෝධෙත්වා පබ්බාජේථ සෝධෙත්වා උපසම්පාදේථ..........අරියෝ වා තුණ්හී භාවෝ යි වදාළ බැවින් ධම්කථා මනස්කාර දෙකින් පිටත් තිරශ්චීන කථා හා කාමවිතර්කාදී පාප විතර්කයෙහි නො යෙදී පෙරයම ද බණ කියන කියවන අසන ධම් කථා කිරීම් ඈ නො සිස් පියොවින් හා විදර්ශනාධුරයෙන් ගෙවා මැදියම සැපත් සඳ චතුසම්පජඤ්ඤයෙන් යුත් නිඳි සෙවිය යුතු.

පැවිදි තැන් විසින් දෙමව්පියන්ට උපකාර කිරීම අනුදත් බැවින් පතා හිටිත් නම් තමා නිසා ලද කැප ප්‍රත්‍යයෙන් සංග්‍රහ කිරීමත් සෙසු නෑයන්ට අනුදත් ලෙස විනයානුකූල ව ඖෂධයෙන් පමණක් කරන සංග්‍රහයක් හැර සෙසු රන් රිදී තඹ මිල වළලු මුදු ආදී පළඳනා ද ගම් බිම් කෙත් වත් ගව මහිෂ දාසි දාස ධාන්‍ය ජාතීන් හා කැති උදලු නෑ පොරො තඹ ලොහො පිත්තල භාජන ද ඇඳ පුටු කලාල් පැදුරු කොට්ට කුලිච්චම් පිළිපත් ආදී කැප අකැප දෙයින් නෑ නො නෑයන් දහම් වරදවා සංග්‍රහ කිරීමෙන් සද්ධාදෙය්‍ය විනිපාත නො කටයුතු.

පැවිදි තැන් අයිති පොත් පත් සිවුරු පිරිකර ආදී වූ දෙය ඒ ඒ ආරාමවල තබා ශිෂ්‍ය පරම්පරාවට අයිතිවීමෙන් ඉදිරි ශාසනයට ම උපකාර වන ලෙස කිරීම් මිස උවදුරක් නැති ව නෑ නො නෑ කෙනෙකුන් ගේ ගම්වල තබා ඔවුනුත් ඒ ප්‍රත්‍යයන් නො නැසිය යුතු.

පැවිදි තැන් අයති පොත් පත් සිවුරු පිරිකර ආදී සියල්ල ගිහි වීමෙන් ද කාලක්‍රියා කිරීමෙන් ද සංඝ සන්තක වන බැවින් සිවුරු හැර ගිහි භාවයට පැමිණෙන තැන් විසින් පැවිදි ව සිට ලත් දෙයින් කිසිවක් ගෙන නො යායුතු.

භික්ෂූන් විසින් කැප ඇකැප වස්තු දී ගම් කුඹුරු මිළයට උගහට ගැනීම ද ඇමැති ආදීන්ට කියා අමුතු ගම් කුඹුරු ඉල්වා ගැනීම ද ප්‍රත්‍යය පිණිස වැව් අමුණු බැඳ ඇල වේලි නඟා කුඹුරු අස්වැද්දීම ද සී සැවීම් වැපිරීම් ආදිය ද නො කටයුතු.

ඒ ඒ විහාරවලට නියත වූ විහාර ලාභ ගම් ඒ ඒ විහාරවල කටයුතු පිරිමසා එහි ම හිඳ ප්‍රයෝජන විඳීම මිස අමුතු තැනකට ගෙන්වා ගෙන නො ගත යුතු.

සිවුපසය පිණිස මෙගම දෙමි කියා දුන් ගම් බිම් ද ඵල ප්‍රයෝජනය පිණිස මෙ වතු පිටි ඵල රුක් දෙමි කියා දුන් වතු පිටි ඵල රුක් ද පස්ගෝරස පිණිස මෙගව මහිෂයන් දෙමි කියා දුන් ගව මහිෂයන් ද කැප බස් කියා දුන් බැවින් භික්ෂූන් විසින් ප්‍රයෝජන වින්ද යුතු.

දායකයන් විසින් කැප බසින් නො කියා නුඹ වහන්සේට මෙගම දෙමි මෙ වතුපිටි දෙමි මෙගව මහිෂයන් දෙමි කියා අකැප ලෙසින් දුන් ගම්බිම් ආදිය ප්‍රයෝජනය විඳීම හැම සංඝයාටම අකැප හෙයින් නො වළඳා හැරිය යුතු.

රාජ රාජ මහාමාත්‍යාදි උපාසක කෙනෙකුන් විසින් භික්ෂූන් වහන්සේට මෙ රන් රිදී තඹ මිළයෙන් කැප දෙයක් ගෙන දෙවයි කියා ආරාමිකයකු අතට හෝ උපාසකයකු අතට හෝ දී නැවත භික්ෂූන් වහන්සේ කරා එළැඹ අසවල් කැපකරුවා මෙපමණ මිළයක් අප විසින් දීලා ඇත. නුඹ වහන්සේට කැප දෙයක් ඕනට දූන් වූ විට ගෙන දෙන්නේ ය. ඕනට දූන්වුව මැනව යි කී කල එලෙසින් දන්වා ඔහුගෙන් දුන් කැප දෙයක් ප්‍රයෝජන විඳිනවා මිස කොයි ලෙසිනුත් රන් රිදී නො පිළිගත යුතු. සියලු ම සාමණේර උපසම්පදා තැන් විසින් තම තමන්ට

පින් පිණිස ධර්මය ලියනවා මිස බර පැන් පිණිස කොයි යම් නමක් වත් පොත් පත් නො ලිය යුතු.

ලියන්ට ම නිසි කරුණක් පැමිණියේ වී නම්, සංඝ සම්මුතියෙන් ශාසනයට වන ප්‍රයෝජනයක් සලකා ආරාධනාවෙන් වී නමුත් පොත් ලිය යුතු.

පොහොයෙන් පොහොයේ හැම දෙනාම කතිකාවත කිය විය යුතු.

මේ කතිකාවත යම් කෙනෙක් දැන දැන නොපවතිත් නම්, ගණ දෙටු තැන් විසින් ආපත්තිකර දෙයට ආපත්ති දෙස්වා දඬුවම් කර සෙසු ආචාර විපත්තියට දඬුවම් කරවා නැවැත එලෙස නො කරන ලෙසට තරයේ අවවාද කොට සබ්‍රම්සරුන් විසින් නිවන් අවසන් කොට ඇති උභය ලෝකාර්ථ සිද්ධිය වන ලෙසට කටයුතු.

## වැලිවිට සරණංකර සඟ රජ සමරු ගීය

සාසන කෙත් රැකැ දුන් ගොවිඳුන්
සාහිත සත් සිඳු පැ දිනිඳුන්
වැලිවිට සරණංකර සඟ රජිඳුන්
සමරිමු සිරි නාමේ
පුද දෙමු හැම දා මේ

ඔබ නූණා නම් එ දවසැ හෙළයේ
දහමත් සසුනත් යනු ඇති කැලයේ
පන්දහසක් පවතීවයි බලයේ
දුන් අත සමරිමු බැතියෙන් මෙ-ළයේ
සමරිමු සිරි නාමේ //

නිවෙමින් ගිය හෙළ සාහිත පහනේ
ඔබ දුන් තෙල විය එළියට මේ-දිනේ
එළියෙන් එළියට යන මේ ගමනේ
එළි වෙයි ඔබ මෙහෙය ද හිමි සඳිනේ
සමරිමු සිරි නාමේ//

කන් දෙන් උල්පත මතු වී ආයේ
ලන් දෙන් තැන්නෙන් තර වී ආයේ
ගංගා පරපුර දිගට ගලා යේ
කොන් නො පෙනේ ඔබ සාසන මෙයේ
සමරිමු සිරි නාමේ//

ඔබ ගෙන් පිරිසුදු වුණු සඟ සසුනේ
සුබ වෙයි තතු දුටුවොත් දිව නෙතිනේ
හොබවතු වස් ලො-සසුන් ලෙස එ-දිනේ
ඔබ මිසැ සමතෙක් තව මෙහි නො පෙනේ

කලාසූරි අරිසෙන් අහුබුදු

කවර නිර්මාණය සහ සිතුවම් සුසිල් ජයශාන්ත පෙරේරා